# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් www.budusarana.lk email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ ඇසළ අමාවක පෝය දින රාජ්‍ය වර්ෂ 2020 ජූලි 20 සඳුදා BUDUSARANA, MONDAY JULY 20, 2020

55 වැනි කාණ්ඩය, 07 වැනි පත්‍රය, ආරම්භය 1965 - 06 - 13 , ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. පිටු 24 මිල රු. 40.00




# අල්ලා ගැනීමේ හා අත්හැරීමේ වෙනස

**ගිහිගෙය ගිනි ගෙයක් බව අප ප්‍රත්‍යක්ෂයෙන් දන්නා අතර, ඒ සඳහා නව විග්‍රහයක් අනවශ්‍ය ය. බන්ධන සූත්‍රයේ දී ගිහිගෙය සිරගෙයක් වශයෙන් බුදුන් වහන්සේ පෙන්වා දුන් සේක.**



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය
**මැදගොඩ අභයතිස්ස හිමි**

දිනක් බුදුන් වහන්සේ භික්ෂූන් වහන්සේලා සමඟ වැඩම කරද්දී දඬුකඳේ ගැසූ, පිටකර කොට අත් පා බැඳ තිබූ, ගස් බැඳි, කූඩුවල දැමූ, දම්වැලින් බඳින ලද ආදී වශයෙන් රාජ අණ පරිදි විවිධ දඬුවම් ලැබූ පිරිසක් දුටු සේක.

බුද්ධිමතුන් යකඩයෙන්, ලීයෙන්, වැල්වලින් කරන ලද බන්ධන බැමි ලෙස නොසලකති. ඉහත කී බැම්වලින් කුමන ආකාරයකින් හෝ නිදහස් වීමට අපට හැකියාව ලැබේ. එහෙත් යමෙක් කුණ්ඩලාභරණයන්ට, මැණික්වලට, දරුවන්ට, බිරින්දෑවරුන්ට ඇලෙන්නේ ද, ඒවා දැඩි බැමි ලෙස හැඳින්වේ.

බන්ධනාගාරයක විඳින දඬුවමට වඩා ගිහිගෙයි සම්පත් සඳහා ඇලීම වැඩි බන්ධනයක් බැව් බුදුන් වහන්සේ දේශනා කළ සේක. සාමාන්‍යයෙන් හිරේ විලංගුවේ වැටුණ පුද්ගලයා වසර 20 කින් හෝ ඊට අඩු කාලයකින් හෝ දඬුවම ලිහිල් වීමෙන් හෝ බන්ධනාගාරයෙන් නිදහස ලබයි. එහෙත් ගිහිගෙයි බන්ධන පහසුවෙන් අඩුවන හෝ ලිහිල්වන තත්ත්වයකින් නො පවතී. ගැමි සමාජය තුළ විවාහ වීම හිරයක් ගැනීම ලෙස හඳුන්වන්නේ ගිහිගෙය පිළිබඳ බුදුරදුන්ගේ පැහැදිලි කිරීම අනුව විය හැකි ය.

අටුවාවේ මෙවන් පැහැදිලි කිරීමක් දක්නට ලැබේ. "බත් හැන්දක් යමෙක් ට දීම සමහරුන්ට අපහසු කාරණයකි". "හතර රියන් රෙදි කැබැල්ලක් යමෙකුට දීමත් අපහසු කරුණක් බවත් අටුවාවේ දැක්වේ.

මෙනයින් ඉතා සුළු දෙයක් වුව ද අත්හැරීම ගිහිගෙය තුළ අපහසු කාර්යයකි. ගිහියන් පමණක් නොව පැවිද්දන් ද සමහර අවස්ථාවල දී අත්හැරීමට අපහසු අන්දමින් ක්‍රියා කරනු දක්නට ලැබේ.

දන් දීමෙන් වැඩි ප්‍රයෝජන අත්වන්නේ දෙන්නාට ද, ලබන්නාට ද යන්න ඉතා හොඳින් තේරුම් ගන්නා පුද්ගලයා දීම පුරුදු කරයි. දීමෙහි වැඩි ප්‍රයෝජන අත්වන්නේ ලබන්නාට නොව දෙන්නාට ය. යමක් ලබන්නා ඉතා තාවකාලික වින්දනයක් ලැබුවත් දෙන තැනැත්තා දිගු කාලීන ප්‍රතිඵල අත්කර ගනී. සමහරුන්ට ඔවුන් ලැබූ දෙය වදයක් බවට පත්වන අවස්ථා ද ඇත. එක්තරා බෞද්ධ සෙන් කතාවකට අනුව මහා ධනපතියෙක් විශාල මුදලක් රැගෙන ගොස් මේසයක් මත තබා මෙහි කෝටියක් මුදල් ඇතැයි එක් භික්ෂුවකට පැවසුවේ ය. හා හොඳයි යනුවෙන් පිළිතුරු දුන් හිමිනම එහි පැමිණ සිටි දායක පිරිසක් හා පිළිසඳරෙහි යෙදුණේ ය. තමන් පැවසූ දෙය හාමුදුරුවන්ට නො ඇසුණේ යැයි අදහස් කළ ධනපතියා යළි උන්වහන්සේ අමතා මෙතැන කෝටියක මුදලක් ඇතැයි පැවසූහ. එවිට ද හාමුදුරුවෝ 'හා හොඳයි' යන පිළිතුරම ලබා දුන්හ. ඉන් තරමක් ආවේගයට පත් ධනපතියා "හාමුදුරුවනේ, මම ඔබ වහන්සේට කෝටියක මුදලක් ගෙනවිත් දුන්නත් ඔබ වහන්සේ එයට ස්තුතියි යන වචනයක්වත් ප්‍රකාශ නොකළහ."

යැයි කලබලයෙන් කීවේ ය. "මහත්මයාණෙනි' ස්තුති කළ යුත්තේ මම ඔබට ද, ඔබ මටදැයි" හාමුදුරුවෝ විමසා සිටියහ.

"තව ද ඔබ මේ සා මුදලක් මට භාරදී, මහා බරකින් නිදහස් වී මා වෙත මහා බරක් පටවා ඇත. මහා බරක් පැවරුණ මා ඔබට ස්තුති කිරීම අනවශ්‍යය." යනුවෙන් හාමුදුරුවෝ පැවසූහ. මෙම කතාවෙන් පිළිබිඹු වන්නේ අල්ලා ගැනීමේ හා අත්හැරීමේ වෙනස යි.

> 'මද්දක් අටවා මුවෙක් හසුකර ගැනීමට මාන බැලූ වැද්දා හඬමින් සිටිය දී මුවා තණ අනුභව කොට ක්ෂේම භූමිය වෙත ගියේ ය. මුවා මෙන් ක්‍රියා කිරීම සැබෑ විමුක්තිකාමීන්ගේ ලක්ෂණයක් වේ.'

ගිහි ජීවිතය තුළ සැප සම්පත් ගිහියාට සතුටක් වුවත් ගිහිගෙය හැර පැවිදි වූවෙකුට අත්හරින දේ අල්ලාගන්නා දෙයට වඩා සතුටක් ගෙනදෙනු ඇත. ගිහිගෙය හිරගෙයක් ලෙස ධර්මය තුළ හුවා දැක්වීමට හේතුවන්නේ මෙම කාරණයයි.

පැවිද්දන්ට කෙලෙස් අත්හැරීම අපහසු දෙයකි. අපගේ ජීවිතයේ දී අප සතු බාහිර දෙය අත්හැරීම සැබෑ අත්හැරීම නොවේ. බුදු දහමට අනුව අප අත්හැරිය යුත්තේ ක්ලේශයන් ය.

ආර්ය පර්යේෂණ සූත්‍රයේ දැක්වෙන පරිදි එක් වැද්දෙක් මුවන් ඇල්ලීම සඳහා මද්දක් අටවා බලා සිටින මුත් උගුල දුටු මුවා උගුලට හසු නොවී උගුල මත නිදාගෙන සිටීමට සමත් විය. මද්ද මත සිට පැන ගිය මුවා මෙන් සැප සම්පත් නැමැති උගුලේ පැටලී ක්‍රියා නො කිරීමට අප උත්සාහ කළ යුතු වේ. මෙම කාරණය ථේර ගාථාවන්හි මෙසේ ප්‍රකාශ වේ.

මද්දක් අටවා මුවෙක් හසුකර ගැනීමට මාන බැලූ වැද්දා හඬමින් සිටිය දී මුවා තණ අනුභව කොට ක්ෂේම භූමිය වෙත ගියේ ය.

මුවා මෙන් ක්‍රියා කිරීම සැබෑ විමුක්තිකාමීන්ගේ ලක්ෂණයක් වේ.

පැවිද්දන්ටත්, ගිහියන්ටත් මූලික අවශ්‍යතා හතරක් වේ. එනම්,

පැවිද්දට, චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන පච්චය හා ගිහියාට ඇඳුම්, ආහාර, නිවාස, බෙහෙත් යනුවෙනි.


මෙම සිව් වැදෑරුම් මූලික අවශ්‍යතා ගිහි පැවිදි දෙපිරිසට ම සමාන වුවත් ගිහියන් හා පැවිද්දන් ඒවා භාවිත කරන ආකාරය වෙනස් ය.

ගිහියන් ආහාර ගන්නා කල්හි එක් එක් ආහාර වර්ග මේ මේ රෝගයට, මේ මේ විලාසිතාවට හොඳ යැයි තෝරා බේරා ගැනීමක් කරන මුත් එම ආහාරය ම පැවිද්ද වළඳන කල්හි පිළිපැදිය යුතු උපදෙස් මාලාවක් බුදුන් වහන්සේ පෙන්වා දුන් සේක.

මෙම ලිපියේ ඉතිරි කොටස තිකිණි පුර අටවක පෝද (27) පළවේ.



# පෙර කර්ම පල දීම



ඇසළ අමාවක පෝදා

## දම් දෙසුම



**අචිරං වතයං කායො**
**පඨවිං අධිසෙස්සති**
**ඡුද්ධො අපේත විඤ්ඤාණො**
**නිරත්ථං ච කලිංගණං**

**ඉවත දැමූ වැඩකට නැති දර කැබැල්ලක් මෙන් මේ කය ද පහවූ සිත් ඇතිව නොබෝ කලකින් පොළොව මත වැතිරෙන්නේය**
**කයෙන් සිත පහවූ විට සිරුර දරකඩක් බව පෙන්වීමට පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ මුල්කරගෙන ඉහත ගාථාව සැවැත් නුවර දෙව්රම් වෙහෙරේ දී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක.**

සැවැත් නුවර තිස්ස නම් තෙර නමකගේ මුළු සිරුර පුරාම අබ ඇට, පමණ බිබිලි හටගෙන ඉමහත් සේ රෝගාතුර විය. පසුව එම බිබිලි වර්ධනය වී මුං, කඩල, ඩෙබර, නෙල්ලි, බෙලි පමණ වී ගෙඩි සිදුරු වී වණ වී පැලී ගොස් සැරව හා ලෙයින් සිරුර වේයන් කෑ පරඬැල් පතක් බඳුවිය. එබැවින් උන් වහන්සේට පූතිගත (ගතෙහි ගෙඩි) යන නාමය එකතු විය. පූතිගත තිස්ස" පූතිගත්ත තිස්ස" යන ව්‍යවහාර නම එකතු වූයේ එතැන් සිට ය. මෙම සිද්ධිය පෙර කර්ම පලදීමකි. අකුසල විපාක දීමකි.

තිස්ස තෙරණුවෝ කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දවස දක්ෂ කුරුලු වැද්දෙකි. දිනපතාම රැකියාව වශයෙන් කලේ බොහෝ කුරුල්ලන් අල්ලාගෙන මරා මස් විකිණීමයි. පවුලේ ආහාරයට ද ගනියි. ඉතිරි පක්ෂීන්ට පියාඹා නොයන ලෙස පියාපත් උගුල්වා, අඩු ඇට කඩා දෙඇස් අඳ කර තබා පසුදට විකුණයි. මේ අයුරින් දිවි ගෙවන ඔහුගේ නිවසට පිඬු පිණිස ගෙපිළිවෙලින් වැඩි රහතන් වහන්සේ නමක් දැක පැහැදී සතුටු වී සැදැහෙන් දන් පූජා කර මම බොහෝ ප්‍රාණඝාත පව්කම් කෙළෙමි. මට මෙබඳු වූ පිනක් කුසලයක් සිදුකර ගැනීමට ලැබීම මහත් වාසනාවකි. මෙම පුණ්‍ය කර්මයෙන් ඔබ ලත් උතුම් දහම ම මටත් මුදුන් පැමිණේවාය පැතුවේ යි. එම පව්කම්වල

මහා විපාක හා සුළු පින්කමේ ආනිශංසය යහපත් ප්‍රතිඵල මේ ආත්මභවයේ දීම මේ ලෙස ලැබුණේ ය.

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ අලුයම ලෝවැසියන් දෙස බැලීමේ දී උන්වහන්සේගේ මහා කරුණාවට මෙම භික්ෂුව දක්නට ලැබිණ. ආනන්ද හිමියන් සමඟ බුදුරජාණන් වහන්සේ ගිලානෝපස්ථානය සඳහා වැඩම කළහ. ඉන් අනතුරුව සිවුරු, අඳන, ඇඳ ඇතිරිලි සෝදා වේලා පිරිසුදු කරණ නැවත සිවුරු පොරවා සැතපීමට, අවස්ථාව ලබා දුනි.

ශරීරයට කයට ලැබුණ සුවතාවය නිසා සසර පුරුදු ඉස්මතු වී කමටහන් මෙනෙහි, කර භාවනා වඩා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්ම අවබෝධයෙන් පූතිගත්ත තිස්ස හිමියෝ උත්තරීතර රහත් ඵලයට පත් වූහ. එවිට බුදුරජාණන් වහන්සේ මේ සිරුර නොබෝ කලකින්ම පහවූ සිත නැතිව නිසරු වැඩකට නැති දරකඩක් මෙන් මහ පොළොව මත්තෙහි වැතිරෙන්නේය යැයි වදාළ සේක.

ගිලන් උපස්ථානය සිදු කිරීම තම තමන්ට ආත්ම කෝටි ගණන් සැප උදාකර දෙයි. සම්බුද්ධ ශාසනයේ වැඩ සිටි අසූමහා ශ්‍රාවකයන් වහන්සේලා අතුරෙන් නිරෝගි සම්පත් ලැබූ භික්ෂූන් වහන්සේ බක්කුල මහ රහතන් වහන්සේ ය. උන්වහන්සේ බුද්ධ ශාසනවල අපමණ ලෙඩුන්ට නැවීම්, කැවීම්, රැවුල් හිසකේ කැපීම්, ඇඳුම් පැළඳුම් සෝදා දීමේ කටයුතු මෙන්ම අප්‍රමාණ සත්කාර සිදු කළහ. එපමණකින් නොනැවතී බුද්ධ ශාසනවල ත්‍රිවිධ චෛත්‍ය පිරිසුදු කරමින් සංවර්ධන කටයුතු මනාව සිදු කළහ. එපමණක් ද නොව වැසිකිළි, කැසිකිළි මනාලෙස පවිත්‍ර කළේ ය. මෙම සියලුම ක්‍රියාවන් සිදුකර එකම පැතුම සසර වසන තුරු නිවන් දකින තුරු නිරෝගී සම්පත් ලැබේවා යනුවෙනි. ගෞතම සසුනේ වැඩ සිටි භික්ෂූන් අතර නිරෝගී සම්පන්නව අවුරුදු එකසිය හැටක් බක්කුල තෙරණුවෝ වැඩ සිටියහ.

මනුෂ්‍යයකුට තිබෙන පරම වටිනාම ලාභය නිරෝගිකමයි. "ආරෝග්‍ය පරමාලාභා" යන දහම් පාඨයෙන් ඒ බව මැනවින් ප්‍රකට වේ. වර්තමාන මිනිස් සමාජය තුළ අසනීපයක් නොමැති කෙනෙක් සොයා ගැනීම බොහෝ සේ අපහසු ය. ලංකාවේ ඇති රෝහල් දෙසට නෙත් යොමා බැලීමේ දී එය මැනවින් සනාථ වෙයි. මෙයට ධර්මානුකූල උත්තරය. වනුයේ පූර්ව භාවයේ සහ මෙලොවදී කර ඇති ප්‍රාණඝාත හා සත්ව හිංසනයයි.

ප්‍රාණඝාත අකුසලයක් සිදුවීමට කරුණු පහක් සම්පූර්ණ විය යුතු ම වෙයි.

එනම් ● **පණ ඇති සතෙකු වීම, ● පණ ඇති බව දැන ගැනීම, ● මරණ චේතනාව, ● උපක්‍රම යෙදීම, ● ඝාතනය කිරීම.**

සත්වඝාතන අකුසල කර්මය කෙතරම් බලවත්ද?

පුරාණ කාලයෙහි ස්ත්‍රියක් එළු දෙනෙකුගේ හිස සිඳීම හේතු කොට ගෙන මුළු ශරීරය ගිනි දැල්වලින් වෙළී අපා දුක් විඳ ඒ එළු දෙනගේ ලොම් ගණනින් ඉස් කැපීම් ලද බව සඳහන් වේ. කවරකුටත් අකුසලේ ස්වභාවය මේ ලෙස සිදු වන්නේ ය.

ප්‍රාණඝාත අකුසල කර්මය හේතුවෙන් උපනුපන් ආත්මවල අඩු ආයුෂ වලට ගොදුරු වෙයි. මේ ලෙස මුල් ශික්ෂා පදය ආරක්ෂා නොකිරීම තුළ මිනිසාට කෙටි ආයුෂ උරුම වීම මෙන්ම සත්ව ඝාතනය මෙන්ම සත්ව හිංසනය නිසා නොසිතූ නොපැතූ ලෙඩ දුක් මහා බිහිසුණු විපත් උරුම වෙයි. ජීවත්වීමට ඇති පරමායුෂ කෙටි කරයි. නීරෝගී බව වෙනුවට රෝගී බව ඇති කරයි.

නිවන් දැකීමෙන් පසු සිත නිවී යයි. දැල්වෙන පහනක් නිවීයාමක් මෙනි. එබැවින් සිත නැති මේ කය වැඩක් නොවන්නේ ය. ඉහත සඳහන් කරන ලද දහම් කරුණු මනාව තම සිතට සම්බන්ධ කරගෙන බෝසත් දිවියක් ගෙවමු.



මණ්ඩාවල - පුංචි මණ්ඩාවල මල්ලිකාරාමයේ
දහම් සරසවි ඩිප්ලෝමා
ධම්ම - අභිධම්ම - පාලිධර්මාචාර්ය
**කුඩාවේ ගුණරතන හිමි**

# යහපත් කුල ස්ත්‍රියක් වීමට...


**බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද සංයුක්ත නිකායේ හතරවන කොටසේ මාතුගාම සංයුක්තයට අයත් මාතුගාම වර්ගයේ සූත්‍ර දේශනා මුල් කරගෙනයි අද මේ දේශනාව සිදු කරන්නේ. එය හයවෙනි සූත්‍රය, කෝදන සූත්‍රයයි.**

මේ සූත්‍රයෙන් කියැවෙන්නේ ක්‍රෝධ කරන ස්ත්‍රිය පිළිබඳවයි. කරුණු පහකින් සමන්විත වූ ස්ත්‍රිය කය බිඳිල මැරුණු පසුව අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාතය නම් වූ නිරයේ උපදින්න සිදුවන බව මෙහිදී දේශනා කරනවා. ඒ කරුණු පහ තමයි, ශ්‍රද්ධාවකින් තොරවීම, පවට ලජ්ජාවක් නැතිවීම, විපාකයට බයක් නැතිවීම, ක්‍රෝධ කිරීම, ප්‍රඥාවෙන් තොරව සිටීම,

ඊළඟට එහි හත්වැනි සූත්‍රයේ දී උන්වහන්සේ දේශනා කරනවා බද්ධ වෛරය බඳින ස්ත්‍රිය

පිළිබඳව. ඒ සූත්‍රයේ නම උපනාහි සූත්‍රයයි. කරුණු පහකින් සමන්විත වූ ස්ත්‍රියට නිරයේ උපදින්න සිදුවෙනවා. ශ්‍රද්ධාවකින් තොරව සිටීම, පවට ලජ්ජාවක් නැතිවීම, විපාකයට බයක් නැතිවීම, වෛර බැඳීම හා ප්‍රඥාවකින් තොරව සිටීමයි.

ඉන්පසුව එහි අටවන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ඉස්සුකී සූත්‍රයයි. ඊර්ෂ්‍යාකාරී ස්ත්‍රිය ගැනයි මෙහිදී කියැවෙන්නේ. නිරයේ ඉපදීමට හේතුවන කරුණු පහක් මෙහිදීද දේශනා කරනවා. ශ්‍රද්ධාවකින් තොරව සිටීම, පවට ලජ්ජාවක් නැතිවීම, විපාකයට බයක් නැතිවීම, ඊර්ෂ්‍යාවෙන් පසුවීම හා ප්‍රඥාවෙන් තොර වීමයි.



**පොල්පිටිමූකලානේ පඤ්ඤසිරි හිමි**

එහි 9 වන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මසුරුකමින් සිටින ස්ත්‍රිය පිළිබඳවයි. එම සූත්‍රයේ නම මච්ඡරී සූත්‍රයයි. මුල් සූත්‍රවල ආකාරයටම කරුණු පහකින් සමන්විත වූ ස්ත්‍රියට නිරයේ උපදින්න සිදුවෙනවා.

ශ්‍රද්ධාවකින් තොරව සිටීම, පවට ලජ්ජාවක් නැතිවීම, විපාකයට බයක් නැතිවීම, මසුරුකමින් සිටීම, හා ප්‍රඥාවකින් තොරව සිටීම.

එහි දසවැනි සූත්‍රයේ දී උන්වහන්සේ දේශනා කරන්නේ සැමියා ඉක්මවා හොර සැමියන් කරා යන ස්ත්‍රිය පිළිබඳවයි. ඒ සූත්‍රයේ නම අතිචාරී සූත්‍රයයි. මුල් සූත්‍රවල ආකාරයටම කරුණු පහකින් සමන්විත මේ ස්ත්‍රියට නිරයේ උපදින්න සිදුවෙනවා.

ශ්‍රද්ධාවකින් තොරව සිටීම, පවට ලජ්ජාවක් නැතිවීම, විපාකයට බයක් නැතිවීම, සැමියා ඉක්මවා හොර සැමියන් කරා යාම හා ප්‍රඥාවකින් තොරව සිටීමයි.

ඊළඟට එහි 11 වන සූත්‍රයේ දී දුස්සීල ස්ත්‍රිය පිළිබඳව දේශනා කරනවා. ඒ සූත්‍රයේ නම දුස්සීල සූත්‍රය. මුල් කරුණු වගේම 1, 2, 3 කරුණු එක සමානයි. හතර වැනි කරුණ දුස්සීලව වාසය කිරීම, 5 වන කරුණ ප්‍රඥාවකින් තොරවීම, මේ කරුණු පහෙන් සමන්විත ස්ත්‍රිය කය බිඳිල මැරුණු පසුව අපාය නම් වූ දුගතිය නම් වූ විනිපාතය නම් වූ නිරයේ උපදිනවා.

එහි 12 වන සූත්‍රයේ දී උන්වහන්සේ දේශනා කරනවා දහම් දැනුමින් තොර ස්ත්‍රිය පිළිබඳව. ඒ දේශනාවේ නම අප්පස්සුත සූත්‍රයයි. එහිදීත් පෙර පරිදි කරුණු පහකින් සමන්විත වූ ස්ත්‍රියට නිරයේ ඉපදීමට සිදුවෙනවා. එහි 1, 2, 3 සහ 5 වන කරුණු මුල් සූත්‍රවල කරුණු සමග ගැළපෙනවා. 4 වන කාරණාව ලෙස අලුතින් එකතුවන්නේ දහම් දැනුමින් තොරවීමයි.

ඊළඟට 13 වන සූත්‍රයේ දී උන්වහන්සේ කම්මැලිකම ගැන දේශනා කරනවා. එහි නම කුසීත සූත්‍රයයි. එහිදීත් කරුණු පහකින් සමන්විත ස්ත්‍රියට නිරයේ ඉපදීමට සිදුවෙනවා. 1, 2, 3 සහ 5 වන කරුණු මුල් සූත්‍රවල කරුණු සමග ගැළපෙනවා. හතරවැනි කාරණාව ලෙස අලුතින් එකතු වෙන්නේ කම්මැලිකමෙන් සිටීමයි.

ඉන්පසුව එහි 14 වැනි සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. සිහිමුලාවී සිටින ස්ත්‍රිය පිළිබඳවයි. එහි නම මොට්ටස්සති සූත්‍රයයි.

එහිදීත් පෙර පරිදිම කරුණු හතරකින් සමානව සම්බන්ධ වන අතර අලුතින් එකතුවන කාරණාව වන්නේ සිහිමුලාවෙන් සිටීමයි. ඊළඟට එහි 15 වන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ වෛරය ඇති කරවන කරුණු පහකින් සමන්විත ස්ත්‍රිය පිළිබඳවයි. එහි නම පංචවේර සූත්‍රයයි. ඒ කරුණු නම්

සතුන් මැරීමෙන් යුක්ත වීම, සොරකම් කරන්නියක් වීම, වැරැදි කාමසේවනයේ හැසිරෙන්නියක් වීම, බොරු කියන්නියක් වීම හා මත්පැන් මත්ද්‍රව්‍ය පානය කරන්නියක් වීමයි.

විශේෂයෙන්ම මෙම සූත්‍ර දේශනාවලින් කියැවෙන පරිදි පවුලේ ප්‍රධානම චරිතය සිදුකරන මෑණියන්, දියණියන් ආදර්ශමත් අයුරින් නිවැරැදි දිවි පෙවෙතක් ගත කළ යුතු බව පෙන්වා දෙනවා. ස්ත්‍රිය වැරැදි ආකාරයෙන් හැසිරෙන්නේ නම් එය සමාජයටම බලපාන නිසා බුදුරජාණන් වහන්සේ මේ මාතුගාම වර්ගයේ දේශනාවලදී මේ කරුණු අවධාරණය කරනවා.

ඒ නිසා විශේෂයෙන් කාන්තා පාර්ශ්වය මේ දේශනාවලින් කියැවෙන කරුණු හොඳින් ධාරණය කරගෙන තමන්ගේ ජීවිතවල මේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා නැතිකරගෙන යහපත් කුල ස්ත්‍රියක් බවට පත් වීමට අධිෂ්ඨාන කරගන්න.

**අයන්ති විතාන**

# සඳුන් සුවඳින් ඔපවත් වෙන පහන් සිතිවිලි



පුන් සඳෙන් රැස් ගං තෙරෙන්
කොත් කැරැල්ලෙන් බෝ මළුවෙන්
සීත සමීරෙන් චන්දන කල්කෙන්
සතුට උදා වේවා – මිහිර උදා වේවා

හදට හදක් නැත මෙහෙම හදක් නැත
පෝයදට පෑ හඳ වාගේ
හඳට හඳක් නැත මෙහෙම හඳක් නැත
මිහිකත සනසන හඳ වාගේ

කකුසඳ කෝණාගම සහ කස්සප
ගෞතම බුදුවරු දකින සඳේ
මතු බුදුවන මෙත් හිමිගේ මහිමය
බුදු රැස් දකිනා සුපුන් සඳේ

**සුපුන් සඳෙන් නැගෙනා රැස් දහරෙහි දසුන සැබැවින් ම අසිරිමත් ය. ඒ රැස් දහරින් බොදු සිත පුබුදු කරවයි.**

## බොදු ගීයක මිහිර

ප්‍රවීණ ගීත රචක මාධ්‍යවේදී පී. එම්. සේනාරත්නයන් එය ගී පද වැළකට නැගුවේ ‘පුන් සඳෙන් රැස් ගං තෙරෙන්...’ යනුවෙනි. ඒ 1971 වසරේදී ය. බොහෝ විට 1970 – 1977 දක්වා කාලවකවානුව බොදු ගී කලාවේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ. එකල නිර්මාණය වූ බොහෝ ගීත බොදු මුහුණුවරකින් සුපෝෂිත වීම බෞද්ධයා ලද ඉමහත් භාග්‍යයකි.

‘පුන් සඳෙන් රැස් ගං තෙරෙන් ගීතයට නාද මාලාව සපයන්නේ නැසීගිය ප්‍රවීණ සංගීතවේදී ආර්. ඒ. චන්ද්‍රසේනයන් ය. ගායනය කරන්නේ ප්‍රවීණ ගායන ශිල්පී වික්ටර් රත්නායකගේ මධුර මනෝහර හඬෙනි. පසුකලෙක ගායන ශිල්පී පුන්සිරි සොයිසා ද මෙම ගීතය ගායනා කළේ ය. මෙලෙස එදා සිටම බොදු ගීත කලාවට ගායකයන්, වාදකයන්, ගීත රචකයන් දැක්වූ මෙහෙවර උදාර ය.

**පුන් සඳෙන් රැස් ගංතෙරෙන්**
**කොත් කැරැල්ලෙන් බෝ මළුවෙන්**
**සීත සමීරෙන් චන්දන කල්කෙන්**
**සතුට උදාවේවා – මිහිර උදාවේවා**

සිසාරා ගලන සඳ රැස් දහරින් අසල පිහිටි පුදබිමක දසුන සිතෙහි මවයි. කොත් කැරැල්ල, බෝ මළුව දෙස ඔහුගේ නෙත ගැටෙයි. ‘සීත සමීරෙන් චන්දන කල්කෙන්’ යනුවෙන් සිසිල් සුළඟට මුසු වූ සඳුන් සුවඳින් ඔහුගේ සිත පිරී යයි. ආධ්‍යාත්මයේ අව්‍යාජත්වය, පහන් සිතිවිලි ‘සඳුන් සුවඳින්’ ඔපවත් වෙයි. ඒ නිසාම ඔහු සතුට උදාවේවා, මිහිර උදාවේවා යනුවෙන් පැතුමක් ද එක් කරයි.

සරල පද වැලකින් සමන්විත මෙම නාද මාලාවට එක ළඟ ඇසෙනා සංගීත රාවයත් වික්ටර් රත්නායකයන්ගේ රිදී සීනු හඬත් රසික හදවත වැළඳ ගනියි.

හදට හදක් නැත මෙහෙම හදක් නැත
පෝයදට පෑ හඳ වාගේ
හඳට හඳක් නැත මෙහෙම හඳක් නැත
මිහිකත සනසන හඳ වාගේ

ඒ සුපුන් සඳ සියල්ල සම සිතින් වැඳ දරා ගනී. වෛරය, ක්‍රෝධය පිරි ‘හදවතට හදවතක්’ නැති ව්‍යාජ මිනිසුන්ට ද ‘පෝයදට පෑ සඳ සේ’ ආලෝකය ලබා දෙයි. ඒ ආලෝකයේ සිසිලසින් මිහිකත සැනසී යයි. මෛත්‍රිය, කරුණාව, දයාව ආදී බෝසත් ගුණාංගයන් ගනඳුර නිවා දමා නැගෙන සුපුන් සඳෙන් පසක් කරවයි. රසිකයාගේ සිතෙහි බුද්ධාලම්භන ප්‍රීතිය ක්‍රමයෙන් ඉස්මතු කරවයි.

**කකුසඳ කෝණාගම සහ කස්සප**
**ගෞතම බුදුවරු දකින සඳේ**
**මතු බුදුවන මෙත් හිමිගේ මහිමය**
**බුදු රැස් දකිනා සුපුන් සඳේ**

මේ සුපුන් සඳ අතීත බුදුවරු සතර නමක් දැක, මතු බුදුවන මෙත් බෝසතාණන්ගේ රැස් දහර දැකීමටත් පෙරුම් පුරයි. එහෙත් ඒ අජීවී වස්තුව බුදුවරු පස් නමක් දුටුව ද තවමත් සසර මග සැරි සරයි. මේ ආදර්ශය දෙස බෞද්ධයන් වන අප ප්‍රඥාවෙන් බැලිය යුතු ය. ඒ අප ද අජීවී වස්තුවක් වූ සඳ සේ අතීත සංසාර සාගරයේ සිට තවමත් පියමං කරන නිසා ය. එසේනම් කළ යුත්තේ මෙත් සිතිවිලි ප්‍රගුණ කරමින් අප්‍රමාදීව කුසල් වැඩීම ය. ඒ බුදුවදන පසක් කරවන්නට මේ ව්‍යවසන සමය ඉතා කාලෝචිත ය.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**



# අරුත් දැන බෝධීන් වහන්සේට වන්දනා කරමු

**"බෝධි" නම් වූ වචනයෙන් ලෝකෝත්තර මාර්ග ඥානය, සර්වඥතාඥානය, යන්න අර්ථවත් වේ. මහබෝසත් උතුමන්ට ලොව්තුරු බුදුබව ලැබීමට උපකාර වන වෘක්ෂය ද 'බෝධි' වේ.**

නිවැරැදි වූ ද, පැහැදිලි වූ ද, සම්පූර්ණ වූ ද දැනීම හෙවත් අවබෝධය, දැකීම යන්න ද 'බෝධි යන්නෙන් අර්ථවත් වේ.

බුදු බව සඳහා සෙවණ දුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට පළමු පූජාව සිදු කළේ ද අප තථාගත බුදුරජාණන් වහන්සේ විසිනි.

භාග්‍යවතුන් වහන්සේ සමාපත්තීන්ට සමවදිමින් බෝධි මූලයේ වජ්‍රාසනය මත ම පළමු සතිය ගෙවා, ඉන් නැඟී සිට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට උතුරු දිගින් සිට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් දම් පිරූ මාගේ ප්‍රාර්ථනය මේ බෝධිමූලයේ දී මස්තකප්‍රාප්ත වූයේ ය. මා හට බුදු බව ලැබීමට උපකාර වූ මේ බෝධි වෘක්ෂයට හා ආසනයට පූජාවක් කළ යුතු යැයි සිතා බෝධීන් වහන්සේ දෙසත්, වජ්‍රාසනය දෙසත් පඤ්ච වර්ණයෙන් බබළන්නා වූ නෙත් දෙකින් ඇසිපිය නො හෙළාම සතියක් මුළුල්ලෙහි බලා සිටි සේක. එය අනිමිසලෝචන පූජාව නම් වේ.

එම නිසා බෝධි වන්දනා ගාථාවන්හි තේරුම පැහැදිලි කොට දැන වන්දනා කිරීම සිදු කළ යුතු ය.

යස්ස මූලේ නිසින්නෝව
සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා
වන්දේ තං බෝධිපාදපං

යම් කිසි බෝධි මූලයක වැඩ සිටියා වූ අප ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ දසමරුන් පරදා උතුම් සර්වඥතා ඥානය උපදවා ගත්තේ ද ඒ උතුම් බෝධි රාජයාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!

ඉමේ ඒතේ මහා බෝධි
ලෝකනාථේන පූජිතා
අහංපිතේ නමස්සාමි
බෝධිරාජා නමත්ථුතේ

ලෝක නාථ වූ මාගේ බුදුරජාණන් වහන්සේ සත් දිනක් අනිමිස ලෝචන පූජාවෙන් පිදුම් කළා වූ ඒ උතුම් බෝධි රාජයාණන් වහන්සේට මම ද ගෞරවයෙන් යුතු ව මෙසේ නමස්කාර කරමි.

ඉන්ද්‍රනීල වණ්ණ පත්ත සේත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං
අග්ග බෝධි නාම වාම දේවරුක්ඛ වණ්ණිතං
තං විසාල බෝධි පාදපං නමාමි සබ්බදා

ඉඳුනිල් මාණික්‍යය වැනි පත්‍රවලින් හා සුදු වර්ණිත කඳින් ද බබළන්නා වූ ද, මාගේ බුදුරජාණන් වහන්සේගේ නෙත් පියුම්වලින් පුදන ලද්දා වූ ද, අග්‍ර මිහිර ගෙන දෙන්නා වූ , අග්‍ර බෝධි නම් වූ, සුන්දර වූ, දෙව්රුකක් සේ වර්ණිත වූ, විශාල වූ එම බෝධි වෘක්ෂයන් වහන්සේට මම සැම කල්හි ම වන්දනා කරමි.

**දීපා පෙරේරා**

# අළු යට සැඟවුණ ගිනි පුපුර

**සැවත්නුවර හිටියා වේදේහිකා කියලා කාන්තාවක්. ඇය පිළිබඳ ව කීර්තිරාවයක් මුළු නගරය පුරා පැතිර් ගොස් තිබුණා. වේදේහිකා හරිම කීකරු යි. ඉතා යටහත් පැවතුම් ඇති, උපශාන්ත තැනැත්තියක් කියලා. මේ වේදේහිකාට කාළී නමින් දාසියක් හිටියා. ඈ හරිම දක්ෂයි. කම්මැලි නෑ. ගෙදර හැම දෙයක්ම හොයල බලල කරනවා.**

දවසක් මේ කාළි දාසියට සිතුණා මෙහෙම.

"මගේ ස්වාමිදියණිය ගැන මේ විදිහට කීර්ති රාවයක් පැතිරී තිබෙනවා. වේදේහිකා ගෘහපතිනිය ගොඩාක් කීකරුයි. යටහත් පැවතුම්වලින් යුක්තයි. උපශාන්තයි කියලා. "ඇත්තෙන්ම මගේ ස්වාමිදියණිය ගේ සිතේ තිබෙන කෝපය මතු කරන්නේ නැතිව ම ඉන්නවා ද? එහෙම නැත්නම් ඇත්තටම කෝපයක් නැද්ද? එහෙම නැත්නම් මම සියලු වැඩ සොයාබලා කරන නිසා මගේ ස්වාමිදියණිය ඇය තුළ තිබෙන්නා වූ කෝපය මතු නො කර ඉන්නවා ද? මම මේ ස්වාමිදියණිය ගේ ස්වභාවය විමසා බලන්නට ඕනේ" කියා මේ කාළී දාසියට හිතුණා.

ඉතින් මේ දාසිය දිනක් පාන්දරින් නැගිට නිවසේ සියලු වැඩ කටයුතු නො කර ටිකක් දවල් වෙනතුරු නිදාගත්තා. ඉතිං වේදේහිකා ගෘහපතිනිය දාසියට මෙහෙම කිව්වා.

"ඒයි කෙල්ල කාළී"

"ඇයි ස්වාමිදියණිය"

"කෙල්ලේ මොකද උඹ දවල් වෙලා නැගිට්ටේ?"

"ස්වාමිදියණිය, මොකවත් නෑ."

"එහෙම ද? මේ පව්කාර දාසිය එතකොට මොකවත් නැතුව යි දවල් වෙලා නැගිට්ටේ නේ? "කියලා කෝපවෙලා නො සතුටු වෙලා ඇහිබැම හකුලා ගත්තා.

ඉතින් කාළී දාසියට මෙහෙම හිතුණා.

"හරි! මගේ ස්වාමිදියණිය තිබෙන්නා වූ කෝපය තමයි මතු කරන්නේ නැතිව ඉන්නේ. නො තිබෙන දෙයක් නො වෙයි. මම මේ සියලු වැඩ හොඳට සොයා බලා කරන නිසා තමයි මගේ ස්වාමිදියණිය තමා තුළ තිබෙන්නා වූ කෝපය මතු කරන්නේ නැතිව ඉන්නේ. නො තිබ්ලා නොවෙ යි. එහෙම නම්, මම තවත් මගේ ස්වාමිදියණිය ගැන විමසන එක තමයි හොඳ" කියලා.

ඉතින් කාළී දාසිය එදාත් බොහෝ දවල් වී නින්දෙන් නැගිට්ටා.

වේදේහිකා එදාත් කාළී දාසියගෙන් මෙහෙම ඇහුවා.

"ඒයි! කෙල්ල කාළී, උඹ මොකද අදත් ගොඩක් දවල් වෙලා නැගිට්ටේ?"

"ස්වාමිදියණිය එහෙම විශේෂ දෙයක් නැහැ."

"එහෙමද? මේ පාපී වැඩකාරී අදත් දවල් වෙලා නැගිට්ටේ හේතුවක් නැතිවයි" කියලා කේන්ති ගත්තා. නො සතුටු වුණා. නො සතුටු වචන පිට කළා.

එදාත් කාළී දාසියට මෙහෙම හිතුණා.

"හරි! මගේ ස්වාමිදියණිය තුළ තිබෙන්නා වූ ම කෝපය යි පිට නො කර ඉන්නේ. නො තිබෙන්නා වූ දෙයක් නො වෙයි. මම මේ හොඳට හොයලා බලල වැඩ කරන නිසයි මගේ ස්වාමිදියණිය තමා තුළ තිබෙන කෝපය මතු නො කරන්නේ. නො තිබ්ලා නොවේ. ඒ නිසා මම තවදුරටත් ස්වාමිදියණිය ගැන විමසල බලන එක තමයි හොඳ" කියා කාළි දාසිය හිතුවා.

ඉතින් ඒ කාළි දාසිය එදත් ගොඩාක් දවල් වී නැගිට්ටා. වේදේහිකා ගෘහණිය කාළී දාසියට මෙහෙම කිව්වා.

"ඒයි කෙල්ල කාළී"

"ඇයි ස්වාමිදියණියනි,"

"කෙල්ලෙ මොකද උඹ හොඳට ම දවල් වෙනකල් ඉඳලා නැගිට්ටේ?"

"මොකවත් නෑ ස්වාමිදියණිය"


"එහෙමද පාපී වැඩකාරිය. උඹ මොකවත් නැතිව යි එහෙමනම් හොඳට දවල් වෙනකල් ඉඳලා නැගිට්ටේ නේ?" කියලා කේන්ති ගත්තා. නො සතුටු සිත් ඇතිකර ගත්තා. අන්තිමේ දී දොර පොල්ල අරගෙන දාසිය ගේ ඔළුවට ගැහුවා. හිස පැලුනා.

ඒ දාසිය හිසෙන් ලේ ගලද්දී ගෙදරින් එළියට පැන්නා. අහල පහළ අයට කෑගහල කිව්වා "මෙන්න බලන්න කීකරු තැනැත්තියගේ වැඩ. මෙන්න යටහත් පැවතුම් ඇත්තියගේ වැඩ. මෙන්න උපශාන්ත මගේ ස්වාමිදියණියගේ වැ.ඩ. තමන්ගේ නිවසේ සියලු වැඩපල කරන එකම දාසිය දවල් වෙලා නැගිට්ට කියලා කේන්ති ගිහින් අසතුටු වෙලා දොර පොල්ලෙන් ඔළුවට ගහලා ඔළුව පලන්නේ කොහොම ද? " කියලා.

ඒ සිද්ධියෙන් පසුව වේදේහිකා ගෘහපතිනිය ගැන අපකීර්තියක් පැතිරී ගියා. වේදේහිකා ගෘහපතිනිය නපුරුයි, දරුණුයි, ඇය නො සන්සුන් කියලා. ඇය හරියට අළුයට තිබෙන ගිනි පුපුරක් වගේ කියලා.

**නයනා නිල්මිණී**

# දෙලොව සනසන යහපත් වචනය



කායේන සංවරෝ සාධු
සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු
සාධු සබ්බත්ත සංවරෝ

**බුදුදහමෙහි සඳහන් වන අවසාන මාර්ගඵලය නිවනයි. මේ ලෝකයේ සියලු සත්ත්වයෝ ඉපදෙමින්, මැරෙමින් නිමාවක් නොදකින සංසාර ගමනක බැඳී සිටිති.**

කෙළවරක් නොමැති දුක් සහිත සසර ගමනක යෙදී සිටින සියලු සත්ත්වයෝ එයින් මුදා ගැනීම පිණිස, අප ලොව්තුරා සම්මා සම්බුදු පියාණන් වහන්සේ නිවන නමැති සංකල්පය මේ ලෝකයට වදාළ සේක. ඒ අනුව කුසලය සහ අකුසලය වශයෙන් පැති දෙකක් පිළිබඳව බුදුදහමෙහි විග්‍රහ වේ. කුසලය වර්ධනය කරන සත්ත්වයෝ යහපත් ආත්මභාව ලබා ගනිති. ඔවුන් සුගතිගාමී ජීවිත ගත කරති. අකුසලය වර්ධනය කරන සත්ත්වයෝ සංසාර ගමනෙහි දුක්සහිත ආත්මභාවයන් ලබාගනිති. කිසියම් සත්ත්ව කොට්ඨාසයක් සුගතියෙහි ඉපදීමටත්, තවත් සත්ත්ව කොට්ඨාසයක් දුගතියෙහි ඉපදීමටත් හේතුවූ කාරණා බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයා වෙත පතල මහා කරුණාවෙන් වදාළ සේක. ඒ අනුව සිත නමැති ඉන්ද්‍රියට බුදුදහමෙහි ප්‍රමුඛස්ථානය හිමි වේ. සිත දුර්වල කරන, සිත ශක්තිමත් කරන ආයතන දෙක කය සහ වචනය වශයෙන් බුද්ධ දේශනාවෙහි විග්‍රහ කර ඇත. කය සහ වචනය පිරිසුදු වීමට නම්, සිත පිරිසුදු විය යුතු ය. අපිරිසුදු සිත කය සහ වචනය ද අපවිත්‍ර කරනු ලබයි. එහි අනිටු විපාක ඉතාම දුක්ඛිතව අත්විඳීමට සිදුවනු ඇත. බුද්ධ දේශනාව තුළ වචනයට ප්‍රබල ස්ථානයක් හිමි වේ. ඇතැම් පුද්ගලයෝ තමාගේ හිත සුව පිණිස පමණක් නොව, අන්‍යයාගේ හිත සුව පිණිස ද, වචන භාවිත කරති. ඇතැම් පුද්ගලයෝ තමාගේ පටු පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා තමාගේ වාසියට පමණක් වචන භාවිත කරති. බුදුරජාණන් වහන්සේ යම් යම් සූත්‍ර දේශනාවන්හි ද වචනය පිළිබඳව දීර්ඝව දේශනා කර ඇත. බුදුදහමෙහි ඒකායන මාර්ගය වූ නිවන් මාර්ගය තුළද වචනයෙහි ඇති වැදගත්කම පෙන්වා දුන් සේක. තුන්දෙර පිළිබඳව සඳහන් කරන විටද, සිත, කය, වචනය පිළිබඳව සඳහන් වේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දී තුන්වන මාර්ග අංගය බවට පත්ව ඇත්තේ ද වචනයයි.

තත්ත්ව කතමා සම්මා වාචා මුසාවාද වේරමණී, පිසුණාවාචා වේරමණී, පරුෂාවාචා වේරමණී, සම්පප්ප්‍රලාපා වේරමණී අයං වුච්චති සම්මා වාචා යනාදී වශයෙන් දම්සක් පැවැතුම් සූත්‍ර දේශනාව තුළ ද වචනයෙහි ඇති වැදගත්කම පෙන්වා දී ඇත. යහපත් වචනය හෙවත් සම්මා වාචා යනු මුසාවාදයෙන් පිසුණාවාචයෙන්, පරුෂාවාචයෙන්, සම්ප්‍රප්ප්‍රලාපයෙන් වෙන්වීම වේ. සම්මා සංකප්ප සමඟ සතර වැදෑරුම් වාග් දුෂ්චරිතයෙන් සහමුලින්ම වැළකීම සම්මා වාචා යනුවෙන් දහම තුළ විග්‍රහ කර ඇත.



ශාස්ත්‍රපති, පණ්ඩිත
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක
**විතාරන්දෙණියේ මේධානන්ද හිමි**

ධම්මපදයේ පළමු සහ දෙවන ගාථා තුළ ද, මෙලොව ජීවිතය පමණක් නොව, සංසාරගත පරලොව ජීවිතය–ටත් වචනය ප්‍රබල කර්ම ශක්තියක් එක් කරන බව දැනගත යුතු ය. ‘මනසා චේ පසන්නේන භාසතීවා කරෝතීවා.’

ප්‍රසන්න මනසක් සහිත පුද්ගලයකු භාවිත කරන යහපත් වචනයෙහි ප්‍රතිවිපාක නම්, තමා අතහැර නොයන තමා පසුපස ගමන් කරන සෙවනැල්ල සේ සංසාරික වශයෙන් යහපත් විපාකම ලබා දීමයි.

“මනසාචේ පදුට්ඨේන” කේළම, පරුෂ වචනය, හිස් වචනය ආදී වශයෙන් භාවිත වන වචනය අයහපත් නම්, කරත්තය පසුපස ඇදගෙන යන ගොනකු සේ තමා කතා කළ වචනයෙහි සහ ක්‍රියාවෙහි පාපී බව බරකරත්තයක් අදින ගොනකු සේ සංසාරය පුරා ඇදගෙන යන බව ධම්මපදයේ යමක වග්ගයේ සඳහන් ව ඇත. ඉහත සඳහන් පරිදි අයහපත් වචන භාවිත කිරීම සංසාරික වශයෙන් පමණක් නොව, මෙලොවදීත් දුක් විපාක විඳීමට සිදුවනු ඇත. බොරු කියන පුද්ගලයාට කළ නොහැකි පාපයක් නොමැති බව දහමෙහි සඳහන් වේ. එනිසා අප කතා කරන වචනයම අපගේ නිර්වාණ මාර්ගය අහුරාලීමට හේතුවක් විය හැකි ය.

> **යහපත් වචනය හෙවත් සම්මා වාචා යනු මුසාවාදයෙන් පිසුණාවාචයෙන්, පරුෂාවාචයෙන්, සම්පප්ප්‍රලාපයෙන් වෙන්වීම වේ. සම්මා සංකප්ප සමඟ සතර වැදෑරුම් වාග් දුෂ්චරිතයෙන් සහමුලින්ම වැළකීම සම්මා වාචා යනුවෙන් දහම තුළ විග්‍රහ කර ඇත.**

බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයා වෙත පතල මහා කරුණාවෙන් ලෝකයට දේශනා කොට වදාළ වූ වචනය නිවැරැදිව ශ්‍රවණය කළ බොහෝ පිරිස් සතර අපායෙන් මිදී සුගතිගාමී ජීවිත ලබාගත්හ. ධර්මය මනාව වටහාගත් පිරිස බුද්ධ ශ්‍රාවකයෝ බවට පත් ව නිවන් මාර්ගයට ප්‍රවිෂ්ට වූහ. බුද්ධ වචනය නිවැරැදිව වටහාගත් පිරිස් වර්තමාන සමාජයෙහිත් සතුටෙන් ජීවත් වෙති. “සන්තුට්ඨී පරමං ධනං” ඔවුන්ගේ පරම ධනය සතුටයි. අප සම්මා සම්බුදු පියාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් වදාළ වූ බුද්ධ වචනයට පරිබාහිරව කටයුතු කරන පුද්ගලයෝ සතුව කෙතරම් ධනස්කන්ධයක් පැවතිය ද, ඔවුන් බොහෝ දුක් සහිත ජීවිත ගත කරති.

එක්තරා ස්වාමීන් වහන්සේ නමක් පිළිබඳව සඳහන් වන බණ කතාවක වචනයෙහි ප්‍රතිවිපාක පිළිබඳව සඳහන් ව ඇත. ඒ අනුව එම ස්වාමීන් වහන්සේ ප්‍රසන්න වූ රූප සම්පත්තියකින් අගතැන්පත් විය. වචනය ඉතාමත්ම මිහිරි විය. උන්වහන්සේගේ ධර්ම දේශනා බොහෝ මිනිසුන් ප්‍රිය කළහ. කාලයාගේ ඇවෑමෙන් උන්වහන්සේ බොහෝ සේ පරිස්කාර ලැබූහ. තවත් ස්වාමීන් වහන්සේ නමක් එබඳු ආකාරයෙන් ධර්ම දේශනා කළහොත් තමනට දායකයන්ගෙන් ලැබෙන ප්‍රතිලාභ අඩුවේවි යැයි යන අදහසින් උන්වහන්සේ අයහපත් වචනයම දේශනා කළහ. ධර්මය වැඩූ සිතින් අධර්ම වචන කතා කළ නිසාම උන්වහන්සේගේ සිත අධර්මය වෙත ළඟා විය. එම ස්වාමීන් වහන්සේ අපවත් වූ පසු ඉතාමත් ලස්සන වූ රන්වන් මාළුවෙක් වශයෙන් උප්පත්තිය ලැබීය. ගංගාවක ජීවත් වූ මාළුවා මිනිසුන් කණ්ඩායමකට හසුවිය. රන්වන් වූ ලස්සන පැහැයෙන් යුත් මාළුවෙක් වුවද මුඛය විවෘත කරන සෑම අවස්ථාවකදීම ඉවසාගත නොහැකි දුර්ගන්ධයක් මුඛයෙන් පිට විය. එම මාළුවා පිළිබඳ පුවත රජ මාලිගාවටද සැළ විය. එම කතා පුවත දැනගත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනු ලැබුවේ පෙර ආත්මයකදී තමා පාවිච්චි කළ වැරැදි වචන නිසාම දුගඳ හමන මුඛයක් සහිතව තිරිසන් ආත්මයක උප්පත්තිය ලැබූ බවය. එබැවින් අසත්‍ය වැරැදි වචන කතා කරන පුද්ගලයන්ගේ වචන පවා දුගඳ හමනු ඇත.

කිසියම් පුද්ගලයකුගේ ජීවිතය නිවැරැදි මාර්ගයට යොමුකිරීම සඳහා නිවැරැදි වචනය කෙතරම් ඉවහල් වේද? සත්ති කුම්භ ජාතකයේද ඒ බව සනාථ වේ. එම ජාතකයෙහි සඳහන් වන ආකාරයට එක්තරා ගිරව් දෙදෙනෙකුගෙන් එක් ගිරවෙකු තාපසාරාමයකටත් අනෙක් ගිරවා හොරු රංචුවකටත් වැටිණ. සොර රංචුව සමීපයෙහි සිටි ගිරවා අයහපත් වචන කතා කිරීමටත්, තාපසාරාමයෙහි සිටි ගිරවා යහපත් වචන කතා කිරීමටත් පුරුදු විය. ඒ සඳහා ආශ්‍රය බලපෑ ආකාරය මෙයින් පැහැදිලි වේ.

තමා කතා කරන සෑම අයහපත් වචනයක්, හේතු කොට ගෙන සංසාරගතව දුක් විපාක ලබාදෙයි. තමනට අවාසියක් වුවද, සත්‍ය වචනයම කතා කිරීමට පුරුදු පුහුණු විය යුතු ය. ඔබට එම අවස්ථාවෙහි කිසියම් අවාසියක් සිදුවුවද, සත්‍ය වචනය කතා කිරීමෙන්ම සංසාර දුකින් නිදහස් විය හැකි ය. ඔබ මනුෂ්‍ය ආත්මයක් ලැබුවේ කෙසේද? සීලේන සුග්ගතිං යන්ති මනුෂ්‍ය ජීවිතයක් ලැබීමට සිල්වත්කම හේතු විය. කය සහ වචනය තුළ සිල්වත්කම ආරක්ෂාවනු ඇත. ඔබ හොඳ ආත්මයක් ලබා ඇත්තේ සංසාර ගමනෙහි සත්‍ය වචනයම කතා කළ බැවිණි. කය වචනය සංවර වූ විට සිත සංවර වේ. සිත සංවර වූ පුද්ගලයා මෙලොව පරලොව වශයෙන් දෙලොවම සැනසීමට පත්වේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරම සැනසීම ලැබීමට එය හේතු වේ. එනිසා වචනයෙහි සංවර විය යුතුය.

**හේමමාලා රන්දුනු**

# මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ධාතූන් වහන්සේ වැඩ සිටින

# ගලපාත රාජමහා විහාරය

**මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ගේ ශ්‍රී ශරීරය උතුරු ඉන්දියාවේ කුක්කුටසම්පාත පර්වතය තුළ තැන්පත් ව තිබුණත්, උන්වහන්සේගේ ධාතූන් වහන්සේ නමක් ලක්දිව තුළ වැඩ සිටිති.**

නමුත් මෙය බොහෝ දෙනා නො දන්නා කරුණකි. මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වැඩ සිටින්නේ ඓතිහාසික බෙන්තර ගලපාත රාජමහා විහාරයේ ය. මේ බව පාලි චූලවංශය, පූජාවලිය යන ග්‍රන්ථයන්හි පැහැදිලි ව සඳහන් ව ඇත.

මෙතැන් සිට මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වැඩ සිටින ඓතිහාසික බෙන්තර ගලපාත රාජමහා විහාරය ගැන දැන ගත යුතු මූලික කරුණු ස්වල්පයක් දක්වනු ලැබේ.

## බෙන්තර ගලපාත රාජමහා විහාරය

ඓතිහාසික බෙන්තර ගලපාත රාජමහා විහාරය දකුණු පළාතට අයත් පුරාණ රාජමහා විහාරයකි. දේවානම් පියතිස්ස රජු සමයේ තනන්නට ඇතැයි සැලකෙන මේ මහා විහාරය මහ රහතන් වහන්සේලා වැඩ සිටි ශුද්ධ භූමියකි. ගලපාත විහාරය, ගලතුරුමූලය, සේලාන්තර මූලය, බෙන්තොට විහාරය යන නම්වලින් ද හඳුන්වනු ලැබේ.

මහා කාශ්‍යප ධාතූන්ව දඹදිවින් ලක්දිවට වැඩම කරවා ඇත්තේ අනුරාධපුර සමයේ දී ය. පසුව අනුරාධපුරයේ වැඩ සිටි එක් මහ රහතන් වහන්සේ නමක් මහා කාශ්‍යප ධාතූන්ව ගෙන දකුණු පළාතේ බෙන්තර ගලපාත රාජමහා විහාරයට පැමිණ ධාතූන්ව එම විහාරයේ තැන්පත් කර ඇත. මේ බව දැන ගත් දුටුගැමුණු මහ රජතුමා තම සොහොයුරා වූ සද්ධාතිස්ස කුමරු බෙන්තර ගලපාත විහාරයට යවා එම විහාරය සියලු අංගයන්ගෙන් සපිරි මහා විහාරයක් බවට පත්කරවා ඇත. පොළොන්නරු යුගයේ රජ කළ මහා පරාක්‍රමබාහු, කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල යන රජවරුන් පවා මහා කාශ්‍යප ධාතූන් වහන්සේට බොහෝ සත්කාර පවත්වා ගලපාත විහාරයේ දියුණුව සඳහා නොයෙක් ප්‍රදානයන් කර ඇත.

දුටුගැමුණු රජ සමයේ සිට දඹදෙනි යුගයේ රජ කළ දෙවැනි පරාක්‍රමබාහු රජ සමය දක්වා මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වැඩ සිටියේ බෙන්තර ගලපාත විහාරයේ ධාතූන් මැඳුරෙහි ය. පසුව දෙවැනි පරාක්‍රමබාහු රජතුමා විහාරයට පැමිණි අවස්ථාවේ දී වැඩි ආරක්ෂාව සඳහා මහා කාශ්‍යප ධාතූන් වහන්සේ ගලපාත විහාරයේ ස්තූපය තුළ නිදන් කර ඇත. මේ අවස්ථාව දැක්වෙන සේ අඳින ලද ඉතා අලංකාර විශාල සිතුවමක් ගලපාත රාජමහා විහාරයේ ආනන්ද ප්‍රතිමාලයේ දක්නට ඇත. මෙය මෑත කාලයේ දී අඳින ලද සිතුවමකි.

## රජතුමාගේ වන්දනාව

කුරුණෑගල යුගයේ රජකම් කළ සතරවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා ද මහා කාශ්‍යප ධාතූන් වහන්සේට බොහෝ පුද සත්කාර පවත්වා ඇත. මේ රජතුමා සර්වඥ යටි වම් ධාතූන් වහන්සේට පුද සත්කාර කළ යුතු ආකාරය දක්වමින් ඒ සඳහා වෙනම නීති මාලාවක් ද සම්පාදනය කර තිබේ. එහි සර්වඥ ධාතූන් වහන්සේට පමණක් නොව මහා කාශ්‍යප ධාතූන් වහන්සේට ද පුද සත්කාර කළ යුතු ආකාරය පැහැදිලිව දක්වා තිබේ. මේ විස්තර ධාතූන් සිරිතේ අවසාන පරිච්ඡේදය කියැවීමෙන් දත හැක.

මෙසේ ලක්වැසි සිංහල මහ රජදරුවන් ප්‍රධාන සැදැහැති බෞද්ධ ජනයාගේ වන්දනාවටත්, මහත් වූ ගෞරවාදරයටත් පත් මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වැඩ සිටින බෙන්තර ගලපාත රාජමහා විහාරයට පෘතුගීසීන්ගෙන් ප්‍රහාරයක් එල්ල වී ඇත. එහිදී ඔවුහු විහාරයට පැන එහි තිබූ වටිනා භාණ්ඩ සියල්ල ම පැහැරගෙන මහා විනාශයක් සිදු කළහ. මේ නිසා විහාරය සතු පුරාවස්තු බොහොමයක් විනාශ විය.

නමුත් ඔවුන් අතින් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ධාතූන්ව වැඩ සිටින මහා ස්තූපයට කිසිම හානියක් සිදු වී නැත. සැබැවින් ම මෙය ආශ්චර්යයකි. ස්තූපය පිහිටා ඇත්තේ රහසිගත තැනක නොව සැම



දෙනාට ම පැහැදිලිව පෙනෙන තරමක් උස් තැනක ය. විහාරයට පිවිසෙන විටම ස්තූපය හොඳින් පෙනෙයි. එසේ තිබියදීත් මේ ස්තූපය විනාශ නො වූයේ මහා කාශ්‍යප ධාතූන් වහන්සේගේ ප්‍රාතිහාර්ය බලයෙන් බව බොහෝ දෙනාගේ විශ්වාසය යි.

## ධාතූන් වහන්සේ වන්දනාවට

මෙයට වසර දෙසීයකට පමණ පෙර ස්තූපය පිළිසකර කිරීමේ දී මහා කාශ්‍යප ධාතූන් වහන්සේ ස්තූපයෙන් පිටතට වැඩම කරවා පුරා දින සතක් මහජනයාට ප්‍රදර්ශනය කර ස්තූපය පිළිසකර කළ පසු නැවතත් ධාතූන් වහන්සේ ස්තූපය තුළම නිදන් කර ඇත.

ඓතිහාසික බෙන්තර ගලපාත රාජමහා විහාරය බොහෝ පුරාවස්තු සහිත ශුද්ධ භූමියකි. විහාර භූමියේ තැනින් තැන ගල්කණු, මුරගල් ආදිය දක්නට ඇති අතර, ස්තූපය සමීපයේ පැරණි කොරවක්ගල් දෙකක් දක්නට ඇත. එය සරල ය. චාම් ය. අතීතයේ මහා කාශ්‍යප ධාතූන් වහන්සේ තැන්පත් කර තිබූ ධාතූන් මැඳුරේ නටබුන් විහාර භූමියේ තවමත් පවතියි. අද එහි දක්නට ඇත්තේ කුඩා ගල්තලාවකුත්, ගල්කණු කිහිපයකුත් පමණි. පුරාණ ධාතූන් මැඳුරේ නටබුන් මේ වන විට බොහෝ දුරට විනාශ වී ඇත.

ගලපාත විහාරයේ ස්තූපය අසල විශාල බුදුමැදුරු දෙකක් ඇත. ඉන් එක් විහාරයක් හඳුන්වන්නේ ආනන්ද ප්‍රතිමාලය යනුවෙනි. අනෙක පුරාණ විහාර ගෙය යි. පුරාණ විහාරගෙය ඇතුළු ගර්භය හා පිටත ගර්භය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක. ඇතුළු ගර්භයේ දහ අට රියන් සැතපෙන බුද්ධ ප්‍රතිමාවකි. පිළිමය තනා ඇත්තේ අඟල් 28 ක් තරම් උස් වූ ආසනයක් මත ය. සිවුරේ රැළි ඉතා සියුම් ලෙස දක්වා ඇත. ඇතුළු ගර්භයේ වම්පස ධ්‍යාන මුද්‍රාවෙන් යුතු තරමක් විශාල හිඳි බුද්ධ ප්‍රතිමාවකි. සිරස්පත සහිත යි. ඒ පිළිමයේ වම් අත පැත්තේ කුඩා හිටි බුද්ධ ප්‍රතිමාවකි. එහි දකුණතින් විතර්ක මුද්‍රාව පෙන්නුම් කෙරේ. මේ පිළිමයට බෙහෙවින්ම සමාන වූ විශාල හිටි බුදු පිළිම හතරක් පිටත ගර්භයේ වම් අත පැත්තේ ඇත. මේ සියලු ප්‍රතිමා මහනුවර යුගයේ කලා ලක්ෂණ පෙන්වයි.

පැරණි විහාරගෙයි මහනුවර කලා සම්ප්‍රදාය අනුගමනය කළ සිතුවම් මෙන් ම බටහිර කලා ආභාෂය ලැබ නිර්මාණය කළ සිතුවම් ද දක්නට ඇත. ඇතුළු ගර්භයේ සිවිලිම සම්පූර්ණයෙන් ම නෙළුම් මල් මෝස්තරවලින් අලංකාර කර ඇත. පිටත ගර්භය අලංකාර මල් මෝස්තර, ලියවැල් රටා ආදියෙන් විසිතුරු කර ඇත. ඇතුළු ගර්භයට පිවිසීම සඳහා දොරටු දෙකක් ඇති අතර, දොරටු දෙක විචිත්‍ර මකර තොරණින් සරසා ඇත. මේ විහාරගෙයි ඇති සිතුවම් විනාශ වෙමින් පවතී. පිටත ගර්භයේ දකුණුපස බිත්තියේ යට ඇති සිතුවම් මේ වන විටත් බොහෝ දුරට විනාශ වී ඇත. විහාරගෙයි සිතුවම් පමණක් නොව එහි පොළොව ද බොහෝ සෙයින් විනාශ වී ඇත. ඇතැම් ජනේල ද ගැලවී ඇත. සකස් කිරීමක් නැති නිසා අව්වෙන් ද, වැස්සෙන් ද සිතුවම් විනාශ වෙයි. කිසිවෙකුගේ අවධානයක් මේ කෙරෙහි යොමු නො වීම දුකට කරුණකි.

## ඓතිහාසික උරුමය

පැරණි ප්‍රතිමා ගෘහය සමීපයේ ම වම්පසින් ආනන්ද ප්‍රතිමාලය පිහිටා ඇත. එයද ඉහත විහාරගෙය මෙන් ම පැරණි ය. නමුත් දැන් ඒ තුළ ඇත්තේ නූතන කලා නිර්මාණයි. විහාරයට පිවිසෙන විට වම් අත පැත්තේ වෙනම කුටියක් තුළ තනා ඇති විෂ්ණු දේවාලයකි. මේ විහාරගෙය තුළ ද දහඅට රියන් සැතපෙන බුදු පිළිමයකි. මේ හැරුණු විට විශාල හිඳි පිළිමයක් මෙන් ම, හිටි පිළිම කිහිපයක් ද වෙයි. ධ්‍යාන මුද්‍රාවෙන් යුතු හිඳි පිළිමය ඉතා අලංකාර නිර්මාණයකි. මෙහි මෑතක දී අඳින ලද අලංකාර සිතුවම් දක්නට හැක. දෙවැනි පරාක්‍රමබාහු රජු ගලපාත විහාරයට පැමිණ මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වන්දනා කර පුද පූජා පැවැත් වූ අයුරුත් ධාතූන් වහන්සේ ස්තූපය තුළ තැන්පත් කළ අයුරුත්, ඉතා විසිතුරු ලෙසින් ඇඳ ඇත. එසේම එහි ගලපාත විහාරයේ දියුණුවට උපකාරී වූ මහා කාශ්‍යප ධාතූන් වහන්සේට පුද සත්කාර කළ ශ්‍රේෂ්ඨ සිංහල රජ දරුවන්ගේ සිතුවම් ද ඇඳ ඇත. මේ විහාරගෙයි අලංකාර මෛත්‍රී බෝසත් රුවක් ද තනා ඇතත. සමාධි පිළිමය සමීපයේ වෙන් කරන ලද කුටියක තරමක් විශාල ස්තූපයකි. ස්තූපය තුළ බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු නිදන් කර ඇත. මුළු ස්තූපය ම වර්ණ ගන්වා තිබීම සුවිශේෂී වෙයි.

ගලපාත විහාරය පිටුපස රහස් උමඟක් දක්නට ලැබේ. මේ උමඟ කුමක්ද'යි කියා මෙතෙක් පැහැදිලිව හඳුනාගෙන නැත. ගලපාත විහාරය අවට වනවාස විහාරය, බෙන් විහාරය, බෝධිමළුව විහාරය, උඩකොටුව විහාරය යනුවෙන් මහා විහාර හතරකි. අතීතයේ දී මේ විහාර සියල්ල ම ගලපාත විහාරයේ ම කොටස් වශයෙන් පැවතී ඇත.

දෙවැනි පරාක්‍රමබාහු මහ රජතුමා මහා කාශ්‍යප ධාතූන් වහන්සේ වන්දනා කිරීමට ගලපාත විහාරයට පැමිණි විට විහාරය සමීපයේ එක් වත්තක තාවකාලිකව වාසල තනාගෙන සිටි බව සඳහන් වෙයි. ඒ වත්ත පසුව 'වාසලවත්ත' යනුවෙන් ප්‍රකට විය. ඒ වත්ත ගලපාත විහාරයට නුදුරින් දක්නට ඇත. අදත් ඒ වත්ත 'වාසලවත්ත' යනුවෙන් හඳුන්වනු ලැබේ.

ගයාන් චානුක විදනපතිරණ

බුදු සරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069
ඇසළ අමාවක 2020.07.20

## ආලෝකය දැකීම

එක් ගුරුවරයෙක් තම ශිෂ්‍යයාට පැවරුමක් දුන්නේ ය. එය සාමාන්‍ය පැවරුමකට වඩා වෙනස් වූවකි. ගුරුවරයා අත වූයේ කුඩාවට ඉරන ලද කඩදාසි කැබලි කිහිපයකි. ඒවා ශිෂ්‍යයා අතට දී, එහි ඇත්තේ ලෝක සිතියම බවත්, නැවත ඒවා නිවැරැදි ව සකස්කොට ලෝක සිතියම නිර්මාණය කර දෙන ලෙසත් ඔහු ශිෂ්‍යාට කීවේ ය. ශිෂ්‍යයා ද ලෝක සිතියම සැකසීමට බොහෝ වේලා උත්සාහ ගත්තේ ය. එහෙත් එය බොහෝ අසීරු විය. එක් අවස්ථාවක කඩදාසි කැබලි අනෙක් පස හරවා බැලුවේ ය. මිනිස් සිරුරක කොටස් දුටුවේ ය. ඔහුට අපූරු අදහසක් ඇතිවුණි. ලෝක සිතියම සකසනවා වෙනුවට ඔහු මිනිස් රුවෙහි හැඩය නිර්මාණය කරන්නට විය. අවසානයේ අපූරු මිනිස් රූපයක් නිමැවුණේ ය. ඔහු එය අනෙක් පස හරවා බැලුවේ ය. එහි වූයේ ලෝක සිතියම ය.

මේ කතාව අපේ සමාජයට දෙන්නේ අපූර්ව පණිවිඩයකි. අනුන්ගේ ම වැරැදි දකිමින් අනුන් නිවැරැදි කරන්නට යෑම බොහෝ අයගේ පුරුද්ද ය. තවත් ලෙසකින් කියනවා නම්, බොහෝ දෙනා උත්සාහ ගන්නේ ලෝකය හදන්නට ය. එහෙත්, රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් අන්ධ වූ, ජරා ජීර්ණ වූ මිනිසුන් හැදීම, සාමාන්‍ය මිනිසකුට නම් සිතන තරම් පහසු නැත. එහෙත් ඊට හොඳ මගක් ඇත. ඒ, පළමුව තමන් හැදීම ය. තමන් හැදුණු කල ලෝකය ද පහසුවෙන් හැදෙනු ඇත.

අප ජීවත්වන සමාජයේ විවිධ චරිතයෝ වෙති. ඇතැමෙක් නපුරු ය. වෛරී සහගත ය. තණ්හාධික ය. අකෘතඥ ය. තමන්ට වඩා බලවතෙක් නැතැයි අනුන් හෙළා දකින්නෝ ය.


තවත් කෙනෙක් කාරුණික ය. ඉවසිලිවන්ත ය. තමන්ගේ අඩුපාඩු පිළිගනිති. අවංක ය. අනුන් හෙළා නොදකිති. සත් පුරුෂ එවැන්නෝ අන්‍යයන්ට ද සහනසීලි ය. ප්‍රියමනාප ය.

මේ කවර චරිත සමඟ වුවද ගනු දෙනු කරන්නට අපට සිදුවේ. කළකිරීම් ඇති වන්නේ අයහපත් අයගෙන් තමන්ට සිදුවන අකටයුතුකම් නිසා ය. එසේ නැතිනම් සමාජයට වන අකටයුතුකම් දකින නිසා ය. එහෙත් අනුන් නිවැරැදි කිරීම පහසුවෙන් කළ නොහැකි ය. අප කළ යුතු ඒ අයහපත් මිනිසුන් අතර, ගුණගරුක මිනිසුන් ලෙස අපගේ දිවි පැවැත්ම හසුරුවා ගැනීම ය. අඳුර දකින්නන් අතර ආලෝකය දකින්නන් වීමට ය.

අපගේ පරමාදර්ශය වන්නේ තථාගත බුදුපියාණන් වහන්සේ ය. උන්වහන්සේ අපට මා හැඟි ජීවන ප්‍රතිපදවක් හඳුන්වා දුන්හ. බෞද්ධයෙකුට ඒ මඟ ගමන් කිරීම අපහසු නොවන්නේ ය. උන්වහන්සේ ගත කළේ පද්මාකර ජීවිතයකි. පද්ම නම් නෙළුම් ය. ගොහොරු මඩ ගොඩක පිපෙන නෙළුම, ඒ ගොහොරු බිමෙන්ම පෝෂිත වී, එහෙත් ඒ අපවිත්‍ර දෑ නොතවරාගෙන උඩට මතු වී, ප්‍රසන්න ව, සුවඳවත් ව විකසිත වන අයුරු මොන තරම් අපූරු ද? අපේ බුදුරජාණන් වහන්සේ එවැනි ය. උන්වහන්සේ කෙලෙස් මලින් පිරි දූෂිත මිනිසුන් අතර ම හිඳිමින් ඒ මඩ වතුරෙහි නොගිලුණු සේක. කෙලෙස් මලින් තොරව, මඩ සහිත ජලයේ නොතැවරී ඉහළට මතු වී විකසිත වූ නෙළුමක් සේ ලෝකයෙහි බැබළුණහ. ලෝකය සුවඳවත් කළහ. බලා හැදෙන්නට ඒ ආදර්ශය මොන තරම් වටිනවාද? වෛරයෙන් වෛරයට, ද්වේෂයෙන් ද්වේෂයට යන සමාජයේ බොහෝ දෙනා ගඟ පහළට ගලන්නා සේ අනුසෝතගාමී ගමනක යති. එහෙත් බුදු හිමියෝ අපට ඉගැන්වූයේ පටිසෝතගාමී වීමට ය. එනම් උඩුගං බලා යාමට ය. ඒ ගමන තුළ නිර්මාණය වනුයේ ගුණවත්, නැණවත් සංවේදී මිනිසෙකි. එසේ තමන් නිවැරැදිවූ කල ලෝකය ද නිසැකව ම නිවැරැදි වනු ඇත.



# සුගතියට මඟ කියන සත්පුරුෂ ඇසුර



අනුරාධපුර ලංකාරාමාධිකාරී උතුරු මධ්‍යම දිශාවේ ප්‍රධාන අධිකරණ සංඝ නායක,
**රැළපනාවේ ධම්මජෝති හිමි**

**සමාජය ගොඩනැඟී ඇත්තේ මිනිසුන්ගෙනි. මිනිසුන් නැති තැන සමාජයක් ද නැත. ඔවුහු විවිධ අදහස් උදහස් ඇති අය වෙති. හඳුනා ගැනීම අපහසු ය.**

කලක් ඇසුරු කළත් හඳුනා ගැනීම ඉතා ම අපහසු ය. සතා සිව්පාවා හඳුනා ගැනීම පහසුවුවත් මිනිසා හඳුනා ගැනීම ඉතාම අපහසු කරුණකි. බුදු දහමෙන් පෝෂණය ලැබූ සැදැහැවතාට මොහු මෙබඳු යැයි හඳුනා ගැනීම එ තරම් අසීරු කරුණක් නො වේ. හේතුව ඔහු දහම් අසන, දහම් සාකච්ඡා කරන, දහම් පොතපත කියවන, තුණුරුවන් නිබඳ ඇසුරු කරන කෙනෙකු වන බැවිනි.

බුදුරජාණන් වහන්සේ සත්පුරුෂ හා අසත්පුරුෂ වශයෙන් මිනිසුන් ඇති බව පෙන්වා දී ඇත. අංගුත්තර නිකායේ 'සත්පුරුෂ සූත්‍රයේ" බුදු හිමියෝ සත්පුරුෂයා හා අසත්පුරුෂයා කවරෙක්දැයි පෙන්වා දී ඇත. අසත්පුරුෂයාට, අසත්පුරුෂයකු දැක මොහු අසත්පුරුෂයෙකු යැයි කියා හඳුනාගත නො හැකි ය. සත්පුරුෂයෙකු දැක මොහු සත්පුරුෂයෙකු යැයි කියා ද හඳුනාගත නො හැකි ය. නමුත් සත්පුරුෂයාට අසත්පුරුෂයා හා සත්පුරුෂයා හඳුනාගත හැකි ය. හේතුව ඔහු සත්පුරුෂ හැම ගුණයකින් ම යුක්ත වූවකු වීම නිසයි.

යම් පුද්ගලයෙකු සත්පුරුෂ භාවයට පැමිණ ඇත්නම්, ඔහු පැමිණ ඇත්තේ අහම්බෙකින් නොව, ඔහු හැදුණ වැඩුණ යහපත් සමාජ පසුබිම මතයි. දැහැමි දෙමව්පියන්, දැහැමි ගුරුවරු, දැහැමි වැඩිහිටියන්, භික්ෂූන් වහන්සේලාගෙන් ලැබුණ පූර්වාදර්ශ, අවවාද අනුශාසනා නිසයි. ඔවුහු නිසි පන්සිල්, දස සිල්, දස කුසල් සිදු කරමින් තුනුරුවන් හැර අන් පිහිටක්, අන් සරණක් නැත. ජීවිතාන්තය දක්වා තුනුරුවන් සරණ යමි. යන පසුබිම මත පිහිටා කටයුතු කරන බැවින්, තමා අනුගාමිකයන් ද පවෙන් වැළකී පිනට නැඹුරු වී කටයුතු කිරීමට පුරුදු වෙති. එනිසා මේ දෙ පිරිස ම සත්පුරුෂ යාට සුදුසුකම් ලැබුවෝ වෙති. කල්‍යාණ මිත්‍රයෝ ද වෙති.

කළගුණ දැක්වීම සත්පුරුෂ ලක්ෂණයකි. බෝසතාණන් වහන්සේ බුදු පදවි ලබා ඇසතු වෘක්ෂයට අනිමිස ලෝචන පූජාව පැවැත්වීම සත්පුරුෂ ගුණය ඉස්මතු කර පෙන්වන අවස්ථාවකි. සත්පුරුෂයා ආත්මාර්ථකාමිත්වයෙන් මිදී පරාර්ථය සඳහා කටයුතු කරන කෙනෙකි. ඇළ, දොළ, ගංගා ජලයත්, ඵලින් බර වෘක්ෂලතාවෝත් අන්‍යයන්ට පිහිටවන්නේ යම් සේ ද, සත්පුරුෂයාත් එසේ පිහිට වෙති.

වරක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා කරුණු හතක් පෙන්වා දෙමින්, මහණෙනි, මේ කරුණු හත යමෙක් පිළිපදියි නම්, තව්තිසා දෙව්ලොව දෙවියන් ඔහු සත්පුරුෂයා වශයෙන් හඳුන්වන බවත්, එය හරියට පිළිපැදීමෙන් ශක්‍ර බවට ද පත්විය හැකි බවත් වදාළහ. ඒ කරුණු හත මෙසේ ය.

ජීවිතාන්තය දක්වා මව්පියන් පෝෂණය කිරීම, කුල දෙටුවන් පිදීම, මුදු මොළොක් වදනින් කතා කිරීම, කේළම් නො කීම, මසුරුකම දුරලා පරිත්‍යාගශීලීව දන්දීමේ නිරත වීම, හැම විටම සත්‍ය වචන කීම, ක්‍රෝධ නො කර සිටීම වශයෙනි.

තවත් දිනක දේවතාවෝ හය දෙනෙක් බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පැමිණිහ. මේ හය දෙනා සත්පුරුෂයා ඇසුරු කිරීමේ තමන් වෙත ම දරන කරුණු හයක් බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කළහ. මේ කරුණු හයෙන් කාගේ කියමන ද වඩා හොඳ කියා විසීය. එම කරුණු හය නම් දියුණුවක් මිස පිරිහීමක් නොවේ, නුවණ ලැබේ, ශෝකයට හේතුවන කාරණා මැද ශෝක නො කෙරේ, ඥාති මැද බැබළේ, බොහෝ කල් සුවසේ වෙසේ, සුගතියට යයි.

බුදුරජාණන් වහන්සේ ඒ කරුණු හයම හොඳ බවත්, සත්පුරුෂයින් ඇසුරු කිරීමෙන් සියලු දුකෙන් මිදීමට හේතු වන බවත්, වදාළහ. ධනයෙන්, බලයෙන්, තරුණකමෙන්, ශක්තියෙන් සත්පුරුෂයා මත් වී කිසිද කටයුතු නො කරයි. එය සමාජ යහ පැවැත්ම සඳහා යොදවමින් කටයුතු කරයි. සම්බුද්ධ ශාසනය සම්පූර්ණයෙන් රඳා පවතින්නේ සත්පුරුෂයින් නිසා යැයි වරක් බුදුහිමි දේශනා කළහ. සත්පුරුෂයා ඒ තරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් බව උන්වහන්සේගේ ගෞරවයටත්, පැසසුමටත් පාත්‍ර වී ඇත.

සමාජයේ සත්පුරුෂයින් මෙන් අසත්පුරුෂයන් ද සිටිති. ඔහු ජීවත් වන සමාජය වටපිටාව අයහපත් බැවින්, ඔවුන්ගේ ජීවිත ද අයහපත් ය. අභාග්‍ය සම්පන්න ය. ඔවුහු මිථ්‍යා දෘෂ්ටික වේ. පින් පව් විශ්වාස නො කරති. කර්මය, කර්ම ඵලය විශ්වාස නො කරති. තුණුරුවන් විශ්වාස නො කරති. එනිසා ඔහු අශ්‍රද්ධාවන්ත පුද්ගලයෙකි. පස් පව්, දස අකුසල් කරති. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුකුච්ච, විචිකිච්ඡා පංචනීවරණ ධර්මයන්ගේ කිලිටි වී ඇත. ගුරු දෙගුරු, වැඩිහිටියන් නො සලකමින් ජීවත් වෙති. ඔහු ඇසුරු කරන්නෝ ද එබන්දෝ බැවින්, ඔවුහු ද අසත්පුරුෂයෝ ම ය.


මෙබදු පුද්ගලයින්ට කොතෙක් උපකාර කළත් ගුණ නො හඳුනයි. උපකාර කළ පුද්ගලයා දෝෂ දර්ශනයට ලක් කරයි. කන්න දුන් අත සපා කන්නේ, සෙවණ ලබාදුන්නු ගස්වල අතු, ඉති කපා දමන්නේ මෙබඳු අසත්පුරුෂ ලක්ෂණ ඇත්තෝ ම ය.

නයි, පොළඟුන්ගේ විෂ දළ අගත්, මැසි මදුරුවන්ගේ විෂ තුඩ ගත්, ගෝනුසුන්ගේ විෂ වලිගයෙත් ඇත. නපුරු දුදනන්ගේ විෂ සිරුර පුරාම ඇත. දෂ්ඨ කළොත් බෙහෙත් හේත් හොයා ගැනීම අපහසු ය. එනිසා අසත්පුරුෂ ඇසුරෙන් වැළකී සිටීමට හැම විට උත්සහ ගත යුතුව ඇත. බුදු, පසේ බුදු මහරහත් උත්තමයන් වහන්සේලා ඔබෙත්, අපෙත් උතුම් සත්පුරුෂයින් වහන්සේලා ම ය. මේ ලෝකය "දුක මත" පිහිටා ඇති බවත්, ඒ දුකෙන් අත මිදීමට නම්, සියලු පාපයන්ගෙන් අත මිදී පින් දහම් කරගත යුතු බවත්, ශීල, සමාධි, භාවනාවන්ගෙන් සිත පිරිසුදු කරගෙන නිවන පසක් කරගත යුතු බව පෙන්වා වදාළ බැවින්, මේ උතුමන් ඔබෙත්, අපෙත් උතුම් සත්පුරුෂයින් වහන්සේලා ම ය.

තුණුරුවන් අදහන වඳින පුදන අප හැමගේ එකම ප්‍රාර්ථනාව මේ පුණ්‍ය මහිමයෙන් නිවන් දක්නා තුරු අසත්පුරුෂ බාලයන් ඇසුරු කරන්න නො ලැබේවා. සත්පුරුෂ, පණ්ඩිතයින් ඇසුරු කරන්න ලැබේවා. නිවන් පිණිස ද හේතු වාසනා වේවා යනුයි.

**මුදලට වහල් වූ වර්තමාන සමාජයේ පමණක් නොව එදා ඈත අතීතයේත් වංචාවෙන් අනුන් රවටා ජීවත් වූ පුද්ගලයන් සිටියා. මිනිසුන් අතර පමණක් නොව තිරිසන් සතුන් අතරත් මේ නරක ගතිය ඇති සතුන් සිටිනවා.**

# වංචාවෙන් පැරදුණු බක තාපසයා



මෙසේ වංචනිකත්වයෙන් රැවටීමෙන් තමාගේ ජීවන රටාව සකසා ගත් භික්ෂූණ් වහන්සේලා දෙනමක් අපගේ තථාගත අමාමෑණී බුදු පියාණන් වහන්සේ වැඩ සිටි කාලයෙත් හිටියා.

භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටියේ සැවැත් නුවර ජේතවනාරාමයේ. මේ කාලයේම මෙහි වාසය කළ එක් භික්ෂූන් වහන්සේ නමක් සිවුරු කඩ කැපීමෙහි, ඒවා එකට සම්බන්ධ කිරීම් ආදී ගෙත්තම් කිරීමේ දක්ෂව කටයුතු කළා. එනිසා ම උන් වහන්සේට 'චීවරවඩ්ඪකී (සිවුරු මහණ භික්ෂුව)' යන නම පට බැඳුණා. දිරා ගිය රෙදි කෑබැලි ගෙනත් පිළිසකර කර ගෙත්තම් ආදියෙන් හැඩ ගන්වා තැබුවා. ආරාමයේ සිටි අනෙක් භික්ෂූණ් වහන්සේලා සිවුරු මහන්න දන්නේ නැති නිසා,

"අවැත්නි, අපිටත් මේ අලුත් වස්ත්‍රගෙන සිවුරක් කර දෙන්න පුළුවන්ද?"

"ඔව් පුළුවන් හැබැයි, එහෙම එක වර සිවුරක් මසා නිම කරන්න බැහැ. ඒකට ලොකු කාලයක් යනවා."

"ඒකට කමක් නැහැ. අපටත් මෙවැනි ගෙත්තම් කළ සිවුරු මසා දෙන්න."

"ඇවැත්නි, ඔය අලුත් වස්ත්‍ර මට දෙන්න. මං මහලා තියෙන මේ අගනා සිවුරු ඔබ වහන්සේලා කැමති නම් ගන්න." කියා චීවර වඩ්ඪකී භික්ෂුව කියා සිටියා.

මේ විදියට බොහෝ භික්ෂූන් වහන්සේලා දිරා ගිය වස්ත්‍ර රැගෙන යන්නට වුණා. ඒ නිසාම උන් වහන්සේගේ සිතත් වංචාවෙන් කපටිකමෙන් තව තවත් පිරෙන්න වුණා. තමාගෙන් සිවුරු ඉල්ලාගෙන එන ජේතවන භික්ෂූන් වහන්සේලාගෙන් අලුත් වස්ත්‍ර අරගෙන රවටා දිරා ගිය රෙදි කඩවලින් සැකසූ සිවුරු දුන්නා.

ඒ ස්වාමීන් වහන්සේලා ටික දවසක් ඒ සිවුරු පෙරවූ පසු කිලිටි වෙනවා. පසුව උණු පැනින් සෝදා පිරිසුදු කරනවා. එතකොට දකිනවා ඒ සිවුරුවල දිරා ගිය තැන්.

පසුව වංචනික භික්ෂුවගේ රැවටීමට හසු වුණා කියා හැමෝම සිත් තැවුලට පත්වුණා.

මේ විදියට ම වංචාවෙන් කටයුතු කරන තවත් භික්ෂුවක් ඈත පිටිසර ගමක හිටියා. උන්වහන්සේට මේ පුවත සැල වුණා. කල්පනා කළා. ජේතවනාරාමයේ සිටින ඒ කපටි භික්ෂුව කොහොම හරි රවටන්නට ඕනෙයි කියලා.

උන් වහන්සේ දිරා යන පරණ රෙදි කඩ කිහිපයක් ගෙන සිවුරක් කරලා පඬු පොවලා ඉතා මනරම් සිවුරක් ලෙස සුදානම් කර ගත්තා. ජේතවනාරාමයට පැමිණි මේ පිටිසර භික්ෂුව එහි චීවරවඩ්ඪකී භික්ෂුව සොයා ගියා. කතා බහේ යෙදී සිටිමින්ම පිටිසර භික්ෂුව ගෙනා සිවුර දැක සිත් අලවා

"ඇවැත්නි, ඔබ අතින්ම ද මේ චීවරය නිම වූයේ"

"එසේය. ඇවැත්නි"


"එහෙනම් මට මෙය දෙන්න"

"මේ සිවුර බොහොම මහන්සියෙන් කළේ. ඒ නිසාම ගොඩාක් වටිනවා."

"ඇවැත්නි, මා ළඟ මේ තිබෙන අලුත්ම වස්ත්‍ර ගෙන එයින් ඔබ සිවුරක් කර ගන්න. ඔය සිවුර මට දෙන්න"

චීවරවඩ්ඪකී භික්ෂුව රැවටුණු බව දැන ගත් පිටිසර භික්ෂුව එම සිවුරෙදී අලුත් වස්ත්‍ර රැගෙන තම ගමට ගියා. ජේතවනේ සිටිය භික්ෂුව එය ටික දිනක් පොරවා කිලිටි වූ පසුව උණුදියෙන් සෝදා බලද්දී දිරූ රෙදිවලින් සැකසූ එකක් බවත්, තමන් අනුන් රැවටූ ලෙසට ම පිටිසර භික්ෂුව තමන්වත් රවටා ඇති බවත් පැහැදිලි වුණා. එයින් උන් වහන්සේ ගොඩාක් ලැජ්ජාවට පත් වුණා.

ජේතවනාරාමයේ සිටි අනෙක් භික්ෂූන් ද මේ බව දැනදිනක් දම් සභා මණ්ඩපයේ කපටි වංචාකාර භික්ෂූන් දෙනමගේ ක්‍රියා කාරකම් ගැන කතා කරමින් සිටියා. එතැනට භාග්‍යවත් තථාගතයන් වහන්සේ වැඩම කළ පසු භික්ෂූන් ඒ පුවත කිව්වා.



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

"මහණෙනි, ඔය භික්ෂූන් දෙනම පෙර ආත්මෙකත් එකිනෙකා වංචා කර ගත්තා." කියමින් දම් සභාවෙන් කළ ආරාධනාවට අනුව බුදු රජාණන් වහන්සේ පෙර අතීත කතාව වදාළා.

"පින්වත් මහණෙනි, ගොඩාක් ඉස්සර කාලෙක වනාන්තර ප්‍රදේශයක පියුම් විලක් අසල විශාල ලුණුවරණ ගසක් තිබුණා. මෙහි රුක් දෙවියෙක් වෙලා අප මහා බෝසතාණන් වහන්සේ උපන්නා. මේ ආසන්නයේ වානාන්තරය ඇතුළට වෙන්න තවත් පොඩි පොඩි මාළු ගොඩාක් ඉන්න කුඩා විලක් තිබුණා. මේ කුඩා විලේ නියං කාලයට වතුර සිඳෙනවා. ඉතින් ඔහොම නියං කාලයක් පැමිණ වතුරත් සිඳීගෙන යන වේලාවක, එක් කොකෙක් ඒ මාළු දැකලා "උපායකින් මුන් රවටා ගෙන ගොස් මස් කන්නට උවමනයි"

සිතා විල ළඟට පැමිණියා. බොහෝම ශාන්ත ලීලාවෙන් විල් කෙළවරට වී එක් සිතිවිල්ලක ඉන්නා ලෙස හිටියා. විලේ මාළු ඔහු දැක්කා.

"ස්වාමීනි, මොනවද ඔය හැටි කල්පනා කරන්නේ" කියලා ඇහුවා.

"මේ ඔබ සියලු දෙනාට සිද්ධ වෙලා තිබෙන විපත ගැනයි කල්පනා කරමින් ඉන්නේ"

"මාළු යහළුවෙනි, දැන් නියං සමය උදා වෙලා තියෙන්නේ. මේ විලේ දිය සිඳීගෙන යනවා. ඔබලාගේ ආහාරත් ඉවරවෙලා යනවා. ඒ නිසා වෙන්නේ ලොකුම දුකක්. ඒ ගැනයි මං මේ කල්පනා කර කර ඉන්නේ."

"අනේ! එතකොට අපි දැන් මොකද කරන්නේ."

"යහළුවනේ, ඔබ මගේ වචනයේ පිහිටන්නේ නම් පස් පියුමින් සැදී විශාල විලකට ඔබ සියලු දෙනා මමගේ මේ තුඩෙන් ගෙන ගොස් දමන්නට පුළුවන්."

"එදා මෙදා තුර කිසිම කොකෙක් අපට හිත පිණිස කතා කරලා නැහැ. ඒ නිසා අපට ඔබ ගැන කිසිදු විශ්වාසයක් නැහැ. මේකත් අප අල්ලාගෙන කන්නට යෙදූ උපායක් කියලයි අප හිතන්නේ"

කොකා එවිට කියනුයේ,

"යහළුවනේ, මගේ බස විශ්වාස නොමැති නම් එක මාළුවකු මා සමඟ එවන්න විල බලන්ට ඔහු ආපසු ගෙනවිත් දමන්නම්"

පසුව මාළුන් කතිකා කරගෙන කොකාගේ කතාව විශ්වාස කරලා දියෙත්, ගොඩත් දක්ෂ එක් ඇසක් නොපෙනෙන මාළුවෙකු කොකා සමඟ යන්නට සූදානම් කළා. කොකාත් ඌ තුඩින් ගෙන මහා විල වටා ගෙන ගොස් විලේ හැම තැනම පෙන්නුවා. නැවතත් හිටපු විලටම ගෙනවිත් දැම්මා.

"විශාල ලාභයක් පතා කුඩා දෙයක් අත්හරින එක සිරිතක් යැයි කොකාත් සිතමින් ලැබෙන ප්‍රතිචාරය බලාපොරොත්තුව සිටියා."

කණ මාළුවාගේ විස්තර ඇසූ අනෙක් මාළුන් පොරකමින් ගමනට පෙළ ගැසුණා. ඒ වගේම පළමුවෙන් යන්නෙත් මං කියලා කණ මළුවා ම ඉස්සරහට පැන්නා. කොකාගේ වාරය පැමිණි බැවින් හද පිරී සතුටින් ඒ මාළු එකිනෙකා අරගෙන ගිහින් මහා විල පෙන්නලා අර ලුණුවරණ ගහේ තියාගෙන මස් කාලා කටු ටික ගස යට දැම්මා. අවසානයේ ඉතුරු වුණේ එක කකුළුවෙක් පමණයි. කොකාට කකුළු මසුත් කන්නට ආස හිතුණා.

"පින්වත් කකුළුව... මේ විලේ මාළුන් හැමෝම පස් පියුමින් සැදි විලට දැම්ම නිසා දැන් එයාලා හරිම සතුටින් සෙල්ලම් කරමින් ඉන්නවා. ඔබ ඇයි ඔහොම ඉන්නේ. එන්න. මං ඔබවත් ඒ විලට දමන්නම්"

හොඳයි කොක් යහළුව, ඔබ මාව ගෙන යන්නේ කොහොම ද?"

"ඇයි.. මට ඔබව තුඩින් ඩැහැගෙන යන්න පුළුවන්නේ"

"අපෝ එහෙම බැහැ. අතරමගදී මාව අත්හැරියොත්... ඒ නිසා මට ඔබ සමඟ යන්න බැහැ."

"බය වෙන්න උවමනා නැහැ. මං හොඳට අල්ලගෙන යන්නම්."

එවිට කකුළුවා කල්පනා කළා "මේ කොකා විලේ සිටි සියලුම මාළුන් කෑවා. දැන් මාවත් කන්න තමයි මේ උපාය. ඒ නිසා විලට දැම්මොත් හොඳයි. නැත්නම් මොහුගේ ගෙල සිඳලමියි" කියලා.

"කොකාණෙනි... මට ඔබේ ගෙල අල්ලගෙන යන්නට දෙන්නේ නම් මං විලට යන්නට කැමතියි" කකුළුවා කිව්වා. එහෙත් කකුළුවා තමාව රවටන බව කොකාට තේරුණේ නැහැ. කකුළුවා ගමනට සූදානම් වුණා. තදින් කොකාගේ බෙල්ල තම අඬු වැනි අත් දෙකෙන් තද කොට අල්ලා ගත්තා. දැන් ගමන පිටත් වෙලා මහා විල වටේ ගිහින් ලුණුවරණ ගස පැත්තට යන්නට හැරුණා. කකුළුවා විමසුවත් යන දිශාව වෙනස් කළේ ඇයි කියලා. කොකා විස්තර කියන්නේ, "ඔබ මගේ නෑයෙක් ද? එහෙම විලට දාන්න. මේ යන්නේ ඔබගේ මස් කා දමන්න" යි කීවා. ඒ මාළුන් සියල්ලන්ම නුවණ මඳ නිසා එසේ විනාශ වූ නමුත් මා රැවටෙන්නේ නැතැයි කියා තම ශක්තිමත් අඬු දෙකෙන් අල්වා කතුරකින් පියුම් දණ්ඩක් කපන්නාක් මෙන් කොකාගේ ගෙල සිඳ දැමුවා. කොකාගේ මුවින් ගිලිහුනු කකුළුවා මහා විලට වැටුණා.

ලුණුවරණ ගසේ සිටි දේවතාවා සාධුකාර දී වනය නින්නාද වන ලෙස මිහිරි කට හඬින් මෙහෙම කීවා. "මේ ලෝකයෙහි අතිශයින් ම වංචා බුද්ධි ඇති තැනැත්තෝ හැම තැනම ඒ වංචාවෙන් ජීවත් වන්නට සමත් නොවෙයි. එක් තැනක හෝ දෙතැනක වංචාවෙන් ජය ගනියි. හැම කල්හිම ජය නොලබයි. තමා විසින් තමාට ම අවැඩ කර ගත්තේ වෙයි. කැමැති දෙයම නොලබන්නේ ය. කුමක් මෙන් ද යත් කකුළුවාගෙන් ගෙල සිඳලූ කොකා මෙනි." යනුවෙන් අර්ථ ප්‍රකාශ කොට බෝධිසත්වයෝ වනය නින්නාද වන ලෙස දහම් දේශනා කළා.

# දබ්බ මල්ලපුත්තතිස්ස

## මහරහතන් වහන්සේ

**කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ බුදු සසුන බොහෝ කාලයක් දෙව් මිනිසුන්ට අසිරිමත් යුගයක් වුණා. කාශ්‍යප බුදුරදුන් පිරිනිවී ගොස් ඒ බුදු සසුන පිරිහී යාමට ආසන්න කාලයක දී එක් කුල පුත්‍රයෙක් සසුනේ පැවිදි වුණා. ඔහුත් සමඟ තවත් හය දෙනෙක් එකම සිතින් ඔහු හා පැවිදි වුණා.**

ඒ බුද්ධ ශාසනයේ පැවිදි වී සිටි තවත් භික්ෂූන් පිරිසක්, සසුනට අවැඩදායක ලෙස සමහර කටයුතු කරනවා දුටු ඒ සත් තෙරුන් වහන්සේ "තවත් මෙහි වැඩ සිටින්නේ කුමට ද? අපි ඒකාන්තයෙන් ම මේ මහණදම් පූර්ණ කොට දුක කෙළවර කරමුයි" කතිකා කරගෙන හිණිමගක් බඳවා ඉතා උස් වූ පර්වතයක් මුදුනට නැංගා.

"ජීවත්වීමට කැමැති අය බසිත්වා! පසු නො තැවී අප්‍රමාදි වන්නෝ සිටිත්වා!"

තෙරුන් වහන්සේ නමක් වදාළා. ඉන්පසු සියලුදෙනා ම කතිකා කොට පර්වතයට නැඟ හිණිමඟ පර්වතෙයන් බිමට තල්ලු කළා. පසුව ඒ භික්ෂූන් වහන්සේ තමන්ට කැමැති කැමැති තැන්හි අසුන් ගෙන මහණකම පරිපූර්ණ කර ගැනීමට පටන් ගත්තා. ඒ සත් භික්ෂූන් වහන්සේගෙන් එක් නමක් දින පහකින් රහත් භාවයට පත්වුණා.

උන්වහන්සේ වදාළේ "මාගේ කාර්ය ඉටුවුණා. මම දැන් සෘද්ධියෙන් උතුරුකුරු දිවයිනට ගොස් ඔබ වහන්සේලාට පිණ්ඩපාතය රැගෙන එන්නම්" කියා. එවිට අනෙක් තෙරුන් වහන්සේලා වදාළේ " පින්වත් ඇවැත්නි, අප හිණිමඟ පහතට දමනවිට කතාකර ගත්තේ නැහැ නේද යමෙක් පළමුව ධර්මය ශාක්ෂාත් කර ගනියි ද, උන්වහන්සේ අනෙක් පිරිසට පිණ්ඩපාතය රැගෙන ආ යුතුයි කියලා"

එවිට රහත් වූ තෙරුන් වහන්සේ වදාළේ "ස්වාමිනි, අප එවැනි එකඟතාවයකට පැමිණියේ නැහැ" කියලයි.

එසේනම් ස්වාමිනි, ඔබ වහන්සේ පෙර පින් බලයෙන් ඉක්මනට රහත්ඵලයට පත්වුණා. අපි ද කෙසේ හෝ උත්සාහ කර සසර දුකෙන් මිදෙන්නමු. ඔබ වහන්සේට දැන් අප අතහැර යෑමට අවසර තිබෙනවා" කියා අනෙක් සය නම වදාළා. රහතන් වහන්සේ පර්වතයෙන් එපිටට වැඩම කළා.

> "එසේනම් ස්වාමිනි, ඔබ වහන්සේ පෙර පින් බලයෙන් ඉක්මනට රහත් ඵලයට පත්වුණා. අපි ද කෙසේ හෝ උත්සාහ කර සසර දුකෙන් මිදෙන්නෙමු. ඔබ වහන්සේට දැන් අප අතහැර යෑමට අවසර තිබෙනවා"

සත්වන දිනයේ දී තවත් එක් නමක් අනාගාමි ඵලයට පත් ව මිනිස් ලොවින් චුත ව, බඹලොව ඉපදුණා. ඉතිරි තෙරුන් වහන්සේ පස් නම කිසිදු මාර්ගඵලයක් නො ලබා මරණයට පත් ව දෙව්, මිනිස් සුගති ලෝකවල ඉපිද පින්දහම් කළා.

අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ බුදු සසුන බබළවන කාලයේ මේ පස්දෙනා නැවත මිනිස් ලොව ඉපදුණා. එක් අයෙක් ගන්ධාර රටේ තක්සිලා නුවර රජතුමාට දව ද, තව අයෙක් බාහිය රටේ සිටු පවුලක ද, තව අයෙක් රජගහනුවර සිටු පවුලක ද, උපන්නා. හතරවැන්නා මජ්ඣන්තික රටේ පරිබ්‍රාජිකාවකගේ කුසේ උපන්නා. පස්වැන්න අනුපිය නුවර එක් මල්ල රජ කෙනෙකුගේ බිසවගේ කුසේ පිළිසිඳ ගත්තා. ඒ මව දරු ප්‍රසූතිය ළං වූ අවස්ථාවේ දී කළුරිය කළා. මළ සිරුර සොහොනට ගෙනගොස් දර සෑයට දමා ගිනි තැබුවා. කුස තුළ සිටි දරුවාගේ පුණ්‍ය බලයෙන් උඩට විසි වී තණ පඳුරක් මතට වැටුණා. සොහොනේ සිටි පිරිස ඒ බව දැක දරුවා ගෙන ගොස් දරුවාගේ මිත්තනියට හදවඩා ගැනීමට දුන්නා. තණ පඳුරට වැටී දිවි බේරුණ බැවින් දරුවාට "දබ්බ" යන නම තැබුවා.

දබ්බ කුමරුට සත් අවුරුදු කාලයේ දී අපගේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ පිරිවරාගෙන මල්ල රටේ චාරිකාවේ හැසිරෙමින් වැඩ අනුපිය අඹ වනයේ විසූ සේක. දබ්බ කුමරු බුදුරජාණන් වහන්සේ දුටු පමණින් පැහැදී පැවිදිවනු කැමැති "මම දසබලයන් වහන්සේගේ ශාසනයේ පැවිදි වන්න ද?" කියා මිත්තනියගෙන් විමසුවා. ඊට කැමැති වූ මිත්තනිය කුමරු ශාස්තෘන් වහන්සේ අසලට රැගෙන ගොස් "ස්වාමිනි, මේ මගේ මුණුපුරා පැවිදි කළ මැනව යි" කීවා. ශාස්තෘන් වහන්සේ එක් භික්ෂූන් වහන්සේ නමක් අමතා " පින්වත් භික්ෂුව, මේ දරුවා පැවිදි කරන්න" යැයි වදාළා. ඒ තෙරුන් වහන්සේ ශාස්තෘන් වහන්සේගේ වචනයට අනුව කුමරු පැවිදි කිරීමට පළමු කෙස් වැටිය කපද්දීම පෙර පින් ඇති, කරන ලද ප්‍රාර්ථනා ඇති, තව පංචක කමටහන වැඩූ ඒ කුමරු සෝවාන් ඵලයට පත්වුණා. දෙවැනි කෙස් වැටිය කපද්දී සකෘදාගාමි ඵලයෙහි ද, තෙවැනි කෙස් වැටිය කපද්දී අනාගාමි ඵලයෙහි ද පිහිටි ඒ කුමරුට සියලු කෙස් ගා දමද්දී රහත් බවට පත්වීම පෙර පසු නොවී එකට ම සිදුවුණා.

ශාස්තෘන් වහන්සේ මල්ල රටේ වැඩ සිට නැවත රජගහ නුවරට වැඩමවා වේළුවනාරාමයේ වැඩ සිටි සේක. එක් දිනක් ආයුෂ්මත් දබ්බ මල්ලපුත්‍ර තෙරුණුවෝ "මට විවේක තිබෙන අවස්ථාවක මම සංඝයා උදෙසා වතාවත් කිරීමට කැමැත්තෙමි. සංඝයා වහන්සේට සෙනසුන් පැනවීම කරන්නෙමි" සිතා භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඒ බව දන්වා සිටියා. එවිට භාග්‍යවතුන් වහන්සේ සාධුකර දී එය අනුමත කොට "මේ දබ්බ ළදරු වයසේ සිටිය ද මහත් වූ ඥාණවන්තයෙක්" යි සිතා එදින ම උපසම්පදාව ද සිදු කළා. උන්වහන්සේ රජගහනුවර වසන සියලු භික්ෂූන් වහන්සේලාට සේනාසන පනවන සේක! සඟ බත නියම කරන සේක! සේනාසන පනවන සේක! කියා සෑම දිසාවක ම ප්‍රකට වුණා. දබ්බ මල්ලපුත්ත තෙරණුවෝ සමාන අදහස් ඇති භික්ෂූන් වහන්සේට එකතැන අසුන් පනවනවා. සමීපව ද, දුරින් ද සෙනසුන් පනවනවා. ඇවිදීමට අපහසු භික්ෂූන් වහන්සේ සෘද්ධියෙන් රැගෙන යනවා. කල්යත්ම භික්ෂූන් වහන්සේලා "ඇවැත්නි අපට ජීවක අඹ වනයේ අසුන් පනවන්න. අපට මද්දකුච්ඡි නම් වූ මිගදායේ අසුන් පනවන්න' ආදී වශයෙන් සෙනසුන් නියම කරවාගෙන උන්වහන්සේගේ සෘද්ධිය දකින්නට කැමැති වෙනවා.

උන්වහන්සේ සෘද්ධියෙන් මනෝමය කයක් මවා එක් එක් තෙරුන් වහන්සේට තමා සමාන වූ ම භික්ෂුව බැගින් දී ඇඟිල්ල දැල්වෙන එළියෙන් ඔවුනට පෙරටුව ගොස් "මේ ඇඳකි. මේ පුටුවකි" ආදී වශයෙන් පවසා සෙනසුන් පනවා දී නැවත තමන් වහන්සේ වැඩ වසන ස්ථානයට පැමිණෙයි. පසුකලෙක මේ තෙරුන් වහන්සේගේ අසහාය හැකියාව දුටු භාග්‍යවතුන් වහන්සේ ආර්යන් වහන්සේලා මැද සිටි දබ්බ මල්ල තෙරුන් සෙනසුන් පනවන භික්ෂූන් අතර අගතනතුරෙහි තැබූ සේක. " මහණෙනි, මගේ ශ්‍රාවක වූ සෙනසුන් පනවන භික්ෂූන් අතරින් මේ දබ්බමල්ල පුත්‍ර තෙරණුවෝ ම අග්‍ර වෙති" වදාළා.


"දබ්බ තෙරුන් වහන්සේ තමන්ගේ සසර ගැන මෙසේ වදාළා. කාශ්‍යප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශාසනයේ මම පැවිදි වී සිටියා.

එක් දිනක් ඒ බුදුරජාණන් වහන්සේ පිනිරිනිවන් පා වදාළා. දහම් ඇස නිවුණා. පිළිවෙත් පුරන ශ්‍රාවකයන් අඩුවුණා. සසුන පිරිහෙන කරුණු දැක සංවේගයට පත් වූ භික්ෂූන් සත් නමක් වූ අප මෙසේ සිතුවා.

සසුනෙන් තොර වූ අපගේ ජීවිතයෙන් කවර ප්‍රයෝජනයක් ද? අපි මහ වනයට පිවිස බුදු සසුනෙහි යෙදෙන්නෙමු. කතිකාකොට මහ වනයේ උස් වූ පර්වතයකට හිණිමගක් බැඳ නැංගා. අසුව ඒ හිණිමඟ බිමට තල්ලු කළා. බුද්ධෝත්පාදය ඉතා දුර්ලභයි. දුර්ලභ වූ ශ්‍රද්ධාව ලබන ලද අපට බුදු සසුන ද මඳ වශයෙන් හෝ ඉතිරි කාලයේ මුණ ගැසුණා. මේ උතුම් මොහොත ඉක්මවා ගියත් අනන්ත වූ දුක් සයුරෙහි ගිලීමට සිදුවේ. එනිසා බුදු සසුන පවතින මොහොතෙහි ඉන් ප්‍රයෝජන ගත යුතුයි කියා අප අපට ම අවවාද කර ගත්තා. ඒ තෙරුණුවෝ නො පමාව රහත් වුණා.

ඒ අනුව ගිය දෙවැන්නා අනාගාමි වූ අතර, ඔවුන් හා එක්ව සිටි සිල්වත් වූ අප දෙව්ලොව ඉපදුණා. අනාගාමි වූ භික්ෂුව සුද්ධාවාසයේ දීම හුදකලාව පිරිනිවී ගියා. මම ද, පුක්කුසාති ද, සභිය ද, බාහිය ද, කුමාරකස්සප ද මේ සසුනේ ගෞතම බුදුරජාණන් වහන්සේගේ අනුකම්පාව ලබා සසර බැඳුමෙන් මිදුණා.

නයනා නිල්මිණී







## පිරිවෙනටත් බුදුසරණ

අප රටේ පුරාතන සම්භාව්‍ය අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන මුල්කරගෙන එහි සුවිශේෂී අනන්‍යතාව මේ යැයි විදහා දක්වමින් දිගහැරෙන "පිරිවෙන" පිටුව සතිපතා බුදුසරණ පුවත්පත තුළ ඉදිරිපත් කෙරෙයි. ඒ අනුව ලංකාවේ 829 ක්වූ පිරිවෙන් හා සීලමාතා අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු පුවත් හා පිරිවෙන් අධ්‍යාපනය හා අදාළ සුවිශේෂී ලිපි සඳහා මෙම පිටුව වෙන් කෙරෙන අතර සියලු ලිපි, තොරතුරු හා ඡායාරූප සඳහා මෙම පිටුව වෙන් වෙයි.

**පිරිවෙන්වලට අදාළ පුවත්, ඡායාරූප සහ ලිපි අප වෙත යොමු කරන්න.**
budusarana@lakehouse.lk
**බුදුසරණ කර්තෘ මණ්ඩලය , ලේක්හවුස්, කොළඹ**



ජාතික පිරිවෙන් උපදේශක
ශාස්ත්‍රපති
**දෙඩම්පහළ**
**ශ්‍රී රාහුල හිමි**

## පාත්‍රය භාවිත කිරීම අත්‍යවශ්‍යයි

පිණ්ඩපාතය යන වචනය බෞද්ධ සාහිත්‍යයෙහි බොහෝ තැන්හි සඳහන් වන්නේ කුමක් නිසා ද? සත්‍ය වශයෙන් ම එය භික්ෂු ආකල්පයක් වන බැවිනි. වර්තමාන ශාසනෝන්නතියේ ආදී කර්තෘවරයාණන් වහන්සේ වූ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝ රාජයාණන් වහන්සේගේ නාමයට මුලින් පිණ්ඩපාතික යන වචනය යෙදී ඇත.

නූතන භික්ෂු සමාජයේ පිණ්ඩපාත කිරීම නැති බැරි භික්ෂූන් වහන්සේට පමණක් බාරවූ චාරිත්‍රයක් සේ ය. නායකත්වය දරන භික්ෂූන් වහන්සේ පිඬු සිඟා යතොත් එය ඉතාම හදිසි සිදුවීමකි.

පාත්‍රය ගෙනයාම හෝ පාත්‍රයෙහි වැළ දීම ආරණ්‍යක භික්ෂූන් වහන්සේට පමණක් වෙන් කිරීමට ඇතැම් ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේ උත්සාහ කරති. එබැවින් සියලු පිරිවෙන්වල ශිෂ්‍ය සහ ගුරු ස්වාමීන් වහන්සේ පාත්‍රය භාවිත කිරීම අත්‍යවශ්‍ය අංගයක් සේ සැලකිය යුතු ය.






**ජාතික ඵලදායිතා වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පසුගිය ද අධ්‍යාපන අමාත්‍යංශ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි. අධ්‍යාපන ලේකම් තුමා , ජාතික පිරිවෙන් උපදේශක දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි , පිරිවෙන් අධ්‍යක්ෂ වටිනාපහ සෝමානන්ද හිමි , සහකාර පිරිවෙන් අධ්‍යක්ෂ ( අධ්‍යාපන සංවර්ධන) කන්තලේ විජිතවංස හිමි ඇතුළු ලංකාවේ සියලු පිරිවෙන් අධ්‍යක්ෂ හිමිවරුන්, සම්බන්ධීකරණ හිමිවරුන්, විෂය අධ්‍යක්ෂවරුන් මෙන් ම ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ මහත්වරු ද මේ සඳහා සහභාගි වූහ.**

# පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ යෝජනාවලියක් ජනපතිතුමන් වෙත...

**පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ පස් අවුරුදු යෝජනාවලියක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් වෙත පසුගිය ද පිළිගැන්වී ය. දිවයිනේ සියලුම මහානායක සවාමීන්ද්‍රයන් වහන්සේලා , සියලු පිරිවෙන්වල කෘත්‍යාධිකාරි හා පරිවෙණාධිපති හා පරිවෙණාචාර්ය හිමිවරුන්ගේ සහ සීලමාතා අධ්‍යාපන ආයතන ප්‍රධානීන් හා පරිවේණාචාර්ය ගිහි භවතුන් ඇතුළු මේ සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වූ ගිහි පැවිදි විද්වතුන්ගේ අදහස් ද සැලකිල්ලට ගෙන යෝජනාවලිය සකස් කෙරිණි.**

මානව හා භෞතික සම්පත් සංවර්ධනය කරමින් සාම්ප්‍රදායික අධ්‍යාපනයත් මැනවින් රැකගනිමින් නූතන තාක්ෂණය ද භාවිතයට ගනමින් පිරිවෙන් අධ්‍යාපනය පවත්වාගෙනයාම කෙරෙහි මෙම යෝජනාවලියේ විශේෂ අවධානයක් යොමුකර ඇත.

ජාතික පිරිවෙන් උපදේශක දෙඩම්පහළ ශ්‍රී රාහුල හිමි පිරිවෙන් අධ්‍යක්ෂ වටිනාපහ සෝමානන්ද හිමි ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් ද සැලකිල්ලට ගෙන සහකාර පිරිවෙන් අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන) කන්තලේ විජිතවංශ හිමියන් විසින් මෙම යෝජනාවලිය සකස්කරන ලදී.

## මේ වසරේ පිරිවෙන් තරග නොපැවැත්වේ

පිරිවෙන් අධ්‍යාපනය ලබන ගිහි පැවිදි සිසුන්ගේ නිර්මාණශීලි හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව පවත්වනු ලබන සමස්ත ලංකා අන්තර් පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරග මෙම වසරේ නොපැවැත්වීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකය තීරණය කොට තිබේ. සෑම වසරකම මෙම තරග දිස්ත්‍රික් මට්ටමින් පවත්වා ඉන් ජයග්‍රහණය කරන අය සමස්ත ලංකා පාරිවේණික තරග සඳහා ඉදිරිපත් කරයි. දිස්ත්‍රික් හා සමස්ත ලංකා ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීම මෙතෙක් වාර්ෂිකව පවත්වාගෙන හා ක්‍රමවේදය යි. එහෙත් මෙම වසරේ එය නොපැවැත්වීමට තීරණය කළේ පවත්නා වසංගත තත්ත්වට අනුගත වීමක් ලෙසයි.

දිස්ත්‍රික් මට්ටමින් ගිහි පැවිදි ගුරු සිසු විශාල පිරිසක් මෙම තරග සඳහා සහභාගී වන හෙයින් එය කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පවත්නා සෞඛ්‍ය නීතිරීතිවලට කිසිසේත් ම උචිත නොවන හෙයින් තරග නොපැවැත්වීමේ මෙම තීරණය ගෙන තිබේ.

# මාරාන්තික වසංගත රෝගවලින් මිදීමට බුදු දහමෙන් උපදෙස්

**පෙර කිසිදක නොවූ විරූ ආකාරයේ බලවත් ම සෞඛ්‍ය ගැටලුවකට අපි මුහුණ දුන්නෙමු. චීනයේ වූහාන් නගරය කේන්ද්‍ර කරගෙන ඇරඹි කොවිඩ් 19 හෙවත් නව කොරෝනා යැයි, නම් ලද මාරාන්තික වසංගත රෝගී තත්ත්වය මුළු මහත් ලෝකය ම වෙළාගෙන පැතිර යාමට ගතවූයේ ඉතා කෙටි කලකි. රෝග නිධානයක් හෝ නිශ්චිත ප්‍රතිකාරයක් මෙතෙක් ස්ථිරව සොයාගෙන නොමැති හෙයින් මෙම වෛරසය ලොවෙන් තුරන් කිරීමේ බලවත් අභියෝගයකට ලොව පුරා වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීණයෝ මුහුණ පා සිටිති. ලෝකයේ ආර්ථිකය හා තාක්ෂණය අතින් අද්විතීය. බලවත් රාජ්‍යයන් ජනතාවට ද මෙමගින් අත් වූ ඉරණම ඉතා ඛේදජනකය.**



ඌරුගමුවේ අස්සජි හිමි

## විසාලා මහනුවර තුන්බිය

මෙවන් වසංගත රෝග සම්බන්ධ ව ඉතිහාසය විමසා බැලීමේ දී මුලින්ම මතකයට නැගෙන්නේ බුදුරදුන් ධරමාන අවධියේ දී දඹදිව විසාලා මහනුවර ඇතිවූ රෝග, දුර්භික්ෂ හා අමනුෂ්‍ය යන තුන්බිය පිළිබඳ සිදුවීමයි. මේ පිළිබඳ බුදුගුණ අලංකාරයේ දී වීදගම හිමි ඉදිරිපත් කොට තිබෙන කාව්‍යමය වාර්තාව තුළ මෙසේ දැක්වෙයි.

**ගොඩ ගොඩ ඇට සැකිලි - තැන තැන තුබු බලි බිලි**
**මග මග රෙදි වැරැලි - එ පුර ඇම තැන බලත් පිළිකුලි**

ගොඩබිමක් ගොඩබිමක් ගානේ ඇට සැකිලි ය. නොයෙක් තැන තිබුණා වූ බලි බිලිය. පාරක් ගානේ රෙදි වැරැලි ය. මෙසේ ඒ පුරය හැම තැන බලන කල්හි පිළිකුල් සහගත ය.

**දෙර දෙර මිනී බෙර - ගෙයි ගෙයි හඬය බිය කර**
**පිළ පිළ අදින මර - දුගී ගිලනුන්ගෙන් නැත' වසර**

දෙරටුවක් ගානේ මිනී බෙර ය. ගෙයක් ගානේ භයංකර හඬ ය. පිළක් ගානේ මැරෙන්නට පණ අදින දුප්පත් ලෙඩුන් ගෙන් ඉඩක් නැත

**මුත වරල ඉස ඉස - හෙන කඳුළැලි ය ඇස ඇස**
**සාගිනිය කුස කුස - කියන දුකුළවු ම විය බස බස**

හිසක් ගානේ කොණ්ඩය පීරා එක්කොට බැඳ නො තැබූ කෙස් වැටි ය. ඇසක් ගානේ වැස්සෙන්නා වූ කඳුළු ධාරා ය. කුසක් ගානේ සාගිනි ය. බසක් ගානේ කියන්නා වූ දුක් විලාප ය

මේ ආදී වශයෙන් එන විසාලා මහනුවර තුන් බිය පිළිබඳ වූ වාර්තාව තුළින් එම වසංගතයෙ හි බැරෑරුම් ස්වභාවය වටහා ගැන්ම අපහසු නො වෙයි. එසේ ම තවත් වෙනස් ස්වභාවයක මාරාන්තික වසංගත රෝගයක් පිළිබඳ වූ තොරතුරු බුදුරදුන් දවස සිටි කුම්භඝෝෂක සිටුවරයාගේ ජීවන කතා පුවත තුළින් දැකගත හැකි ය. සර්පයන් ගෙන් ප්‍රභවය වූවක් යැයි, කිව හැකි අහිවාතක නම් වූ එම රෝගයෙහි ස්වභාවය පිළිබඳ සද්ධර්මරත්නාවලී කතුවර ධර්මසේන හිමියන්ගේ වදනින් ඉදිරිපත් කිරීම වඩාත් යෝග්‍යය.

## අහිවාතක රෝගය

රජගහ නුවර ධන සිටාණ කෙනකුන් ගේ ගෙයි අහිවාතක නම් රෝගයෙක් උපන. ඒ රෝගය ඇති වූ කල ගෙයි මැස්සන් ආදි කොට ගවයන් දක්වා තිරිසනුන් පළමු කොට මියෙති. ඉක්බිති දැසි දස් ආදීහු මියෙති. ඒ සියල්ල වුන්ට පසුව ගෙහිමියෝ මියෙති. එකල්හි ද එපරිද්දෙන් ම අහිවාතක රෝගය සියල්ල වුන්ට පසුව සිටාණන් හා අඹෙණියන් (භාර්යාව) ගත රෝගයෙන් පීඩිත වූ ඔහු දෙදෙන සමීපයෙහි සිටි පුතණුවන් මුහුණ බලා කඳුළු පිරුණු ඇස් ඇතිව ඒ පුතණුවන්ට කියන්නාහු" පුතණ්ඩ මේ රෝගය ඇති වූ කල ගෙයි භිත්ති බිඳගෙන ගියාහු ජීවත් වෙති. තෙපි අප නො බලා පලා ගොස් ජීවත්ව ගෙන පසුව අවුත් අසවල් තෙන නිධාන කොට තුබූ සතලිස් කෙලක් වස්තු ඇත. ඒ හැර ගෙන සැප සේ රැකෙව" යි, කීහ. එතෙම ඔවුන් බස් අසා හඬා වැලප දෙමව්පියන් වැඳ මරණ භයින් බියපත්ව ගෙයි භිත්ති බිඳගෙන නික්ම පර්වත ගහනයකට පලා ගොස් දෙළොස් හවුරුද්දක් එතැන් හි වැස පසුව ආයේ ය.

ඉතා වේගයෙන් ජන සමාජය තුළ පැතිර ගිය මාරාන්තික වසංගත රෝග පිළිබ ඳ මෙවැනි ඓතිහාසික කතා පුවත් තුළින් සේ ම ලොව කලින් කලට හිස එස වූ යම් යම් වසංගත රෝග පිළිබඳ වාර්තාවන් තුළින් අපි අසා ඇත්තෙමු. එහෙත් ඉතා සියුම් ලෙසත් ඉතා සීඝ්‍රවත් ගම්, නගර හා රටවල් පුරා පැතිර යන අද ලෝකයේ වැඩියෙන් කතාබහ කෙරෙන නව කොරෝනා වසංගත රෝගය සහිත පරිසරයක ජීවත්වීමේ අත්දැකීමට කිසිදු කලෙක අපි මුහුණ නුදුන්නෙමු. එබැවින් මෙය අපට පමණක් නොව මුළු ලෝකවාසීන්ටම ආගන්තුක වූ නවමු බිහිසුණු අත්දැකීමකි.

## රෝගාබාධ නාමාවලියක්

එදා මෙදාතුර ලොව හටගත් බෝ වන හා බෝ නො වන මාරාන්තික වසංගත රෝග විවිධ ස්වභාවයන් ඔස්සේ පැතිර ගොස් තිබේ. ඒ අතර මාරාන්තික නොවන සාමාන්‍ය තත්ත්වයේ රෝග ද පවතියි. අප ගේ මෙම මිනිස් ශරීරය මරණයට හේතුවන නොයෙක් සිය ගණන් අභ්‍යන්තර රෝගයනට ද බාහිර උවදුරුවලට පොදුය. එම රෝග හා උවදුරුවලට ගොදුරුවීමෙන් මානව වර්ගයා ඇතුළුව සෙසු සියලු සත්ත්ව වර්ගයා විවිධ පීඩාවන්ට ද මරණයට ද පත් වෙති. මෙහිදී මිනිස් ශරීරයෙහි විවිධ අවයව මුල්කරගෙන හටගන්නා රෝගාබාධ පිළිබඳ අප හොඳින් දැන සිටිය යුතු ය. ගිරිමානන්ද සූත්‍රයෙහි හමුවන රෝගාබාධ නාමාවලිය විමසා බැලීම මෙහි දී ඉතා වැදගත් ය. ඒවා එහි එන අනුපිළිවෙලින් මෙසේ ය.


ඇස් රෝගය, කර්ණ රෝගය, නාසිකා රෝගය, දිවේ ඇතිවන රෝගය, කයෙහි ඇතිවන රෝගය, හිසෙහි ඇතිවන රෝගය, කර්ණ මූලයෙහි ඇතිවන රෝගය, මුඛ රෝගය, දත් රෝගය, කාස රෝගය, ස්වාස රෝගය, පීනස . දැවිල්ල. උණ, උදර රෝගය, මූර්ජාව , අතීසාරය, ඉදිමීම, විසූචිකාව, කුෂ්ට, ගඩු, කිලාසය, සෝසය, අපස්මාරය, දද, කැසිල්ල, කච්ඡු නම් වූ කුෂ්ට රෝගය, නිය රෝගය, විචර්චිකා නම් වූ කුෂ්ට රෝගය, රත්පිත, මධුමේහය , අංශ රෝගය, පිළිකාව, භගන්දලා, පිතෙන් ඇතිවන රෝගය, සෙමෙන් හටගන්නා රෝගය, වාතයෙන් හටගන්නා රෝගය, තුන්දෙසින් වන රෝගය, ඍතු පෙරලියෙන් ඇතිවන රෝගය, විෂම ආහාරපානාදිය ගැනීමෙන් ඇතිවන රෝගය, උපක්‍රමවලින් ඇතිවන රෝගය, කර්ම විපාකයෙන් ඇතිවන රෝගය, සීතල, උෂ්ණය, සාගින්න, පිපාසය, අහර, මල, මුත්‍ර ආදිය නිසා හටගන්නා රෝග

ශරීරය රෝගයනට ආකරයක් මෙන් ම පොදු ස්වභාවයක් පෙන්නුම් කරන බව බුදුදහමේ ඉගැන්වෙන්නේ මේ නිසා ය.

ජීවිතයක් සාර්ථක ව පවත්වාගෙන යාමට නම් මෙවන් රෝගයන්ගෙන් මිදුණු මානසික මෙන් ම කායික නිරෝගීතාව ද අවශ්‍ය ය. ශරීරය ලෙඩ රෝගවලින් යුක්ත වූ විට නො ලැබුණු දියුණුවක් ලබන්නටත්, ලැබුවා වූ දියුණුවෙන් ප්‍රයෝජන විඳීමටත් නොහැකි වෙයි. නිරෝගී පුද්ගලයා නොලැබුණ දියුණුව ලැබීමටත්, ලැබුවා වූ දියුණුවෙන් ප්‍රයෝජන විඳීමටත් සමත්වන්නේ ය. ඒ අනුව බැලූ විට මිනිස් ජීවිතයක අත් සියලු දුෂ්කරතාවලට වඩා බලවත් වන්නේ රෝග පීඩාවන් ය. "ආරෝග්‍ය පරමාලාභා" යනුවෙන් නිරෝගී බව උසස්ම ලාභය යැයි බුදු රජාණන්වහන්සේ දේශනා කළේ එබැවිනි.

## ශිෂ්ට සම්මත සීමාව ඉක්මවීම

නිරෝගී දිවි පෙවෙතක් උරුමකර ගැනීමට නම් අපි මනා සෞඛ්‍ය පිළිවෙත් ආරක්ෂා කළ යුතු වෙමු. ඒ වෙනුවෙන් අපට ඉගැන්වූ කරුණු රැසක් බුදුදහම තුළ සඳහන්ව ඇත. ගිහි ජීවිතයේ දී නිත්‍ය වශයෙන් ආරක්ෂා කළයුතු යැයි, උගන්වා ඇති පංචසීලය පවා නිරෝගී ජීවිතයකට මග පෙන්වයි. එහි තුන්වැනි සිල් පදය කාම මිත්‍යාචාරය හෙවත් කාමය වරදවා හැසිරීමයි. එයට ම පරදාර සේවනය යැයි ද කියයි. එනම් ශිෂ්ට සම්මත සීමාවන් ඉක්මවා අසම්මත ලෙස අශිෂ්ට ලෙස ස්ත්‍රී පුරුෂ සබඳතා පැවැත්වීමයි. එය ඉතා භයානක මාරාන්තික රෝගවලට මූලික හේතුවක් වෙයි. වර්තමාන ලෝකයේ විශාල පිරිසක් එබඳු රෝග පීඩාවන්ට ගොදුරු වී සිටිති. ඔවුහු සිතින් ද, කයින් ද අපමණ දුක් විඳිති. ජීවිතයේ සියලු අපේක්ෂා බිඳ වැටී සතුට සැපත අහිමි වී ජීවත් වෙති. වැරැදි කාම සේවනයෙන් වැළකීම නිරෝගී මිනිසුන් සහිත සමාජයක් ගොඩනගා ගැනීමට විශේෂයෙන් ම උපකාරී වන බව මින් පැහැදිලි වේ.



## දුසිරිතෙහි පිහිට පැතීම

පංච සීලයෙහි පස්වෙනි ශික්ෂා පදය මනාව ආරක්ෂා කිරීම ද නිරෝගීකම වෙනුවෙන් ඉතා වැදගත් වෙයි. එමගින් කියැවෙනුයේ මදයට හා ප්‍රමාදයට හේතුවන මධ්‍යසාර භාවිතයෙන් වැළකී සිටීම ය. සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් උපයන ධනය විනාශ වන කරුණු සය අතර පළමුවැන්න මධ්‍යසාර භාවිත කිරීමයි. එමගින් ලැබෙන විපාක සයක් ද එහි සඳහන් වෙයි. එහි තෙවැන්න වනුයේ නොයෙක් රෝගාබාධ හටගැනීමයි.

මත්ද්‍රව්‍ය , මත්වතුර ආදිය භාවිත කිරීමෙන් මාරාන්තික රෝග පීඩාවන්ට ගොදුරු වී සිටින ජන සංඛ්‍යාව ද ලෝකයේ ඉතා විශාල ය. එබැවින් අද වන විට මධ්‍යසාර භාවිතය මුළු මහත් සමාජයට ම බලවත්ම ව්‍යසනයක් වී තිබේ. ශරීරයට බොහෙවින් ම අහිතකර මෙම නුසුදුසු පුරුදු නිසා අනන්ත රෝගාබාධවලට ගොදුරු වූවන් සමාජයේ කොතෙකුත් දැකිය හැකි ය. සමහරු දවසේ වැඩ නිමකොට අධික වෙහෙස මහන්සිය දුරුකර ගැනීමේ පහසු මගක් ලෙස ද, මානසික පීඩාවන් අවමකර ගැනීමට ද, ඇතැම් වේදනාවන් තාවකාලිකව යටපත් කර ගැනීමට ද, විකෘති සතුටක් ලබා ගැනීමට ද මෙම දුසිරිතෙහි පිහිට සොයති.

මත්ද්‍රව්‍ය හා මත්වතුර ඉතා ඉක්මනින් සිරුරේ රුධිරය හා මිශ්‍රවී මුළු සිරුරට ම උත්තේජනයක් ලබාදෙයි. එහෙත් එය අහිතකරය . මෙම උත්තේජනයට හුරුවූවෝ නැවත නැවතත් එහිම ඇලී, එහි ඇති තාවකාලික සුවය ම සොයා යති. අවසානයේ සිදුවන්නේ උපතින් ම මනුෂ්‍යයෙකුට උරුම වූ මහාර්ඝ සම්පතක් වන මොළයෙහි සෛල විශාල ප්‍රමාණයක් අකාලයේ විනාශ වී යාම ය. මෙම තත්ත්වය නුවණින් වටහා නොගැනීම නිසා මේ වන විට විනාශ වූ ධනය ද, ජීවිත සංඛ්‍යාව ද ඉතා විශාල ය. හෘදයාබාධ, පිළිකා, අක්මාවේ රෝග සහ වකුගඩු රෝගවලට ද ප්‍රධාන හේතුවක් වන්නේ මධ්‍යසාර භාවිතය යි.

> පමණ ඉක්මවා ආහාර ගත් කොසොල් මහරජුට බුදුරදුන් වදාළ පරිදි, සිහි බුද්ධියෙන් ක්‍රියකරන මිනිසුන් පමණ දැන ආහාර ගත යුතු ය. එවිට කුසගින්න මෙන්ම තවත් කායික වේදනාවෝ ද නැති වෙති.

## රෝගවලට අත වැනීම

දුම්බීම කායික සෞඛ්‍ය දුර්වල කරන තවත් ප්‍රධාන හේතුවකි. මුඛ පිළිකා හා හෘද රෝගවලටත් ස්වසන පද්ධතියේ මෙන් ම ශරීරයේ සෙසු අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ගේ ක්‍රියාකාරිත්වය අඩපණ කිරීමටත් ප්‍රධාන හේතුවක් වන්නේ දුම්බීම යි.

වෙනත් පුද්ගලයින් අප ඉදිරිපිට දුම්බීම අපගේ සෞඛ්‍යයට ද අහිතකර ලෙස බලපාන බව වෛද්‍ය මතය යි. ජනතාව නිතර ගැවසෙන පොදු ස්ථානවල සිට ඇතැම්හු නීතියටත්, සදාචාරයටත් පටහැනිව දුම් උරති. එය එම ස්ථානවල සැරිසරන්නන්ට මහත් පීඩාවකි. දුම්බීම තම සමාජ තත්ත්වය ඉහළ තලයක රඳවා ගැනීමට හේතුවක් ලෙස ඇතැමුන් විශ්වාස කළ කාලයක් තිබුණි. එහෙත් අද සමාජයේ මිනිස්සු කායික ලෙඩ රෝග පිළිබඳව වෙනද නොවූ විරූ අවධානයකින් පසු වෙති. එවන් මිනිසුන් අතුරෙහි දුම්බොන පුද්ගලයා කොන්වීම නිරායාසයෙන් ම සිදු වන්නකි. එබැවින් අද එය ආඩම්බර වීමට කරුණක් නො වන බව සමාජය විසින් ම පිළිගෙන ඇත. මුල දී අනවබෝධය නිසා මෙම මාරාන්තික ව්‍යසනයට ගොදුරු වූ බොහෝ දෙනෙකු දැන් ඒවායින් දුරුවී සිටිනු ද දැකිය හැකි ය.

## භයානකම උවදුරක්

පසුගිය දශක දෙකක පමණ කාලයක සිට ටිකෙන් ටික පැතිරී ජනතාව විනාශ මුඛයට ඇදගෙන යන භයානකම උවදුර මත්කුඩු භාවිතයයි. ඒවා භාවිතයේ දුර්විපාක කෙතරම් භයානක ද යත්, එය සිරුරෙහි සාරය උකහා බී පුද්ගලයෙකු හුදු ඇටසැකිල්ලක් බවට පත්කරයි. හැම අතින්ම ඔහු ගේ පිරිහීම ප්‍රකට වෙයි. කායික ඉන්ද්‍රියයන් ගේ ක්‍රියාකාරිත්වයට බලවත් බාධාවක් මිස කායික සෞඛ්‍යයට හිතකර වූ කිසිදු ප්‍රයෝජනයක් මත්ද්‍රව්‍යයන්ගෙන් මිනිසාට නොලැබේ. කායික නිරෝගිතාවයෙන් තොර පුද්ගලයන්ගෙන් පිරි සමාජයකට රට, ජාතිය. ආගම පෝෂණය කළ නො හැකිය. ආරක්ෂා කළ නො හැකිය. යහපත් කායික සෞඛ්‍ය තත්ත්වයක් පවත්වාගෙන යාමට මත්ද්‍රව්‍ය බලවත් ම බාධාවක් වන හෙයින්, කවර බලපෑම් පැමිණිය ද ඒවාට හසු නොවී ක්‍රියා කිරීම සිදුකළ යුතු ම ය.

## ආහාරයේ අරමුණ

කායික නිරෝගීතාව අඩපණ කරවන තවත් සාධකයක් වන්නේ ආහාර පිළිබඳ අනිසි හුරුපුරුදුකම් ය.ආහාරය කායික රෝගී බවට මෙන්ම නිරෝගී බවටද බලපෑමක් ඇති කරයි.

බුදුදහම අනුව කුසගින්න ලොව බලවත් ම රෝගය යි. සියලු සත්ත්වයන් ජීවත්වන්නේ ආහාරයෙනි. ආහාර ගැනීමෙන් අප බලාපොරොත්තු විය යුතු ප්‍රධාන කරුණු කිහියක් මෙසේ ය.

ශරීරයේ යහපත් පැවැත්ම, යැපීම, උපන් කුසගිනි වේදනා දුරුකර ගැනීම, නූපන් කුසගිනි වේදනා වැළැක්වීම, ආයුෂ, වර්ණය, සැපය, බලය, මෙන්ම නුවණ ද වැඩිදියුණුවීම

මේ අනුව සුදුසු ආහාර, සුදුසු පරිදි අනුභව කිරීම කායික සෞඛ්‍යය සුරැකීමේ අත්‍යවශ්‍ය පියවරක් ලෙස දැක්විය හැකි ය. ප්‍රමාණයට වඩා ආහාර අනුභව කිරීම කායික සෞඛ්‍යයට කිසිසේත් ම හිතකර නොවේ. පමණ ඉක්මවා ආහාර ගත් කොසොල් මහරජුට බුදුරදුන් වදාළ පරිදි, සිහි බුද්ධියෙන් ක්‍රියකරන මිනිසුන් පමණ දැන ආහාර ගත යුතු ය. එවිට කුසගින්න මෙන්ම තවත් කායික වේදනාවෝ ද නැති වෙති. ගන්නා ආහාර සැණෙකින් දිරවයි. ආයු සම්පත් වැඩිදියුණු වෙයි. අධිපෝෂණය සිරුරට අහිතකරය. මේදය අධිකවීම හේතුවෙන් වැළඳෙන රෝගී තත්ත්වයන් සමාජය තුළ බහුලව දැකිය හැකි ය. ආහාර වැඩියෙන්, අනුභව කිරීමත් ඊට සරිලන පරිදි කායික වෙහෙසීමක් සිදු නොවීමත් මෙම රෝගවලට ප්‍රධාන හේතුවකි. එය පාලනය කරගත නො හැකි වුවහොත් මුළු ජීවිත කාලය ම ඒ නිසාම පීඩා විඳීමට සිදුවෙයි. ආහාර අනුභවයේ දී අප සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

ශරීරයට හිතකර වූ ආහාර වේලක් තෝරා ගැනීම

එළවළු හා පලා වර්ග ආහාරයට ගැනීම

පළතුරු වර්ග හැකිතාක් ආහාර වේලට එක්කර ගැනීම

පිළිකා කාරක කෘත්‍රිම රසායනික වර්ග අඩංගු නොවන ස්වභාවික ආහාරපාන භාවිතය

රසායනික ද්‍රව්‍ය යොදා ගනිමින් කෘත්‍රිම ලෙස වර්ණ ගැන්වූ ආහාරපාන භාවිතයට නො ගැනීම

ඉහත කී කරුණු සියල්ල සැලකිල්ලට ගත් විට නිරෝගීකම උතුම් ම ලාභයක් බව නොයෙක් අයුරින් පැහැදිලි වේ. එසේ ම බුදුදහමට අනුව නිවතින් මෙ පිට පුද්ගලයෙකුට ලබාගත හැකි උත්තරීතර සැපතක් ලෙසද නිරෝගීකම ඇගයිය හැකි ය. නිවැරැදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමෙන් යහපත් නිරෝගී සම්පන්න ජීවිතයක් ගත කිරීමට හැකියාව ලැබේ. මේ වකවානුව තුළ මුළු ලොවට ම බලවත් සෞඛ්‍ය තර්ජනයක් ගෙන දුන් මාරාන්තික කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වසංගත රෝගයෙන් මිදිය හැකි එකම මග ද නිසි සෞඛ්‍ය පිළිවෙත් සුරැකීමයි. වෛද්‍ය විශේෂඥයින් සේ ම ඒ පිළිබඳ දැනුමැති පුද්ගලයින් ලබාදෙන සෞඛ්‍ය උපදෙස් මෙම කොරෝනා සමය තුළ මතු නො ව යාවත්කාලීන ව පිළිපැදීමට හුරුපුරුදුවීම වඩාත් බුද්ධිගෝචර ක්‍රියා පිළිවෙතක් සේ පෙන්වාදිය හැකි ය.

---



රේරුකානේ චන්දවිමල මහ නා හිමි

# මිතුරුකමේ පැවැත්ම

**කෙනෙකු හා මිත්‍ර වීම පහසු වැඩකි. දුෂ්කර කාරණය නම් මිත්‍රත්වය දීර්ඝ කාලයක් නො බිඳ පවත්වා ගැනීම ය. මිත්‍රත්වය කල් පැවැත්විය හැක්කේ නුවණැතියන්ට ය. අඥයෝ මිත්‍ර වී නොබෝ කලකින් ම ඔවුනොවුන් බිඳෙති.**

බිඳුණා වූ ඔවුහු ඔවුනොවුන්ට සතුරුකම් කරමින් සිටිනු මිස නැවත මිත්‍රත්වය සකස් කර නො ගනිති. මිත්‍ර වූ නුවණැත්තෝ පහසුවෙන් නො බිඳෙති. යම්කිසි හේතුවකින් ඔවුනොවුන් බිඳුනාහු ද ඔවුහු නැවත මිතුරු වෙති. සෑම කල්හි ම වෛරය නො පවත්වති. එහෙයින් තථාගතයන් වහන්සේ මෙසේ වදාළ සේක.

"සත්පුරුෂයෝ ඔවුනොවුන් බිඳුණාහු ද වහා සමගියට පැමිණෙති. අඥයෝ මැටි බඳුන් බිඳෙන්නාක් මෙන් ඔවුනොවුන් බිඳෙති. ඔවුහු නැවත සමගියට නො පැමිණෙතිය.

මැටි බඳුන බිඳුණු පසු නැවත සන්ධි නො කළ හැකිය. බාලයෝ මැටි බඳුන් සේ නැවත සමගි නොකළ හැකි ලෙස බිඳෙති. රන් බඳුන බිඳුණේ ද නැවත ප්‍රකෘතිමත් කළ හැකි ය. නුවණැත්තා වූ සත්පුරුෂයෝ බිඳුණාහු ද රන් බඳුන් සේ නැවත සමගි කළ හැකි ය.

මිතුරුකම් කල් පවත්වනු කැමතියන් විසින් මිතුරු දහම නැමැති බැම්ම තහවුරු වීමට හා බිඳීමට ඇති හේතු දැන ගත යුතු ය. අනුන්ගෙන් කොතෙක් ලදත් සෑහීමකට නො පැමිණෙන ස්වභාවය වූ මහිච්ඡතාවය, තමා ගෙන් දෙයක් අනුන්ට දීමට නො කැමති බව වූ මසුරුකම ය, කෙළෙහි ගුණ නො දැනීම ය, නො විමසා කටයුතු කිරීම ය, වංක අදහස් ය, වරද නො පිළිගැනීම ය, කේලාම් පිළිගැනීම ය යන ආදිය මිත්‍රත්වය බිඳීමේ හේතුහු ය.

ලද දෙයින් සතුටු වන ස්වභාවය ය, වඩ වඩා අනුන්ගෙන් ගන්නට බලාපොරොත්තු නොවන බව ය, ත්‍යාගවත් බව ය, කෙළෙහි ගුණ දැනීම ය, ඉක්මන් නො වී විමසා දුර බලා වැඩ කිරීම ය, අවංක බව ය, වරද පිළිගැනීම ය, කේලාම් නො පිළිගැනීම ය යනාදිය මිතුරුකම් කල් පැවතීමේ හේතුහු ය.


**බෞද්ධයාගේ අත්පොත ඇසුරෙනි**

# මෙත් ගුණෙන් සිත් වඩමු...

**මව් කුසින් මෙලොව එළිය දුටු කුඩා ළදරුවෙකුගේ සිත මොළකැටි ය. ප්‍රසන්න ය. තරහව නැත. ක්‍රෝධය නැත. වෛරය හෝ ඊර්ෂ්‍යාව නැත. නමුත් වයසින් ටිකෙන් ටික මුහුකුරා යන විට ළදරු අවධියේ පැවැති මොළකැටි සිත තුළ ම කාලයාගේ ඇවෑමෙන් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පළිගැනීම හා වෛරය නිසා සිත අප්‍රසන්න තත්ත්වයට, පිරිහීමට පත් වේ.**

එතුළින් සිත, කය හා වචනය යන තුන් දෙරින් ම නිරන්තරයෙන් අකුසල ක්‍රියාවන්ට යොමු වේ. පාපයට නතු වෙයි. මෛත්‍රිය වෙනුවට බද්ධ වෛරයෙන් කටයුතු කිරීම නිසා මෙලොව හා පරලොව පිරිහීමට හා දුගතියට ලක් වේ.

වෛරයේ හෙවත් ක්‍රෝධයේ ස්වභාවය, ධර්මය තුළ ක්‍රෝධ කරන සිත් ක්‍රියාත්මක වන ආකාරය විස්තර කිරීමේ දී දක්වා ඇත්තේ දියේ ඇඳි ඉරක් සේ ඉක්මනින් මැකී යන ක්‍රෝධ සිත් ඇති පුද්ගලයාට තමාගේ අඩුපාඩුකම් හඳුනාගෙන, ක්‍රෝධය ඉතාමත් ඉක්මනින් නැති කර ගෙන, සිත දියුණු කරගත හැකි බව යි. දිගින් දිගට පවත්වා ගෙන යන සදාකාලික වෛරයක් ඔහුගේ සිත තුළ නොවීම මෙයට හේතුව යි. ක්‍රෝධ කරන්නාගේ අනෙක් ස්වභාවය නම් පොළොවේ ඇඳි ඉරක් සේ ක්‍රෝධය පවත්වා ගැනීම යි. මෙලෙස ක්‍රෝධයෙන් පසුවන්නාට ද තමාගේ සිත දියුණු කළ හැකි ය. පෙර කී පරිදි එම තැනැත්තාගේ වෛරය ද ස්ථිර නැත.



කාලයක් එම වෛරය, ක්‍රෝධය පැවතුණ ද කලක් ඇවෑමෙන් එම ක්‍රෝධ චිත්තය නැති වී යයි. ධර්මයේ දක්වෙන්නේ එවැන්නෙකුට ද තම සිත දියුණු කිරීමේ අවකාශය ඇති බව යි. ඒ සඳහා අවශ්‍ය වන්නේ උත්සාහය හා වීර්යය පමණි.

අවසාන පුද්ගලයාගේ ස්වභාවය වන්නේ ගලක කෙටූ ඉරක් සේ ක්‍රෝධය සදාකාලික ව පවත්වා ගෙන යන පුද්ගලයා ය. එම තැනැත්තාට සිත දියුණු කළ නො හැකි ය. එම ක්‍රෝධය නො සන්සිඳෙන දෙයකි. ආත්මයෙන් ආත්මයට පවත්වා ගෙන යන බද්ධ වෛරයකි.

අප ගෞතම තථාගතයන් වහන්සේ කෙරෙහි දේවදත්ත තෙරුන් වහන්සේ ඇති කරගෙන සිටියේ එවැනි නොසන්සිඳෙන වෛරයකි. ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්වන ආත්මය දක්වා ම දේවදත්ත තෙරණුවන් එම වෛරයෙන් පසු වූ නිසා අදටත් නිරයෙහි දුක් විඳියි. එම නිසා මෙම ක්‍රෝධයේ ආදීනව නිවැරැදිව වටහා ගෙන වෛරය, ඊර්ෂ්‍යාව හා ක්‍රෝධය වෙනුවට මෛත්‍රී පූර්වක සිතිවිලි වලින් යුක්ත වීමට සැම විට ම උත්සාහවන්ත විය යුතුම ය.

අප කිසිවෙක් කිසිවෙකුට වෛර නො කර නැතැයි පැවසීම ඉතාම අපහසු ය. සුළු හෝ සිදුවීමක් හේතුවෙන් අප කිසිවෙකුට හෝ සසරේ කවදා හෝ ක්‍රෝධ කර ඇත්තෙමු. එය එසේ නොවේ යැයි පැවසීම පවා මුසාවකි. මෙම ආත්ම භවයේ දී ද කවදා හෝ කිසිවෙකුට හෝ වෛර සිතිවිලි පෙරටු කරගත් කාය කර්ම, වාග් කර්ම හෝ මනෝ කර්ම වලින් තවකෙකුට



ගැටහැත්ත බෝපැත්ත
ශ්‍රී සෝමානන්ද ඉංග්‍රීසි මාධ්‍ය
මූලික පිරිවෙන්
විහාරාධිපති
ශාස්ත්‍රවේදී
**රාස්සගල
චන්දකිත්ති හිමි**

පීඩා කරන්නට ඇත. හිංසා කරන්නට ඇත. මෙම වෛරයේ, ක්‍රෝධයේ ආදීනව පිළිබඳ දක්වන බොහෝ අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ “මෙම ක්‍රෝධයෙන් , වෛරයෙන් මඩනා ලද සිත් ඇති නිසා සතර අපායේ ඉපදුණු වාර ගණන අනන්ත අප්‍රමාණ බව ය.” එතරම් බරපතළ ප්‍රති විපාක ගෙන දෙන අකුසල සිතිවිල්ලක් ලෙස ක්‍රෝධය දැක්විය හැකි ය.

තවකෙකුට ක්‍රෝධ කිරීම නම් වූ අකුසලයේ ප්‍රතිඵලයක් ලෙස මිනිස් ලොව ඉපදුණොත් විරූපී වී උපත ලැබීමට සිදු වන බව ධර්මයේ සඳහන් වී ඇත. අන්‍යයන්ට ප්‍රියමනාප නොමැති ව, අන්‍යයන් පිළිකුල් කරන තත්ත්වයට පත්වීමට වෛරයෙන් සිත දූෂ්‍ය කරගත් පුද්ගලයාට සිදුවෙයි. මේ හේතුවෙන් ජීවිතය පිරිහීමට ලක් වෙයි. කිසිවෙකු අගය නො කරන, ඇතැම් විට සමාජ වටිනාකමක් පවා නො ලැබෙන තරමට ම මිනිස් ජීවිතය පරිහානියට ලක් වෙයි. එම නිසා සැම මොහොතක ම සියල්ලන්ට ම අවෛරී සිතින් ක්‍රියා කිරීමට යොමු විය යුතු ය.

අනුරුද්ධ මහ රහතන් වහන්සේට නැගණියක් විය. ඇය කුෂ්ඨ රෝගයකින් අධික පීඩාවට ලක් වී සිටි කාන්තාව කි. කෙතරම් ප්‍රතිකාර කළත්, ඇය සුවය නො ලැබුවා ය. අනුරුද්ධ මහ තෙරුන් වහන්සේ සුව නො වන රෝගයට හේතුව කුමක්දැයි සොයා බලන අතරතුර ඇයගේ අතීතය තම නුවණින් සිහි කළේ ය. එවිට උන්වහන්සේට දැක ගැනීමට හැකි වූවේ එක් ආත්ම භවයක දී රාජ මාළිගාවක රජ බිසවක වී උපත ලබා සිටි ආකාරය යි. එකල ඇය එම රජ මාළිගයෙහි සිටි තවත් ලස්සන බිසවකට ඇයගේ ලස්සන බව නිසා ම ඊර්ෂ්‍යා කරන්නට විය. වෛරයෙන් හා අධික ක්‍රෝධයෙන් යුතු ව ඇයට විවිධ පීඩාවන් පමුණුවන්නට වූවා ය. දිනක් මෙම රජ බිසව අර ලස්සන කාන්තාව නිදාගන්නා ඇඳේ කහඹිලියා දමා එනවා. අර බිසව ඇඳට ඇවිත් ටික වේලාවක් නිදාගෙන ඉන්න කොට මුළු ශරීරය ම කසන්න පටන් ගනියි. රජ බිසව මේක බලන් ඉඳලා හොඳට ම සතුටු වෙනවා. තවත් අයෙකුට ක්‍රෝධ කරන්න ගත්තා ම එම ක්‍රෝධ කිරීමේ ස්වභාවය කෙසේ ද යන්න මෙතුළින් අපට අවබෝධ කරගන්න පුළුවනි. එම නිසා සියලු දෙනා කෙරෙහි මෙත් සිත පෙරටු කර කටයුතු කිරීමට සැම විට ම වග බලා ගත යුතු ය. අනෙකාට වෛර කිරීමේ දී අවසානයේ පීඩාවට පත්වන්නේ ද කෙදිනක හෝ තමා ම බව නුවණින් තේරුම් ගෙන කටයුතු කිරීමට උත්සාහවන්ත විය යුතු ය.

> “තවකෙකුට ක්‍රෝධ කිරීම නම් වූ අකුසලයේ ප්‍රතිඵලයක් ලෙස මිනිස් ලොව ඉපදුණොත් විරූපී වී උපත ලැබීමට සිදු වන බව ධර්මයේ සඳහන් වී ඇත. අන්‍යයන්ට ප්‍රියමනාප නොමැති ව, අන්‍යයන් පිළිකුල් කරන තත්ත්වයට පත්වීමට වෛරයෙන් සිත දූෂ්‍ය කරගත් පුද්ගලයාට සිදුවෙයි.”

# දෙහිගස්පේ ශ්‍රී පඤ්ඤාසාර නා හිමි

**ආචාර්ය පණ්ඩිත දෙහිගස්පේ ශ්‍රී පඤ්ඤාසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ධර්මධර, විනයධර වියත් පඬිරුවනකි. දෙහිගස්පේ දෙන් බස්තියන් ජයසිංහ ආරච්චි රාළහාමි සහ සිසිලියානා මාතාවගේ කණිෂ්ඨ පුත්‍ර රත්නය වූ ඩී.ජී. ජයසිංහ කුමරුවා 1899 නොවැම්බර් 23 දින ජන්ම ලාභය ලැබීය.**



1913 නොවැම්බර් 20 වැනි දින අකුරැස්සේ ගොඩපිටියේ ඓතිහාසික රාජමහා විහාරස්ථානයේ දී ජයසිංහ කුමරුවා දෙහිගස්පේ පඤ්ඤාසාර නමින් පැවිදි කරනු ලැබීය.
උන්වහන්සේගේ පැවිදි දිවිමග ඒකාලෝක කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සලසාදීමට ගුරු පදවිය ගල්කන්දේ පුරාණ රාජමහා විහාරාධිපති දෙහිපේ ආනන්ද මාහිමිපාණන් හෙබවූ අතර උපාධ්‍යාය පදවිය හොබවන ලද්දේ ගල්කන්දේ බ්‍රහ්මාක්ෂිරාජ පරිවේණාධිපති ගොඩපිටියේ ශ්‍රී සෝභිත මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.
මූලික පිරිවෙන් අධ්‍යාපනය සඳහා බ්‍රහ්මාක්ෂිරාජ පිරිවෙනට ඇතුළත් වූහ. උන්වහන්සේ ආචාර්ය උපාධ්‍යාය දෙනම විසින් කොළඹ මාළිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙනේ අධිපති මහගොඩ ශ්‍රී ඥානේශ්වරාභිධාන නාහිමිපාණන්ට 1916 අප්‍රේල් මස 16 වැනි දින භාර කරනු ලැබීය. එහිදී පඤ්ඤාසාර සාමණේර හිමියෝ එකල එම පිරිවෙනේ කීර්තිමත් ආචාර්යවරයෙකු වූ පණ්ඩිත මාපලගම චන්ද්‍රජෝති මාහිමිපාණන් යටතේ ධර්ම ශාස්ත්‍ර හැදෑරූහ. මෙසේ උගෙනුම ලබද්දී 1918 දී ප්‍රාරම්භ විභාගයෙන් ද, 1920 පැවැත් වූ මධ්‍යම විභාගයෙන් ද ලංකාවේ ප්‍රමුඛයා ලෙස සාමාර්ථය ලැබූහ.
1920 ජූනි මස 20 වැනි දින මහනුවර මල්වතු මහාවිහාර උපෝෂථාගාරයේ දී අමුණුගම රාජගුරු ශ්‍රීනිවාස ප්‍රියධර්ශ්‍යභිදාන මහානායක ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ සංඝ සභාව වෙතින්, ගොඩපිටියේ ශ්‍රී සෝභිත මාහිමි, දෙහිපේ ආනන්ද මාහිමි. කහවේ රතනසාර නාහිමි යන තෙනමගේ ශිෂ්‍යයකු ලෙස උපසම්පදා විය.
1924 දී පණ්ඩිත විභාගයෙන් ගෞරව පන්තියේ සාමාර්ථයක් ලබා වෛද්‍යසේකර ත්‍යාගය ද, සමරදිවාකර සංස්කෘත ත්‍යාගය ද අබේවික්‍රම සිංහල ත්‍යාගය ද එකවර ලැබූහ. නොවැම්බර් මස පැවැත් වූ විද්‍යෝදය මහ පිරිවෙනේ අවසාන විභාගයෙන් ගෞරව පන්තියේ ප්‍රමුඛයා වී දක්ෂතම ශිෂ්‍යයාට හිමිවන ශ්‍යාම රාජ ත්‍යාගය ඇතුලු තෑගි රැසක් ලබා ගත්හ.
කහවේ ශ්‍රී රතනසාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලය විසින් පණ්ඩිත දෙහිගස්පේ පඤ්ඤාසාර යතිවරයාණෝ 1924 ජනවාරි මස 07 වැනි දින ආචාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදහ.
උන්වහන්සේ 1930 දී ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතවීමට එංගලන්තය බලා වැඩම කළහ. පසුව මහාබෝධි සමාගමේ ඉල්ලීම අනුව ග්ලෝස්ටර්රොඩ්හි බෞද්ධාශ්‍රමයේ අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කළහ. 1939 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයට ඇතුළත්ව 1940 දී බී.ඒ. ගෞරව උපාධිය ලබා ගත්හ.
අනතුරුව ලංකාවට වැඩමකොට විද්‍යොදය පිරිවෙනේ ආචාර්ය ධූරයේ කටයුතු කරන ලද අතර, ආනන්ද මහා විද්‍යාලයේ පැවැති උපාධි අපේක්ෂක පන්තියේ ආචාර්ය ධූරයෙහි ද ක්‍රියා කළහ. 1949 දී මල්වතු මහාවිහාර කාරක සංඝ සභාව මගින් කිර්ති ශ්‍රී යන ගෞරව නාමය සහිතව දක්ෂිණ ලංකාවේ උපප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමිණ. සංස්කෘත භාෂාව පිළිබඳ හසල දැනුමකින් යුත් නාහිමියෝ මහාචාර්ය ඕ.එච්.ඒ. ද විජේසේකර මහතාගේ උපදෙස් අනුව 1951 සිට 1954 දක්වා කළ පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ සංස්කෘත සාහිත්‍ය නමැති ග්‍රන්ථය සකස් කර ඉදිරිපත් කොට ආචාර්ය උපාධිය ද ලබා ගත්හ.
1956 දී රජය මගින් පිහිටුවන ලද රත්මලාන පිරිවෙන් ගුරු විදුහලේ විදුහල්පති ධූරයට ද පඤ්ඤාසාර නාහිමියෝ පත් කරන ලදහ.
1959 දී විද්‍යෝදය පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත් කළ අවස්ථාවේ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පෙරදිග භාෂා අංශයේ විනේතෘ ධූරයට පත් වූ ආචාර්ය දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්වාමීන්ද්‍රයෝ පාලි හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ප්‍රමුඛාචාර්යවරයා ලෙස ද කටයුතු කළහ.
1955 බුරුමයේ රැන්ගුන් නුවර පැවති ධර්ම සංගායනාවට ලංකා නියෝජිත පිරිසේ ප්‍රධානියා ලෙස ද ඉන්දීය රජයේ විශේෂ ආරාධනය පරිදි ලංකා නියෝජිතයා ලෙස ද සහභාගි වී විශේෂ දේශනයක් පැවැත්වූහ.
පඤ්ඤාසාර නාහිමියෝ සමස්ථ ලංකා භික්ෂු සම්මේලනයේ ප්‍රධාන සභාපති ලෙස මහා සමාජ මෙහෙවරක් ඉටු කළහ.
පඤ්ඤාසාර නාහිමියෝ බුදුසිරිත අලලා ලියන ලද 'එවං මේසුතං හෙවත් ගෞතම බුද්ධ චරිතය' නමැති ග්‍රන්ථය එකල සමාජයේ අතිශය සම්භාවනාවට ලක් වූ කෘතියකි. තවද සංස්කෘත ශබ්ද ශාස්ත්‍රය, ශ්‍රී රත්නසාර ව්‍යාකරණය, සංස්කෘත සාහිත්‍යය, සමාස ලක්ෂණය, බුද්ධ ධර්මය යන ග්‍රන්ථ උන්වහන්සේගේ නිර්මාණාත්මක කෘති වේ.
මේ හැර දම්පියා අටුවාසන්නය, කුස ජාතක කාව්‍ය වර්ණනාව, එළු අත්තනගලුවංශ විවරණය, හත්තවනගල්ල විහාරවංශය, සාර දීපිකා ව්‍යාඛයා, රසු වංශ සුබෝධනි ව්‍යාඛයා, රත්නාවලී නාටකය, සිංහල සාර සංග්‍රහය, අංගුත්තර නිකාය ප්‍රථම භාගය, මහාවංශ සන්නය, රූප සිද්ධි සන්නය, මහාවග්ග පාලි සංශෝධනය ආදී කෘතීන් වේ.
හැටන් හී නිග්‍රෝධාරාමයෙහි වැඩ සිටියදී 1966 දී ජූලි මස 24 වැනි දින හැට හත් වසක් ආයු වළඳා දෙහිගස්පේ පඤ්ඤාසාර නාහිමියෝ අපවත්වූහ.

දෙල්ලව විද්‍යාවර්ධන පිරිවෙන් විහාරාධිපති,
**දෙල්ලව ජිනරතන නා හිමි**

පූජා ච පූජනීයානං

# මාගෙදර මහින්ද හිමි

**1930 නොවැම්බර් මස 24 වැනි දින ගාල්ල මාගෙදර දී ජන්ම ලාභය ලද කුල කුමරුවෝ ක්‍රි.ව. 1944 මාර්තු මස 22 වැනි දින ශ්‍රී සද්ධර්ම භාරතීශ්වරාචාර්ය කතළුවේ කීර්ති ශ්‍රී සුමංගලාභිධාන දකුණු පළාතේ ප්‍රධාන සංඝ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සහ පිලානේ පඤ්ඤාරාම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ආචාර්ය හා උපාධ්‍යායකත්වයෙන් මාගෙදර මහින්ද නමින් වලහන්දුව ශ්‍රී සුදර්ශනාරාමයේ දී පැවිදි දිවියට ඇතුළත් වූහ.**

පැවිදි ජීවිතයට අදාළ ධර්ම විනය මැනවින් හදාරමින් විසි වයස් සපිරීමේ දී උන්වහන්සේ 1955 ජූනි මස 05 වැනි දින මල්වතු මහා විහාරීය මංගල උපෝෂථාගාරයේ දී උපසම්පදාව ලැබූහ.

පැලියගොඩ විද්‍යාලංකාර මහ පිරිවෙනෙන් පිරිවෙන් අධ්‍යාපනය සම්පූර්ණ කළ උන්වහන්සේ විශ්ව විද්‍යාලයීය ප්‍රවේශ විභාගයෙන් සාමාර්ථය ලැබ පැලියගොඩ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට පිවිස ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්හ.
එවකට විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයේ කීර්තිමත් ශිෂ්‍යවරයෙකු වූ උන්වහන්සේ එදා සිට ම ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලී දේශපාලන ප්‍රවාහය තුළ කැපී පෙනෙන භූමිකාවක් ඉටුකරන ලද අතර බ්‍රිතාන්‍ය කිරීටයෙන් නිදහස් වූ දේශයේ ස්වාභිමානී අදහස් ජනගත කිරීමට සාධනීය මෙහෙවරක නිරත වූහ. ජාතික අවශ්‍යතාවයනට පණ පොවන අතර ම තම දායක කාරකාදීන්ගේ ආගමික ශාසනික සේවාවන් ඉටු කිරීමට ද උන්වහන්සේ කිසිදා අමතක නොකළහ.
විශ්ව විද්‍යාල අධ්‍යාපනය සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව එවකට ගාල්ලේ කීර්තිමත් විද්‍යාස්ථානයක් වූ මහමෝදර කෝවිලගොඩැල්ල ශ්‍රී ගුණෝදය මහ පිරිවෙනේ ආචාර්යවරයකු ලෙස තම ගුරු භූමිකාවට ප්‍රවේශ වූහ.
මාගෙදර මහින්ද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තම පිරිවෙනෙහි කරන ලද උසස් සේවාව ඇගයීම් වශයෙන් එම පිරිවෙනේ ම පිළිවෙළින් නියෝජ්‍ය පරිවේණාධිපති, පරිවේණාධිපති සහ කෘත්‍යාධිකාරී යන තනතුරුවලින් ද පිදුම් ලැබූහ. උන්වහන්සේ අපවත් වන අවස්ථාව දක්වා ම මහමෝදර ශ්‍රී ගුණෝදය මහා පිරිවෙනේ කෘත්‍යාධිකාරී තනතුර හෙබවූහ.
මෙම අද්විතීය අධ්‍යාපනික සේවාවන් හි නිරත වන අතර තමන් වහන්සේ වැඩ වාසය කළ වලහන්දූව ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය ප්‍රදේශයේ දීප්තිමත් විහාරස්ථානයක් බවට පත් කිරීමට අවශ්‍ය සියලු විහාරාරාංග ඉදිකරවීමට කටයුතු කළහ.
1977 ඔක්තෝබර් 02 වන දින විහාරස්ථානයේ විහාරාධිපති තනතුරට පත්වන නායක ස්වාමීන් වහන්සේ විහාරස්ථානයේ අර්ධ වශයෙන් ඉදිකර තිබූ විහාර මන්දිරය අංග සම්පූර්ණ අනුරාධපුර කලා ශෛලියට නැකම් කියන ඉහළ කලාත්මක ගුණාංගයන්ගෙන් සුපරිපූර්ණ ව වැඩ නිමකරන ලදුව 1994 අගෝස්තු මස 12 වන දින ජනතාවගේ පූජාවන්ට පාත්‍ර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදහ.
ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහායෙන් සැවැත් නුවර ජේතවනාරාමයේ රෝපිත විජය ශ්‍රී ආනන්ද බෝධියේ ශාඛාවක් වැඩමවා 1970 දී ඉපැරණි බෝධීන් වහන්සේ සමීපයේ ගෞරවයෙන් රෝපණය කරනු ලැබිණි. එමෙන් ම පෞරාණික කලා සම්ප්‍රදාය සිහිගන්වන පියගැටපෙළ, සඳකඩපහණ, මකර තොරණ, මල් ආසන, බෝධි ප්‍රාකාර ආදිය ඉදිකරවන ලද අතර ජනතාවගේ අවශ්‍යතාවන් පරිදි ශ්‍රී විෂ්ණු, කතරගම දේවාල මන්දිර, පැන් ගෙවල්, පහන් ගෙවල් ආදී අනේක අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන ලදී. ප්‍රදේශයේ දරුවන්ගේ දහම් දැනුම සංවර්ධනය සඳහා ශ්‍රී සුමංගල දහම් පාසලේ ද කියවීමේ පුරුද්ද වර්ධනය කිරීම සඳහා ශ්‍රී සුමංගල පුස්තකාලය ආරම්භ කිරීමට ද කටයුතු කළේ ය.
උන්වහන්සේට නිවන් සුව ලැබේවා !

හම්බන්තොට මාගම්පත්තුව ඇතුළු ගාලු මාතර දෙදිසාවේ ප්‍රධාන සංඝ නායක
**අඟුළුගහ ධම්මින්ද නාහිමි**

කලහේ සුමංගල මහා විද්‍යාලයේ ආචාර්ය
**ශාස්ත්‍රපති පනාකඩුවේ රතනසාර හිමි**

# ප්‍රහේලිකා අංක 13

බුදුසරණ
ත්‍යාග අනුග්‍රහය
සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය


**බුදුසරණ ප්‍රහේලිකාව ඉදිරිපත් කිරීම මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමියන්ගේ අනුශාසකත්වයෙන් කේ. එල්. ඒ. රණසිංහ විසිනි.**

**හරහට**

1. වර්තමාන ලංකාවේ භික්ෂූන් වහන්සේලා මෙනම් ප්‍රධාන සංවිධාන තුනකට අයත් ය.
4. බුදුරදුන් ලක්දිවට වැඩි සමයෙහි එහි වාසය කළ ගෝත්‍ර තුනෙන් එකක් මෙනම් විය.
5. මුවන් වාසය කළ බැවින් බරණැස ඉසිපතන පරිශ්‍රය මෙනමින් හැඳින්විණ.
7. යම් උපදෙසක් ලද පමණින් නොව තම නුවණින් විමසා භාරගතයුතු බව මෙම සූත්‍රයේ දී පෙන්වා දෙයි.
9. වලගම්බා රජු ඉදිකළ සුප්‍රසිද්ධ ලෙන් විහාරයක් මාතලේට උතුරින් පිහිටි මෙම නගරයේ ඇත.

**පහළට**

2. බුදුරදුන් ප්‍රථමවරට කිඹුල්වත්පුරයට වැඩමවූයේ මෙම ඇමතිවරයා කළ ආරාධනයෙනි.
3. ලක්දිව රජ කළැයි පැවසෙන මෙම රජුට හිස් දහයක් තිබිණියැයි සඳහන් වේ.
5. නාගසේන හිමියන් සහ ග්‍රීක ජාතික රජතුමෙකු අතරවූ සංවාදය මෙනම් වූ ප්‍රශ්නය යන නමින් ලියැවී ඇත.
6. පුණ්‍යමය ඉදිකිරීම්වල විස්තර මෙම ලේඛන මගින් නොමැකෙන සේ දක්වා තැබීමේ සිරිත පුරාණයේ සිට පවතී.
7. මෙම නම ඇති තම පුත්‍රයාට මුදල් දී පොළඹවා බණ ඇසීමට බුදුරදුන් වෙත යැවීමට අනේපිඩු සිටුතුමන්ට සිදුවිය.
8. පරිසරය පිරිසුදුව තබාගැනීමේ සත්ක්‍රියාවන් නිසා මොහු දෙතිසක් අය සමඟ දෙව්ලොවට අධිපති ව ඉපදිණි.



**පිරුවානා පොත් වහන්සේ, සප්ත බොජ්ඣංගය, මහාචාර්ය වල්පොළ රාහුල හිමියන් විසින් රචිත බුදුන් වදාළ ධර්මය ඇතුළු ධර්ම ග්‍රන්ථ කට්ටලයක් පිරිනැමේ.**

බුදුසරණ කර්තෘ, ලේක්හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ ලිපිනයට ප්‍රහේලිකාව පුරවා තැපැල්පතක අලවා, එහි දුරකතන අංකයක් ද සඳහන් කර එවීමට අමතක නොකරන්න.

# බෝධීන් වහන්සේ ගේ පුරාණය අන්තර්ගත වූ මූලාශ්‍ර



**ත්‍රිපිටකයේ සූත්‍ර පිටකය තුළ බුද්දක නිකායට අයත් ග්‍රන්ථ පහළොවට අන්තර්ගත වන බුද්ධ වංසය ග්‍රන්ථයෙහි බුදුරජාණන් වහන්සේලා විසි පස්නමක් පිළිබඳව තොරතුරු සඳහන්ව ඇත.**

බුද්ධවංසය කොටස් තුනකට බෙදේ. බුද්ධවංසය යනු කුමක් දැ යි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සංඥපනයෙහි සඳහන් වී ඇත්තේ මෙපරිද්දෙනි. එනම්, “චතුරාසංඛ්‍ය කල්ප ලක්ෂ්‍ය යක් මුළුල්ලේ ඒ ඒ අවස්ථාවෙහි සම්‍යක් සම්බෝධි සමධිගම කළ දීපංකර තථාගතයන් වහන්සේ පටන් කොට අප ගෞතම තථාගතයන් වහන්සේ තාක් පස්විසි බුදුකෙනෙකුන් වහන්සේගේ ප්‍රවේණියේ විස්තර කථාව බුද්ධවංස නම් වේ.” බුදුරජාණන් වහන්සේලාගේ ප්‍රවේණි කථාව බුද්ධවංසය වශයෙන් හැඳින්වේ. බුද්ධවංසය පරිච්ජේද වශයෙන් පහකට බෙදී ඇති බව තවදුරටත් එහි සඳහන් ය. එනම්,

1.රතන චංකමන ඛණ්ඩය
2 සුමේධ කථා
3 බුද්ධ වංසය
4 බුද්ධපකිණ්ණක. ඛණ්ඩය
5 ධාතු භාජනීය කථා

යනුවෙනි.

බුද්ධවංස සංඥපනයෙහි තවදුරටත් සඳහන්ව ඇත්තේ” “ඒ ඒ බුදුන්ගේ උපන් කල්පය, ග්‍රාමය,ගෝත්‍රය, ජාතිය, නගරය,පීතෘ, මාතෘ බෝධි, ධම්සක් පැවැත්ම, අභිසමය, ශ්‍රාවක සන්නිපාත, අග්‍රශ්‍රාවක උපස්ථායක, අග්‍රශ්‍රාවිකා පරිවාර භික්ෂූ , රශ්මි,ශරීරප්‍රමාණ, බෝධිසත්තාධිකාර විවරණ, ප්‍රධන් වීර්යය,ආයුෂය, පරිනිර්වාණය, යන කරුණු ප්‍රකාශ කරන ලද්දේය”. බුද්ධවංසයෙහි බුදුරජාණන් වහන්සේලා පිළිබඳව කරුණු විසි දෙකක් එහි සඳහන් වේ. මේ ආදී




වශයෙන් කරුණු සඳහන් කරන්නේ කුමන හේතුවක් නිසා දැයි යන්න පිළිබඳව තවදුරටත් එහි කරුණු විවරණය කර ඇත්තේ “ඉදින් ජාත නගරය මව්පිය ආදී වූ නොදක්වන්නලද්දාහු වී නම් ඔහුට උපන් තැනක්,පියෙක් මවක් නොපැනේ. මෙතෙම දිව්‍ය බ්‍රහ්ම ශක්‍ර මාරයක්ෂාදී කෙරෙහි අන්‍යතරයෙක් යැයි සිතමි”. ආදී වශයෙන් එහි ප්‍රස්තාවනාවේ දී තවදුරටත් සඳහන් කර ඇත්තේ කරහම්පිටිගොඩ සුමනසාර ස්වාමීන් වහන්සේය. බුද්ධවංසයෙහි කරුණු බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ තත්කාලීන සමාජයෙහි බිහිවූ විවිධ ශාස්තෘන්ගේ දිව්‍යමය බලවේගයන් මත ගොඩනැගුන සංකල්ප මත උපන් ස්ථානය මව පියා ආදී කරුණු දේශනා කළ බව ය. නූතනයෙහි වුව ද, බුදුරජාණන් වහන්සේගේ උප්පත්තිය පිළිබඳ ව ඉතාම වැරැදි කතා සමාජයෙහි පැතිරීම වැළැක්වීම සඳහා ද මෙය නිදසුනක් වශයෙන් භාවිත කළ හැකිය. ඒ වගේම බුද්ධවංසය ඉහත සඳහන් වන තොරතුරුවලින් අනූන ග්‍රන්ථයක් වේ. බුදුරජාණන් වහන්සේලා විසිපස් නමක් පිළිබඳව බුද්ධවංශයෙහි සඳහන් වේ.

**මෙම ලිපියේ ඉතිරි කොටස නිකිණි පුර අටවක පෝද (ජූලි 27) පත්‍රයේ පළවේ.**

**හේමමාලා රන්දුනු**

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### ඇසළ අමාවක පෝය

ජූලි 20 සඳුදා පූර්වභාග 00.10 න් අමාවක පෝය ලබා එදිනම අපරභාග 11.02 න් ගෙවේ. සඳුදා සිල්.

### නිකිණි පුර අටවක පෝය

ජූලි 27 සඳුදා පූර්ව භාග 07.09 පුර අටවක පෝය ලබා 28 අඟහරුවාදා පූර්වභාග 04.58 න් පෝය ගෙවේ. සඳුදා සිල්.

### නිකිණි පුර පසළොස්වක පෝය

අගෝස්තු 02 ඉරිදා අපර භාග 09.29 න් පසළොස්වක ලබා 03 සඳුදා අපර භාග 09.28 න් පෝය ගෙවේ. සඳුදා සිල්

### නිකිණි අව අටවක

අගෝස්තු 11 අඟහරුවාදා පූර්වභාග 09.07න් අව අටවක පෝය ලබා 12 බදාදා පූර්වභාග 11.16 න් ගෙවේ. අඟහරුවාදා සිල්

**39 වයසැති මා භාවනා මධ්‍යස්ථානයක, විහාරස්ථානයක රැකියාවක් බලාපොරොත්තු වෙමි.**
**071-7107228**

**දුෂ්කර ප්‍රදේශයක ඉදිවෙමින් පවතින චෛත්‍යයේ ඇත්පවුර, වළාකුළු බැම්ම, පැතිබැම්ම සහ අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා පිංවත් ඔබගේ කාරුණික සහයෝගය ලබාදෙන ලෙස ශාසනාලයෙන් යුතුව ඉල්ලා සිටිමි.**
අමතන්න
070-5905720 / 071-9084454
076-4271870

මිත්‍යාවෙන් බියෙන් දැවිල්ලෙන් තැවිල්ලෙන් තොර නිදහස් නිවහල් ජීවිතයකට මග
මුනිවර දේශනා
දිනපතාම උදේ 9 ට රාත්‍රී 9 ට
Peo TV Channel 18 නොවරදවාම නරඹන්න

# පිටකොටුවේ බෝධීන් වහන්සේ රැකගත් දෙමළ මුදලාලි

**බොදු දියුණුවට අත දුන් හින්දු බැතිමතකු වූ පිටකොටුව ලීලා ස්ටෝර්ස් හිටපු අධිපති එස්.ටී. සින්නදුරේ මහතාගේ 117 වැනි උපන්දින සමරුව වෙනුවෙනි.**

විදුලි බිල නොගෙවීම නිසා පිටකොටුවේ බුදු මැදුර සහ බෝධීන් වහන්සේ එදා අඳුරට පත් වී තිබුණි. මේ ආසන්නයේ වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය දෙමළ මුදලාලි කෙනකුට පසුදින උදේ මෙය දැනගන්නට ලැබුණි. බුදු මැදුර සහ බෝධීන් වහන්සේ බලා ගන්නා ආවතේවකරුට කතා කළ ඔහු ඉක්මනින් ම විදුලි බිල ගෙවන ලෙස කියා මුදල් දුන්නේ ය. අවට වෙළෙඳ ව්‍යාපාරිකයන්ට සහ පදික වෙළෙඳුන්ට පණිවුඩ යවා පොඩි රැස්වීමක් පැවැත් වූ මොහු එස්.ටී. සින්නදුරේ (ලීලා) මුදලාලි මහතා ය. ශ්‍රී ලංකාවේ සෑම පළාතකින්ම කොළඹට පැමිණෙන සියලු දෙනාට ම ප්‍රථමයෙන්ම දකින්නට ලැබෙන්නේ මේ සිද්ධස්ථානයයි. මොන ආගමක වුණත් මෙය අඳුරේ තියන්නට හොඳ නැහැ. අවට සිටින උදවිය වශයෙන් අපට එය ලොකු අවනම්බුවක්, ඒ නිසා මේ ස්ථානය අප දියුණු කරන්නට ඕනෑ. ඒ සඳහා අප ජාති ආගම් බේද ආදියෙන් තොරව සමිතියක් පිහිටුවා ගත යුතු යැයි ඔහු එදා ප්‍රකාශ කළේ ය.

පිටකොටුවේ එක්සත් බෝධිරාජ සමිතිය එදා ආරම්භ වූ මුල් අවදියේ දී සිංහල, දෙමළ, මුස්ලිම් යන ජාතිහු සහ සියලුම ආගමිකයෝ කිසිම භේදයකින් තොරව එයට ඇතුළත් වූහ.





මීට වසර 40 කට පෙර අපෙන් සමුගත් ෂන්මුගම් තම්බයියා සින්නදුරේ මහතා අප රට තුළ අනාගතයේ ඇතිවිය හැකි අභියෝග කල්තියා හඳුනාගෙන, ඒවා ජය ගැනීමට විවිධ උපාය මාර්ග ප්‍රායෝගික ව, භාවිත කළ ශ්‍රී ලංකාව එක්සත් දේශයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යන්නට අතිමහත් සේවාවක් නිහඬව සිදු කළ දේශප්‍රේමියෙකු, මානව හිතවාදියෙකු ලෙස හැඳින්විය හැකි ය.

20 වැනි සියවසේ අග භාගයේ දී එනම් 1903 ජූලි 23 ද මීට වසර 117 කට පෙර උතුරේ යාපනය අර්ධද්වීපයේ කන්කසන්තුරේ දී උපත ලැබූ සින්නදුරේ යොවුන් වියේ දී කොළඹට පැමිණ ව්‍යාපාරික කටයුතුවල යෙදෙන අතරේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි, සාගර පලන්සූරිය, පී.වී. ලැනරෝල්, මීමන ප්‍රේමතිලක, පියදස පලන්සූරිය, ඇල්.පී. දේශබන්දු, චන්ද්‍රරත්න මානවසිංහ සහ කුමාරතුංග මුනිදාස වැනි සිංහල සාහිත්‍යධරයන් සමඟ එකට එක්ව සිංහලයෙකු මෙන් ශ්‍රී ලංකාවේ නිදහස් අරගලයට දායක විය.

පසු කාලීනව 1980 මාර්තු 22 වැනි දින මියයන තෙක් අවුරුදු 60 ක් පමණ වූ කාල පරාසය තුළ මෙතුමා සිදු කළ ජාතික, ආගමික, සමාජයීය කටයුතු පිළිබඳ අවලෝකනය කිරීමේ දී මෙතුමා තුළ ආගමික සංහිඳියාව සහ සිංහල, දමිළ මිත්‍රත්වය නොබිඳෙන ලෙස ඒකාත්මික කර තබන්නට අදහාගත නොහැකි තරම් උනන්දුවක් සහ අවශ්‍යතාවයක් පැවැති බව මනාව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ උතුරින් දකුණට සංක්‍රමණය වූ මොහු කොළඹ පිටකොටුවේ බෝගහ හන්දියේ ලීලා ස්ටෝර්ස් නමින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එකල අනාරක්ෂිතව පැවැති මෙම බෝධි වෘක්ෂය ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් අවස්ථා දෙකකදීම කපා ඉවත් කිරීමට සූදානම් වූ අතර මෙම හින්දු බැතිමතා සහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඊට විරෝධය ප්‍රකාශ කිරීම නිසා එය වළක්වා ගත හැකි විය. සෑම දිනකම උදෑසන මෙම බෝධීන් වහන්සේට පුද පූජා පැවැත්වීමට පුරුදුව සිටි සින්නදුරේ බෝධිය වටා ආරක්ෂිත වැටක් ඉදිකොට ගේට්ටුවක් ද දැමී ය. පසුව බුදු කුටියක් ඉදිකොට බුද්ධ ප්‍රතිමා වහන්සේ තැන්පත් කරන ලදී. උපතින් හින්දු බැතිමතෙකු වුවත් බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය කරන්නට විශාල පරිශ්‍රමයක් දැරූ මෙතුමා වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පිරිවෙන, මහව පළමුගෙදර ශ්‍රී මංගලාරාමය, අනුරාධපුර කුරුන්දන්කුලම සද්ධර්ම විවේකාශ්‍රමය සහ ඇහැලියගොඩ සාම මහා විහාරය ආදී විහාරස්ථාන රැසක දියුණුව උදෙසා සින්නදුරේ පවුලේ සෘජු දායකත්වය ලබා දී ඇත. සිංහරාජ වන පෙදෙස් සුමංගල ජන විජය චෛත්‍යය ඇතුළු ශ්‍රී ලංකාව පුරා තවත් විහාරස්ථාන රැසක් සංවර්ධනය උදෙසා ද මොහු අනුග්‍රහය ලබා දී ඇත.

එසේ ම ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල සිතුවම් සහිත දින දර්ශනය වන ලීලා පංචාංග දින දර්ශනය මොහුගේ සුවිශේෂ තම සේවාවකි.

**නිහාල් පී. අබේසිංහ**

# අම්මාගේ සිත රිදවූ පව

## දැවෙන සිත්

**සමාජයේ ජීවත් වෙද්දි කොතරම් යහළුවන්, ප්‍රේමයෙන් බැඳුණ බිරියන්, දරුවන් සිටිය ද, සිරේ ගිය අයෙකුට අවසානයේ ඉතිරි වන්නේ මව්පියන් ය.**

ඇතැම් විට තාත්තාටත් වඩා, වැරදි කරුවෙක් වුවත් ඒ පුතු වෙනුවෙන් නොවෙනස් ව ආදරේ පුදනු කෙනෙකු ඇත්නම් ඒ අම්මා පමණි.

වසර ගණනකට සිරගතවූ තම පුතු කවදා හෝ ගෙදර එයි කියා වසර විස්සක් තිස්සේ අමාරුවෙන් ජීවිතයේ එල්ලී සිටි මවකගේ කතාවකි මේ. එමෙන්ම ඒ අම්මා වෙනුවෙන් හිර ගෙදරදී ලද පීඩනය දරා ගත්, කවදා හෝ ගෙදර ගොස් අම්මා බලාගන්නේ යැයි තමන්ටම පොරොන්දු වී සිට පුතෙකුගේ කතාවකි මේ.

"පුතා එනතුරු ජීවත් වෙන්න ලැබුණොත් මට ඒ හොඳටම ඇති"

දවසක් දෙකක් නොව, අවුරුදු විස්සකට ආසන්න කාලයක් තිස්සේ මව උදේ, සවස මල් පහන් සුවඳ දුම් පුදා බුදුන් වඳිමින් කළ එක් ප්‍රාර්ථනාවක් විය.

"පුතා ගෙදර එනතුරු ජීවත් වෙන්න ලැබුණොත් මට ඒ ඇති." දිනෙක මේ අම්මා දිගු ලිපියක් එවමින් දන්නවා සිටියා ය.

ඒ වන විට ඇය අනූ වියට ළංවෙමින් සිටියා ය. කොළඹින් බොහෝ ඈත ගමක තනිව නිවෙසේ ඇය ජීවත් වූයේ හිතේ ධෛර්යයෙනි. නොමග ගියත් ඒ පුතු වෙනුවෙන් ඈ සිතේ කොතරම් ආදරයක් තිබේදැයි කියා දැන ගන්නට නම් ඇය හා කතා කළ යුතුම ය. කොයි මොහොතේ හෝ පුතු එනතුරු මග බලා හිඳින ඒ අම්මාගේ පුතා කවුදැයි කියා හිරගෙදර ගියදිනෙක සොයා බැලුවෙමි.

"ඔව් ඒ තමයි මගෙ අම්මා. මගේ තාත්තා ප්‍රදේශයේ දරුවන්ගේ අනාගතය හැදූ කෙනෙක්. මගෙ අම්මාට තාත්තාට අයියාට කිසිවෙක් වරදක් කියන්නේ නෑ. මටත් ප්‍රදේශයේ හොඳ පිළිගැනීමක් තිබුණා. මම සේවය කෙරුවේ ආරක්ෂක අංශයේ. නමුත් නරක යාළුවන් ගේ ඇසුරට වැටුණා. කප්පම් ගැනීමේ වරදකට තමයි මාව හසුවුණේ. අපි නීතියට හසු වුණා. සිර දඬුවම අවුරුදු පනහකට ආසන්නයි. හිර ගෙදරට එනවිට මම අවුරුදු විසි 24 යි. මම වැරදිකරු වෙලා හිරේ යන කොට මගෙ තාත්තා ජීවතුන් අතර නෑ. අයියා මා වෙනුවෙන් නඩු කිව්වා. එයාට තිබුණ ඉඩ කඩම් විකුණලා මා වෙනුවෙන් නීතිඥයන් ට මුදල් වියදම් කළා.

ඒත් අවුරුදු ගාණක් සිර දඬුවමක් නියම වෙලා මම හිරේ ගියාම අයියා ඒ හිතේ අමාරුවෙන් ම අසනීප වෙලා මැරුණා. අම්මා තනි වුණා. හිරේ හිටියට මගෙ හිතට සැනසිල්ලක් තිබුණේ නෑ. මට මගේ අම්මා හැම මොහොතකම මතක් වුණා. ඇවිද ගන්න පුළුවන් කාලේ අම්මා මා බලන්න ආවා. අවුරුදු ගාණක් ගියාට පස්සේ අම්මා ට ඇවිදගන්න අමාරුයි දුර ගමන් යන්න අමාරුයි. අම්මා හිර ගෙදරට යන එන ගමන නතර වුණා.

හිරගෙදරදි හමුවූ ඔහු එක දිගටම කතාව කියාගෙන ගියේය. ඔහු හිර ගෙදර සිල් භාවනා වැඩසටහන් වලට මෙන්ම වෙනත් ක්‍රියාකාරකම් වලට එක්වෙමින් හිත සනසා ගන්නට උත්සාහ දරමින් සිටියේය. දිනෙක හිර ගෙදර ගිය විට ඔහු මා සොයා ආවේය.

"උදව්වක් කරන්න.... ඒත් මොකද්ද උදව්ව කියන්න මට තේරෙන්නේ නෑ. මගේ අම්මා ගෙදර මිදුලේ වැටිලා. මට අම්මා බලන්න යන්න ඕන.... අම්මාට කාගේ හෝ උදව් ඕන අම්මා ඔපරේෂන් කරන්න නම් මම අත්සන් කරන්න යන්න ඕන."

එහෙත් ඔහුට ගමට යන්නට බැරිවිය. අවසානයේ අම්මාගේ ශල්‍ය කර්මය සිදුකැරිණි. ඥාතී හු විසින් මේ මාතාව ආදරයෙන් බලා ගත්හ. ඉන් මාස කිහිපයකට පසු රාජකාරි ගමනක් යන අතරතුර ඇය බලන්නට ගියෙමි. ඒ වන විට ඇය සිටියේ ඇඳේ ය. ඇයට ඉඳ ගැනීමට නැගීටිමට ඇවිදීමට අපහසු ය. "දැන් ගොඩක් දුරට සනීපයි. මම මගේ පුතා එනතුරු ජීවත් වෙනවා. එයා මේ ගෙදරට එන එක තමයි මගේ එකම හීනය. මම උදේ හවස මෙහෙම ඉඳගෙන බුදුන් වඳිනවා. මගෙ පුතා තමයි මගෙ ජීවිතය."


ඒ අම්මා හිතේ ධෛර්ය පෙර දැරිව පැවැසුවා ය. කාලය ගෙවිණි. අම්මාගේ ප්‍රාර්ථනය ඉටු වූවාය. අවසානයේ පුතු ගෙදර ආවේය. ඒ වන විට ඇය යාන්තම් රෝද පුටුවේ ඉන්නට හුරුව සිටියා ය. ගරා වැටුණ ගෙවල් දොරවල් යළි පිළිසකර විණි. මිදුලේ මල් පැළ එළවළු සිටුවා කල එළිකරනු ලැබිණි. මේ සියල්ල කළේ හිරගෙදරින් පිටව ආ පුතු ය.

"මං දුරදිග නොබලා කරපු වරදක් නිසා අපේ මුළු පවුලම දුක් වින්දා. අම්මා ගේ හිත රිදවපු පව කවදාවත් මට ගෙවලා ඉවර කරන්න බැරි වේවි. අම්මා මා වෙනුවෙන් හැම මාසෙම තාත්තාගේ පැන්ෂන් එකෙන් ලැබෙන මුදලින් මගේ බැංකු පොතේ ගාණක් ඉතිරි කර තිබුණා. ඇය මං ගැන හිතපු තරම් මට ඇය ගැන හිතන්න බැරි වුණා නේද කියලා හිතෙනවා. මම දන්න හැමෝටම කියන්නේ කවමදාවත් අම්මාට ගින්දර දෙන්න එපා. ඒක ගෙවා ගන්න බැරි පවක්. හිර ගෙදරදී මම භාවනා කළා. බණ ඇහුවා. ඇතේ කර්මාන්ත බොහෝමයක් ඉගෙන ගත්තා. දැන් මගේ දවස ගෙවෙන්නේ අම්මා සමඟ. ඇය නාවලා, කවලා, පොවලා රෙදි සෝදලා බෙහෙත් දීලා ඇගේ සියලු කාර්යයන් කරන්නේ මම. මං ගෙදර ආවට පස්සේ අම්මා බොහෝම සතුටින් ඉන්නවා කියලා මට දැනෙනවා. අම්මා තමයි මගෙ ජීවිතේ යහමගට ගත්තේ."

ඔහු පවසන්නේ දෑත් එක්කොට අම්මාගේ ගුණ සිහිකරමිනි.

**ඉනෝකා සමරවික්‍රම**

සිරිමත් එඩ්වින් ආනල්ඩ් ගේ THE LIGHT OF THE ASIA (ආසියාවේ ආලෝකය) ඉංග්‍රීසි බසින් ලියැවුණු පළමු බෞද්ධ සාහිත්‍ය නිර්මාණය ඇසුරෙනි 03






කොළඹ මහානාම විද්‍යාලයේ ආචාර්ය
කොලොන්නාව පුරාණ විහාරවාසී
**සියඹලාගොඩ ධම්මින්ද හිමි**

# ළදරුවාණනි නමදිමි ඔබ ඔහු තමා...

**පිළිසිඳ ගැනීමෙන් අනතුරුව නිසි මාස සම්පූර්ණවීමෙන් ලුම්බිණී සල් උයනේ දී සිදුහත් උපත සිදුවූ බව බොහෝ දෙනා දන්නා සිදුවීමකි. විශේෂයෙන් බෞද්ධ දුවා දරුවන් ඉතාම බාල කාලයේ දී මේ අවබෝධය ලැබූවන් වේ.**

මෙම සිදුවීම ඉහත කවිය තුළ දී පුණ්‍ය ශක්තිය පිළිබිඹු වන අයුරින් මෙන් ම අවබෝධය පුළුල් වන ලෙස පැහැදිලි කෙරේ. මාහා මායා දේවියට දරු ප්‍රසූතියේ දී කිසියම් ම හෝ වේදනාවක් දැනෙන්නේ නැත. උපතින්ම කුමරා ගෙනෙන ලද අනුහස්, නායකත්ව ලක්ෂණ කවියා ඉතා අපූරුවට වඩන බවට පත් කිරීම ආස්වාද ජනකය.

"නොකැළැල් සපිරි සිරුරින්නත් පින වන්නේ"

දකින කෙනෙකුට ආදරයක් ගෞරවයක් උපදින ආකාරයේ සිරුරක් සිදුහත් කුමරුට තිබූ බව කවියා පැහැදිලි කරයි. දකින හැමෝට ම නෙතට ප්‍රිය උපදවන සුළු ය. බුදු දහමේ උගන්වනු ලබන 'රූපපසන්න' ගුණය එතුමා ඉතා හොඳින් හැඳින සිටි බවට මෙය හොඳ අවස්ථාවකි.

ලක්ඛණ සූත්‍රයේ දී අප ඉගෙන ගෙන ඇති 32 ක් වූ මහා පුරිෂ ලක්ෂණ කවියා උපතේ දී දිස් වූ අයුරු විස්තර කෙරේ. එය පින්වත් කුමරුවෙකුට ලැබෙන ලාභයකි.

'පින්වත් දෙතිස් සලකුණු එහි දක්වෙන්නේ'

උපතේදීම බුද්ධත්වයට අවශ්‍ය දෙතිස් මහා පුරිස ලක්ෂණ මෙන්ම අසූවක් අනු ව්‍යාඤ්ජන පින්වත් කුමාරයා සතු වූ බව මෙයින් අබෞද්ධ ලෝකයට පවා අවබෝධය සකසා ගත හැකි වේ.

සිදුහත් කුමරුගේ උපත නිසා රජතුමා පමණක් නොව මුළු රාජ්‍යයම ප්‍රීති ප්‍රමෝදයට පත්විය. එම සිදුවීම් මාලාව කවියා ඉතා සිත් ගන්නා ආකාරයට වර්ණනයට ලක්කිරීම මෙහි ඇති ඉතා සුවිශේෂී අවස්ථාවයි.

●දෙව්ලොව බුදු කෙනෙකුන් ගේ – දැන උපතෙහි ඉහළ අගේ

මහ සොම්නස් මනු ලොව ගැන ඇති කරගත්තා. බුදු කෙනෙකුගේ පහළවීම පිළිබඳ මිනිස් ලෝකය මහත් සේ සතුටට පත්වීම මෙහිදී පැහැදිලි කෙරේ. එපමණක් නොව පෙරදිග අධිපති දෙවියන්, කුම්භාණ්ඩ සේනාව සමඟ දකුණෙන් පැමිණි දෙවියන්, නාග පිරිස් සමඟ පැල දිගින් පැමිණි දෙවියන්, යක් පිරිස සමඟ උතුරු දෙසින් පැමිණි දෙවියන් මේ සියලු සේනා සිදුහත් උපත නිසාම පැමිණි අය වූහ. ඒ බව "රිදී සළු ද, මුතු සැට්ට ද හැඳගත් පිරිවර සමඟින් පෙරදිග අධිපති දෙවියෝ" කවියෙන් පැහැදිලි කෙරේ. කුමරුගේ ආශ්චර්යවත් බව කෙතරම්ද යන්න බලවත් වූ සතරවරම් දෙවියන් කුමරු සහ දේවිය වඩම්මන දෝලාවේ සිව් කොණ දෝලා පොලු ගත් බව සඳහන් වේ.

අයගේ හැඩ රුවින් පැමිණ ඒ දෝලා පොලු ගත්තෝ"

සේවක වෙසින් පැමිණ කුමරුට ගෞරවයක් ලෙස දෝලාව කරට ගැනීමට සතර වරම් දෙව්වරු කටයුතු කළ බව පෙනේ. ඒ තුළම කුමරුගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි ය. මේ සියලු සිදුවීම් එකින් එක කණවැකීම නිසාම තම පුතු පින්වත් දරුවෙකු බවට සුද්ධෝදන රජු කිසිම සැකයකින් තොරව අවබෝධ කරගත්බව කවිය තම කෘතියේදී ඍජුව ප්‍රකාශයට පත්කර ඇත.

"ඒ මහිමවත් කුමරෙකු බව සැකක් නැත"

කුමරාගේ දුර්ලභ උපත ලෝකයාට ඒත්තු ගැන්වීමට බෞද්ධ ශබ්ද කෝෂයේ ඇති ඉතා වටින වචන කිහිපයක් ආනල්ඩ් මහතා භාවිත කොට ඇත. දෙව්සක් = දිව්‍යචක්‍රය යන්න ඊට කදිම නිදසුනකි. කුමරාගේ උපත නිසාවෙන් ඔද වැඩී ගිය. ශාක්‍ය ජනපදය ඒ වෙනුවෙන් එක්සිත් ව පෙළ ගැසුණි.

මං මාවත් පිස දැමුණේ
මල්හි සුවඳ එහි ඉසුණේ
තුරු මත දැල්වුණු එළි සිළු
අතරේ දද වැලි සැලුණේ

පරිසරය ඊට සුදනම් වූ අයුරු ඉතාම සොඳුරු ලෙස කවියා දැක ඇති බව මෙයින් පෙනේ. පරිසරය පවා මේ උපත මහත් ආශ්චර්යක් කොට සිතන බව මීට වඩා උපමා රූපක අවශ්‍ය නොවේ. එසේම සමාජයේ සෑම තරා තිරමක කෙනෙක්ම මෙම උපතේදී සතුටු වූහ.

"කුමර උපතෙහි පුවත ලද නන් දෙසින්
නැව් පෙළ පැමිණියේ"

එසේම විවිධ කලා ශිල්ප මත වීථි අලංකරණයට මග පෑදුණි. විවිධ සැරසිලි ඇඳුම් ආයිත්තම් වලින් බොහෝ දෙන අලංකාර වූහ. මේ සියල්ලටම ප්‍රධානතම හේතුව පින්වත් බෝසත් උපතයි. මේ සියල්ල සමඟින් ම රාජ්‍ය චාරිත්‍ර ධර්ම අනුව කුමරුට සුදුසු නමක් බමුණන් 108කගේ සහභාගිත්වයෙන් තැබීමට තීරණය කළහ. සාමාන්‍ය ලෝකය දන්නා මෙම සිදුවීම ඉතා අරුත්බර සහ සෞන්දර්යයෙන් යුතුව කවියට නැඟීම තුළම මෙම ග්‍රන්ථයට මහත් වටිනාකමක් එකතුවූවා යැයි පැවසීම අතිශෝක්තියක් නොවේ. ස්වාර්ථ සිඩියි එ කුමරාණන් "සිඩ් අත්ථියි නම් තැබූ ඉන්

යහපතක් අර්ථයක් සිදුකරන යන අරුතින් කුමරුට සිද්ධාර්ථ යන නම තැබීය. දෙවියන්, බමුන් පවා ඉන් ප්‍රීති ප්‍රමෝදයට පත්ව සාධු කාර දුන්හ. තම ශිෂ්‍යයාගේ කුළුඳුල් පුතු ප්‍රීතියට අසිත තවුසා පැමිණෙන්නේ මේ අතර ය. ගුරු භක්තිය මත රජු තම තවුස් ගුරුවරයාට වැන්දවීමට කටයුතු කිරීමේ මහත් අසිරිමත් දෙයක් සිදුවේ. එනම් කුමරුගේ පාදය තවුසා ගේ ජටාවේ වැදීමයි. අනාගතය දකින තවුසා වහා නැඟිට කුමරුට වන්දනා කළහ.

"හා ළදරුවාණනි"
නමදිමි ඔබ ඔහු තමා

තවුසා බලාපොරොත්තු වන අනාගත ලෝකය දුකින් මුදාලන උත්තමයා මේ කුමරු බව සැකහැර දැනගනී. තවුසා පළමුව සිනාසී පසුව හඬන්නේ එතෙක් තම ජීවිතය නොපවතින බැවින් පියරජු ගේ පළමු වැඳීම සිදුවන්නේ ද මේ මොහොතේ දී ය. පින්වත් දරුවාගේ උපත පිළිබඳ එහිදී තවුසා ගේ ප්‍රකාශය කවියා ඉතා අලංකාරවත්ව වර්ණනා කිරීම මෙතනදී සුවිශේෂී ය.

සුවහස් ගණන් වසරින් එක් වරක් දුල
මිනිස් වග රුකෙහි සුපිපෙන අනගිමල
මේ වෙයි නුවණ සුවඳත් මෙත් පැණින්
සල
එ මලින් ලොවම පුරවා ලයි නුදුරු කල
මහා කල්ප ගණනකට වරක මිනිස්

නැමති ගසේ පිපෙන අනර්ඝ මලක් හෙවත් පුෂ්පයකි. මලෙහි තවත් සුවිශේෂී බවක් ඇත. එනම් නුවණ නැමති සුවඳක්, මෛත්‍රිය නමැති මල් පැණිත් ය. අනාගතයේදී මේ මල ලොවම සෞභාග්‍ය කරා ගෙන යන බව ඉතා අව්‍යාජව කවියා අභීත සිතුවිල්ල වචන බවට පෙරළා ඇත.

**O පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි**
55 වියැති මාතාවකට O + වර්ගයේ වකුගඩුවක් අවශ්‍ය වී ඇත. කාරුණික පරිත්‍යාගශීලී අයෙක් ඇත්නම් අමතන්න.
**0718053214**

## සැරියුත් මුගලන් තෙරවරු පුංචි අපට කලණ මිතුරු

අප ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ශාසනයේ දී අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රාර්ථනා කළහ. අනාදිමත් කාලයක සිට පෙරුම්පුරා, ගෞතම සම්බුද්ධ ශාසනයේ දී උපතිස්ස කෝලිත යන නමින් ඉපදුණ හ. කල්‍යාණ මිතුරන් සම්බුදු සසුනේ පැවිදි ව උතුම් වූ අග්‍ර ශ්‍රාවක තනතුරු ලබාගත් සේක. උන්වහන්සේ අපට ද කල්‍යාණ මිත්‍රයන් වහන්සේ වූහ. බාලයන්ගේ ආශ්‍රය නොලැබේවා.

**මිනුවන් ධනංජන විජේරත්න**
04 ශ්‍රේණිය, ධර්මෝදය දහම් පාසල – වරකාපොල

# සදහම් අරණ



## මිත්තණියගේ වියෝව

මාගේ ආච්චි අම්මා (මාගේ පියාගේ මව) හරිම හොඳයි. කරුණාවන්තයි. අප ඇය හොඳින් රැකබලා ගත්තා. ඇය අපට ආදරෙයි. අප නිවසෙහි දිවි ගෙවන ලද ඇය අවුරුදු 85 ක් ආයු වළඳා පසුගිය මැයි මස 26 වෙනි දින අභාවප්‍රාප්ත විය. එය දැනගත් අපි සැවොම සංවේගයට පත්වීමු. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික සේවිකාවක් වූ මගේ මිත්තණිය එහි සේවයෙහි යෙදී සිටි සමයෙහි දී ප්‍රදේශයේ රෝගී ජනතාව, තුවාල සඳහා බෙහෙත් දමා ගැනීමට ඇය වෙත නිරතුරුව පැමිණ තිබෙනවා. ඒ මගේ මිත්තණිය ඒ සඳහා ඔවුන් ගෙන් කිසිදු මුදලක් අය නොකර නොමිලයේ ම රෝගීන් සුවපත් කර ඇති හෙයින් යැයි පාංශුකූලය සඳහා අවමඟුල් උත්සවය වෙත වඩින ලද ගරුතර මහා සංඝරත්නය විසින් පැවසුවා. සදහටම වෙන්ව ගිය අපේ ආච්චි අම්මාට මම නිවන් සුවය ප්‍රාර්ථනා කරමි.



**ඉසුරු ආඪ්‍ය කළුතන්ත්‍රි ලියනගේ**
09 ශ්‍රේණිය,
ශ්‍රී ජිනරතන ධර්ම විද්‍යාලය
රත්මුතුගල

## බවුන් වඩන අරණකි සදහම් අරණ

සතර පොහොය කවදා දැයි දින ගණින
අහල පහළ කාටත් දම් රස බෙදන
සතිය පුරා කියවා සුරැකිව තබන
සදහම් මංජුසාවකි අපෙ බුදු සරණ

දහම් පාසලේ අතිනත සැරි සරණ
තම නිර්මාණ දැක සතුටින් රොද බඳින
බොදු ඔවදන් පෙළක් කැටි කර තිබෙන
බවුන් වඩන අරණකි සදහම් අරණ

දහම් දැනුම රැගෙන සිතට
බොදු පිළිවෙත් ලොව හමුවට
ඔවදන් දෙන ළමා පෙළට
තුති පුද දෙමු බුදු සරණට

**නාකුඹුරේ අස්සජි හිමි**
3 වන ශ්‍රේණිය, ශ්‍රී බෝධිලංකාර පිරිවෙන
කතරගම

## තෙරුවන් සරණ ගියෙමි

අපට උතුම් බුදුදහම ලැබුණේ උතුම් පොසොන් පොහෝ දිනකයි. පින් පව් මොනවද කියා මිහිඳු මහ රහතන් වහන්සේ අපට කියා දුන්නා. අනුරාධපුරයේ මිහින්තලා පුදබිමේ වැඩ හිඳ දේවානම්පියතිස්ස රජතුමාට කතා කළා. පසුව උන්වහන්සේ රජතුමාට චූල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් ධර්මය දේශනා කළා. ඒ උතුම් තෙරුවන් සරණ ගිය දරුවෙකි මම.


**දීත්ම සජාර ජයසිංහ**
2 වන ශ්‍රේණිය
සිරි විමලසිරි ඉංග්‍රීසි දහම් පාසල

## උතුම් ශ්‍රී පාදස්ථානය

ශ්‍රී පාද වන්දනාව ආරම්භ වනනේ සෑම වසරක ම උඳුවප් පොහෝ දිනයේ දී ය. වෙසක් පොහොය දිනයෙන් ශ්‍රී පාද වන්දනා වාරය අවසන් වේ. අනෙකුත් මාසවල දී ශ්‍රී පාද කන්ද නැඟීම දුෂ්කර වන ප්‍රධාන හේතුවක් වන්නේ එම මාසයන්හි ශ්‍රීපාද කන්දට අධික වැසි ඇදහැළෙමින් තද සුළං හා ඝන මීදුම පවතින නිසා ය. ශ්‍රීපාද කන්ද නැඟීම හා බැඳුණු සාම්ප්‍රදායික ක්‍රියා පිළිවෙත් පවතී. රාත්‍රී කාලයේ දී ශ්‍රී පාද කන්ද තරණය කිරීම අපූර්ව අත්දැකීමකි. විදුලි බුබුළු වලින් ආලෝකමත් වූ මාර්ගය වන්දනාකරුට දිස්වන්නේ තරු කරා දිවෙන මාර්ගයක් ලෙස ය. ශ්‍රී පාද වන්දනාකරුවන්ගේ අභිප්‍රාය වන්නේ සූර්ය උදාවට ප්‍රථමයෙන් කඳු මුදුනට නැගීම ය. "ඉර සේවය" නමින් ජන වහරේ මෙය හඳුන්වන අතර, කඳු මුදුණේ දී සූර්ය උදාව නැරඹීම කිසිදා අමතක නොවන අත්දැකීමකි.

**රශ්මි නයන්තරා**
8 ශ්‍රේණිය, රේවත දහම් පාසල – බොරලැස්ගමුව

## ළමා ප්‍රහේලිකා අංක 19



**ප්‍රථම ජයග්‍රාහකයා සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ත්‍රිපිටක ග්‍රන්ථ සම්පාදක මණ්ඩලයේ ලේකම් කේ.කේ. සුගතපාල මහතාගේ අනුග්‍රහයෙන් වටිනා ත්‍යාගයක් පිරිනැමේ.**

### හරහට

1.පස්මහ බැලුම්වලින් පළමුවැන්නයි
4.සිංහල සංදේශ කාව්‍යයන්ගෙන් එකකි
5.මෙවන් වෙලාවකින් වැදගත් කටයුතු ඇරඹීම මෙරට පවතින සිරිතකි
7.නව ග්‍රහයන්ගෙන් එකකි
8.සිත කිළිටි කරන ධර්මවලට කියන නමකි

### පහළට

1.පුද්ගල ශරීරයේ ආයතනවලින් එකකි
2.ශාක්‍යයන්ගේ මානය නැසීම වැනි අවස්ථාවලදී බුදුරජාණන් වහන්සේ මෙවන් මහා ප්‍රාතිහාර්ය පෑ සේක.
3.දෙව්ලොව පවතීයයි දක්වන මල් වර්ගයකි
6.මෙම මාසය තුළ අකුණු ගැසීම අධික යයි පැවසේ
7.බුදුරදුන් තපස්සු සහ භල්ලුක දෙබෑයන්ට දුන්නේ මෙම ධාතුන් ය


සංස්කරණය නයනා නිල්මිණී


## හොඳ පුරුදු



අලුයම අවදි වී මුවකට සෝදන්න
සැදැහැ සිතින් උතුම් තෙරුවන් නමදින්න
අම්මා තාත්තා වැඳ පාසල් යන්න
පාසලේ තියෙන වැඩ හරියට කර ගන්න

**හසලී දෙනෙත්යා**
ඕපාත මහ විදුහල
අවිත්තාව

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :– ..................................................

**පාසල / දහම් පාසල** :– ..................................................

**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :– ..................................................

**ලිපිනය** :– ..................................................

**දුරකථන අංකය** :– ..................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

## අපේ පන්සල



**චන්දිම හිමි**
03 වන ශ්‍රේණිය – ප්‍රඥානන්ද මහා පිරිවෙන – මහරගම

## පිණ්ඩපාතයේ වඩිනවා



**වලපනේ චතුරංසි හිමි**
02 වන ශ්‍රේණිය
ශ්‍රී ප්‍රඥානන්ද මහා පිරිවෙන – මහරගම

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජයේ සාමාජිකයෝ

**635 ජී. ඩී. හෂාන ධනුෂ්ක - 07 වන ශ්‍රේණිය**
**ශ්‍රී ධර්මරාජ දහම් පාසල - වෙල්පල්ල**

**636 ඒ. හසිති ඉමාෂා - 03 වන ශ්‍රේණිය,**
**ශ්‍රී පේමානන්ද දහම් පාසල – පානදුර**

**637 ඒ. ඇම්. වෙනුදි සිතුලිනි - 04 වන ශ්‍රේණිය,**
**ශ්‍රී සෝමානන්ද දහම් පාසල –යක්විල**

**638 ඇම්. ලසිදු චාමික - 04 වන ශ්‍රේණිය**
**බෞද්ධාලෝක විදුහල – පානදුර**

**639 පී. කෙමින්දි හසාරා - 05 වන ශ්‍රේණිය**
**සිරි විමලසිරි දහම් පාසල - පොල්පිටිමූකලාන**

## පැණ විසඳුම්


දයාවංශ ජයකොඩි සහ සමාගම


**පහත සදහම් ප්‍රශ්නයට පිළිතුර පැහැදිලි ව ලියා අප වෙත එවන්න.**

උතුම් ආමිස පූජාව පිළිබඳව කෙටියෙන් නිර්මාණාත්මකව ලියා අපවෙත එවන්න.

..................................................

ජයග්‍රාහී දරුවෙකුට දයාවංශ ජයකොඩි සහ සමාගමෙන් දහම් පඩුරක් පිරිනැමේ.

# පහන් සිතක කවි

## සම්බුදු ගුණ මහිම

සම්බුදු ගුණ දෙසීම යි බෝපත් හඬේ සිලි සිලි යයි
වාතලයම පිරිසුදු වෙයි ජීව බලය ඉස් මතු වෙයි
පෙනහළු යුගල පණ ගැන් වෙයි
රෝ දුක් බිය දුරුවී යයි
සිත කය මනස පැහැ ගැන්වෙයි
ආනාපාන සතිය වැඩෙයි

**එස්. මල්ලිකා ජයසිංහ**
පානදුර



## පවින් මිදෙමු

මුවින් කියන දේ ගැන සැම සිත යොමු කරමු
පවින් මිදෙන්නට නිරතුරුවම වෙර දරමු
දුරින් පෙනෙන නිර්වාණය ළං කර ගනිමු
බවුන් වඩා සිත් තුළ කෙලෙසුන් දුරු කරමු

ගාල්ල කාලිංගවත්තේ **ජී. පියදස**

## නිබ්බාණං පරමං සුඛං



මලක් පිපුණා
ගියා පරවී
ඇලුණේ නෑ ගැටුනෙ නෑ
මිලාන වූ මල
සාරයක් නෑ පැවැත්මක් නෑ
දහම මෙලෙස යි සිද්ධ වන්නේ
සතුටු කඳුළුයි වගුරවන්නේ

**වැලිකරේ ඤාණවංස හිමි**

## ධනය

බුදු හිමියන් වදළ දහමෙ හරය වෙත
යොමු කළ විටදී අප සැමගේ දහම් සිත
විසඳුම් වලට මේ සඳහා කළ යුත්ත
දහමෙන් අපට දෙන පිණිවිඩ තිබෙනු ඇත

මොලගොඩ **පාලිත බණ්ඩාර ජයකොඩි**

## යහ පුරුදු

වැඩිහිටියනට කීකරු වීලා
කියනා දේ පිළිපැදලා
හොඳ ගුණ දම් වඩලා
ඉමු හොඳ බොදු දරුවකු වීලා
හරි වැරැදි දැනගෙන
වැරැදි අහකට පන්නා
යහපුරුදු දැනගෙන
ඉමු සතුටින් සැම දින

**එච්. ඒ යශ්මි ඉමාෂා හෙට්ටිආරච්චි**
වැරැල්ලගම සිරි පියරතන දහම් පාසල
අලව්ව

## සසරක කෙළවර

බෝසත් කුමරු මව් කුස පිළිසිඳ ගැනුම
රාහුල කුමරුගේ උපතත් සිදු වීම
සිදුහත් කුමරු ගිහිගෙය නික්මී යාම
ඇසළ පෝ දිනක මේ සැම සිදු වීම

සසර සතුන් සසරින් මුදවා ලන්න
සසර කළකිරී ගිහිගෙය හැර යන්න
සසර ගමන කෙළවර කරවා ගන්න
සසර සයුර තරණය කළෙ ඒ ලෙසින

**ශීලා ජයකොඩි**
තඹුත්තේගම

මෙවර ජයග්‍රාහී කවිය

## ගමන හා සැපය

වසුරු කද ගෙන
වෙහෙස දුක විඳ
ඇදෙන ගමනකි
නිමාවක් නැති
අසුරු සැණයකි
සුවය දුක නැති
එහිම එලයකි
දුකම උපදින
එකම සුවයකි
සදකාලික
නිවන යන එය
තිලොව සැපයකි

මිරිජ්ජවිල **සිරි දන්තනාරායන**

## ලෝකයා

සිතූ දේ පේනවා
ඇසෙනවා දැනෙනවා
සිතින් නිමවුන
ලෝකයක් මේ
මුලාවී ලෝකයා
පරතෙරක් නැති
සසර මඟ ගෙවා
මෙහි දෙවට පාරට
බැණ අඬ ගහනවා



පරගම්මන - **නන්ද**

## නොපමා සිත

ජීවිතයට අපේ එක මොහොතයි ඇත්තේ
ඇතවුණ සියලු දෙය අනියත බව සත්තේ
පමා වුණෝතින් හෙට දවසක් නැත්තේ
නොපමා සිතයි රුදු සසරෙහි ජය ගත්තේ

**අශෝකා අබේවරුධන**
කැටඹුලාව

## ගත සිත සෙත

දිරිය වඩා දැහැමි බවෙන් ගත පණ ගන්වමු
අත සරු වී ගත බලයෙන් කුස පුරවාගමු
පිරුණු කුසින් නිරෝගීවී සිත පුරවාගමු
සිත ශක්තියෙ සමාධියෙන් සසර කතර ජයගමු

කිතුල්ගල **රත්නසේකර රූපසිංහ**

## අම්මා

තෙරුවන් සරණ මට පහද දුන් අම්මා
ලොව තතු මෙය යි මට පෙන්වා දුන් අම්මා
පියාණන්ගෙ ගුණ වටහා දුන් අම්මා
මතු භවයකදී බුදු වේවා මගෙ අම්මා

**ලයනල් දසනායක**
පන්නිපිටිය



## නිවනම පතමු

පිදු මේ සුවඳ මල් මැලැවෙන අයුරු සිතා
විදසුන් වඩමු මොහොතක් අප නිවන් පතා
අසුරක් ගයන මොහොතක් භවයක් නොපතා
නිවනම පතමු සසරම බියකරුයි ඉතා

**චන්ද්‍රලතා හපුආරච්චි**
මණ්ඩාවල

## වෙනසක් මොටද?

බුද්ධ, ධම්ම, සහ සඟ ගුණ පෙරටු කොට
ලියවෙන සාරවැකි බුදුසරණින් යසට
අනියත ජීවිතේ ඇති තතු දැන ගන්ට
සරණ යි බුදුසරණ සැමදා අප සැමට

**උඩකිරුවේ පඤ්ඤසාර හිමි**
ජනතාපුර

## වඳිමි මුනි

දෙව්ලොව වාසි දෙවියන් හට සත්ථාය
මනුලොව වාසි මිනිසුන් හට සත්ථාය
දෙදෙව් ලොවම වාසී මුනි සත්ථාය
සිහි කර වඳිමි ගුරු වූ ගුණ සත්ථාය

**ගමරාලලාගේ සීලවංශ බණ්ඩාර**
පොල්ගහවෙල

## විකල්පය

තෙවැනි සිල්පදය
කැඩුවෙ නැහැ මම
හොඳින් රැක්කා
පන්සිල්
සිතට සැනසුම
සොයා ගෙන
පෝයට රැක්ක
අටසිල්
ආදර හිමියනේ
මගේ පණ වැනි
සිරිමල්
කරයි නම් ඔබ මට
තවත් හිරිහැර
ගන්නවාම යි දස සිල්

**දයානන්ද පොන්නම්පෙරුම**
හෝමාගම

## කුසල් වඩමු

පෙර පින් බලෙන් ලැබුණා මිනිසත් භවය
රැකගන්නට යළිත් භවයක ඒ උපත
නිරතුරු අසන්නට බුදු බණ යොමා සිත
ජීවත් වන්න සිතමින් මිය යනවා ය අද

**කේ. ඒ ශෂිකලා රසාංජලී වික්‍රමරත්න**
රත්නපුර



## කවි කිවිඳියනට සතර පෝදාටම දහම් තුටු පඬුරු

**බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස ඉල් පුර පසළොස්වක පෝද සිට දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.**

බුදුසරණ
**පහන් සිතක කවි**
BCC

**සම්පූර්ණ නම** :- ...............................................

**ලිපිනය** :- ...............................................

**දුරකථන අංකය** :- ...............................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.**

සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

**'සිංහල අටුවා පාලි භාෂාවට නැඟූ අටුවාචාර්ය බුද්ධඝෝෂ හිමි' ලිපියේ ඉතිරි කොටස ඇසළ පුර අටවක පෝද (ජූලි 27) පත්‍රයේ පළවේ.**

# ස්තූප වර්ග හඳුනාගනිමු

ලංකාවේ බෞද්ධ ස්තූප 3



රුවන්වැලි සෑය

**බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ දීර්ඝ වශයෙන් විස්තර වන්නේ මහා පරිනිබ්බාන සූත්‍රයේ ය. බුදු , පසේ බුදු, මහරහත්, සක්විති රජ යන පිරිස මහා පුරුෂයන් සේ සැලකෙන බව එම සූත්‍රයේ සඳහන් වේ. මේ මහා පුරුෂයන්ගේ ජීවිතාවසානයෙන් පසු ශාරීරික ධාතු තැන්පත් කොට ස්තූප කරවීම බුදුරජාණන් වහන්සේ අනුදැන වදාරා තිබේ.**

බුද්ධ පරිනිර්වාණයෙන් පසු ධාතුන් වහන්සේ තැන්පත් කොට ස්තූප අටක් තැනූ බව සඳහන් වේ. ධාතුන් වහන්සේ බෙදූ ද්‍රෝණ නම් බමුණා ධාතු බෙදූ බඳුන තැන්පත් කරමින් ද, පිප්ඵලී වනයේ මෞර්යයෝ ශ්‍රී ශරීරය දැල් වූ සෑයේ අළු කොටස් තැන්පත් කරමින් ද ස්තූප ගොඩනැගූ බව සඳහන් වේ.

ප්‍රධාන වශයෙන් ම ස්තූප වර්ග සය ආකාරයක් වන බව සලකන අතර ඉන් ඝණ්ඨාකාර, ඝටාකාර, බුබ්බුලාකාර ස්තූපයන් පිළිබඳ ව පසුගිය පෝය දින විස්තර කෙරිණි. හතරවන ආකාරය **ධාන්‍යාකාර ස්තූපයයි**. එනම්, ධාන්‍ය ගොඩක ස්වභාවයෙන් යුතු වීමයි. ථූපාරාම ස්තූපය මුල් අවධියේ තිබී ඇත්තේ මෙම හැඩයට බව ඓතිහාසික සාධක වේ. කැලණි ස්තූපය දැනට මෙම හැඩයෙන් යුත් එකම ස්තූපයයි. මහින්ද හිමියන් විසින් ශ්‍රී ලංකාවට මෙම හැඩයේ ස්තූප හඳුන්වා දෙන ලද බව ද පැවසේ. ඊට අමතරව උතුරු මැද පළාතේ ඔත්තප්පුවෙන් මෙවැනි දගැබක නටබුන් සොයාගෙන ඇත. කැබැල්ලෑලෙන, පණික්කන්කුළම යන ස්ථානවල ද මෙම හැඩයේ ස්තූප ඇතැයි සඳහන් වේ.

**පද්මාකාර** – ධාතු ගර්භය පද්මයක හැඩයෙන් යුතු ස්තූප මේ නමින් හඳුන්වයි. ශ්‍රී ලංකාවේ දැනට මෙවැනි හැඩයේ ස්තූප විරල ය. දැදිගම කොට වෙහෙර කැණීමේ දී මේ හැඩයේ කුඩා ස්තූපයක් ධාතුගර්භයෙන් හමු වී ඇත. පොළොන්නරුවේ දෙමළ මහා සෑය, බුත්තල යුදගනාව ද මෙම හැඩයට සමීප වේ.

**ආමලාකාර** – ආමලක හෙවත් ආමලකී යනුවෙන් හැඳින්වෙන්නේ නෙල්ලි ගෙඩියයි. එනම් නෙල්ලි ගෙඩියක හැඩයෙන් යුත් ස්තූපයයි. කුඩා වුව ද බොහෝ ගුණ ඇති සුවිශේෂී ඵලයක් නිසා ද, නැතිනම් වෙනත් විශ්වාසයක් නිසා මෙම හැඩය ආදේශකොට ගත්තේ ද යන්න අපැහැදිලියි. කෙසේ නමුත් මේ හැඩයේ ස්තූපයකට ලංකාවේ නිදසුන් නැත. දෙවැනි අග්බෝ රජු ආමලක චේතිය නම් ස්තූපයක ඡත්‍රය කරවූ බව ථූප වංශයේ සඳහන් වේ.

මෙම ප්‍රධාන හය ආකාර වූ හැඩයන්ට අමතරව **පලාණ්ඩවාකාර** – එනම්, ළූණු ගෙඩියක හැඩයෙන් යුත් ස්තූපයයි. නැදිගම්පල ස්තූපය මේ හැඩයේ යැයි සැලකේ.

**අණ්ඩාකාර** – අණ්ඩ නම් බිත්තරයයි. එනම් බිත්තරයක හැඩයෙන් යුත් ස්තූපකි. මෙම හැඩයේ ස්තූප විරල නමුත් ප්‍රකට ස්තූපයක් ඇත. ඒ මිරිස වැටිය ස්තූපයයි. රුවන්මැලි සෑයෙන් ලැබුණු කරඬුවක මෙවැනි හැඩයේ ධාතු කරඬුවක් හමුවී ඇත. ඉඳිකටු සෑයේ හැඩය ද මේ හැඩයට ආසන්න වේ.



කැලණිය ස්තූපය



පොළොන්නරුව සත්මහල් ප්‍රාසාදය



දඹදිව කුසිනාර නුවර පරිනිර්වාණ ස්තූපය

**චතුරශ්‍රාකාර** – මහායානික ආභාසය ඇතිව නිර්මාණය වූ ස්තූප අතරින් එක් වර්ගයකි. මහායාන රටවල ඇති පැගෝඩා මීට උදාහරණ වේ. ශ්‍රී ලංකාවෙන් හමුවෙන මෙවැනි ස්ථූපයකට හොඳම නිදසුන වන්නේ පොළොන්නරු සමයේ දී මහා පරාක්‍රමබාහු රජතුමා විසින් කරවූයේ යැයි සැලකෙන සත්මහල් ප්‍රාසාදයයි. එක මත එක පිහිටන්නා වූ ද, එකිනෙකට කුඩා වෙමින් නැඟෙන්නා වූ ද චතුරාස්‍රාකාර මහල් මඟින් මෙම ථූප විශේෂය ගොඩනැගේ.

**අෂ්ටාශ්‍රා කාර** – අටපට්ටම් හැඩයේ ස්තූප විශේෂයකි. ශ්‍රී ලංකාවේ මේ ආකාරයේ ථූප පිළිබඳව පැහැදිලි සාධක නැතත් සිදු කර ඇති පර්යේෂණ අනුව අනුරාධපුර ප්‍රාචීනපබ්බත විහාරයේ මේ හැඩයේ ස්තූප නටබුන් සොයාගෙන ඇතැයි සැලැකේ.

**සිලිණ්ඩරාකාර** – සුලභ ලෙසින් දක්නට නොමැති හැඩයකි. දඹදිව කුසිනාරා නුවර පරිනිර්වාණ ස්තූපය මෙයට නිදසුනකි.

දීපා පෙරේරා

---

බුදුසරණ

## පාලි පාඩම

37 – කොටස

සැකසුම
කොටනෙලුවේ
පුඤ්ඤානන්ද හිමි



### කාකො – කපුටා

#### වචන මාලාව

1.අණ්ඩ – බිත්තරය 2.උඩ්ඩෙන්ති – පියාසර කරයි 3.ආකාස – අහස 4.පක්ඛා – පියාපත් 5.ආගමනත්ථාය – ඒම පිණිස 6.තුණ්ඩකං – හොටය 7.නිලීයිත්වා – සැඟවී 8.පක්ක – පැසුණු, ඉදුණු 9.දින්නානි – දෙන ලද 10. විජායිත්වා – වද 11.රුක්ඛග්ගෙසු – ගස් මුදුන 12.වස්සති – හඬලයි, නාද කරයි 13. කුලාවක – කූඩුව 14.පරියෙසිත්වා – සොයා 15.වුද්ධිං පත්තෙසු – වැඩිවියට පැමිණි කල්හි

#### කාකො – කපුටා

කාකා කාළවණ්ණා – තෙ ආකාසෙ උඩ්ඩෙන්ති
කාකස්ස ද්වෙ පාද, ද්වෙ පක්ඛා, එකං තුණ්ඩකං ච අත්ථි
තෙ කදාචි රුක්ඛෙසු නිලීයිත්වා තෙසං පක්කානි ඵලානි ඛාදන්ති
එකදා මනුස්සෙහි දින්නානි ඔදනාදීනි භුඤ්ජන්ති
තෙ රුක්ඛග්ගෙසු කුලාවකෙ කරොන්ති. තෙ අණ්ඩානි විජායිත්වා රක්ඛන්ති
අණ්ඩෙහි පොතකා නික්ඛමන්ති. පඨමං තෙ පොතකානං ආහාරං පරියෙසිත්වා ආහරිත්වා දෙන්ති
තෙ වුද්ධිං පත්තෙසු අත්තනා'ව ආහාරං පරියෙසනත්ථාය පෙසෙන්ති
එකෙන කාකෙන ආහාරෙ දිට්ඨෙ අත්තනො ඤාතකානං අඤ්ඤෙසම්පි ආගමනත්ථාය කා කා ති වස්සති

මෙම පාඩම මෙම සතියේ සිකුරාදා සහ ඉරිදා රාත්‍රී 8.45ට බෞද්ධයා රූපවාහිනියෙන් ද (The BuddhistTV) සඳුදා සවස 3.30ට බෞද්ධයා ගුවන් විදුලියෙන් ද විකාශනය වේ. ඔබට පසුගිය වැඩසටහන් සියල්ල අන්තර් ජාලයෙන් ද නැරඹිය හැකි ය. ඒ සඳහා පිවිසෙන්න. Magadhi (මාගධී) හෝ Kotaneluwe thero (කොටනෙලුවේ හිමි) යනුවෙන් සොයන්න.



තිස් වසරක යුද්ධය මැද
## නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව

10 කොටස

# බොරු අන්ධයා අසුවෙයි



**නාගදීපයේදී පැවිදි වූ නවදගල පදුමකිත්ති හිමියෝ විහාරස්ථානයේ දී දිනපතාම විහාරාධිපති නා හිමියන්ගෙන් දඬුවම් වින්දහ. එහෙත් උන් වහන්සේගේ දඟකාරකම් අඩු වූයේ නැත. විහාරස්ථානයේ ඇතැම් නීති රීති ඉතා තදබල ඒවායැයි උන් වහන්සේට සිතුණි.**

නායක හාමුදුරුවන්ගේ නියෝගය මත සියලුම ස්වාමීන් වහන්සේ අලුයම 4ට අවදි විය යුතුය. අලුයම 4න් පසු සැතපී සිටියහොත් කන් දෙකට වතුර වත් කරන්නැයි නායක හිමියන් විහාරයේ නැවතී සිටි ගෝලබාලයන්ට අණ දී තිබුණි. අලුයම අවදි වීමෙන් පසුව මුහුණ කට සෝදා පිරිසිදු වී පොත්පාඩම් කිරීම ආරම්භ කළ යුතු ය. සියලුම භික්ෂූන් වහන්සේ පිළිවෙළින් අසුන් ගෙන බණ පොත් ශබ්ද නඟා කියවිය යුතු වේ. ඒ විහාරස්ථානයේ ප්‍රධාන ආවාසයේ සාලයේ දැල්වෙන චිමිනි ලාම්පුව අසලය. නා හිමියෝද අඩ අඳුරේ එළි මහනේ සිට ඒ බණ පොත් කියවීම අසා සිටිති.

එළිය වැටුණු පසු විහාරස්ථානයේ මිදුල ඇමදීම් කළ යුතුය. ඒ සඳහා හෙක්ටර් ඇතුළු විහාරස්ථානයේ ආවතේව කරන සෙසු පිරිස ද එක් වේ. මිදුල ඇමදීම් කරද්දී කිසිවකු හා කතා නොකළ යුතුය. එකිනෙකාගේ මුහුණ බැලීම පවා තහනම්ය. හිස පහතට යොමා ගෙන ඉතා සංවරව රටාවකින් යුක්තව ඇමදීම් කළ යුතු ය. පදුමකිත්ති හිමියන්ට අලුයම අවදිවීම නම් තරමක කරදරයක් විය. කනට වතුර හැලුණු වාර ද විය. විහාරස්ථානයේ සිටි ආවතේවකරුවන්ටද එය අකුරටම ක්‍රියාත්මක කිරීමට සිදුවුණේ නායක හිමියන්ද ඒ ගැන සොයා බැලූ නිසා ය.

දිනක් උදෑසන මිදුල අමදින අවස්ථාවේදී පදුමකිත්ති හිමියන් අසලින්ම ඉදලක් අතුගෑවෙනු දැක හොරහින් බලා ඔහු හෙක්ටර් බව හඳුනා ගන්නා ලදී.

“මොකක්ද මේ කරදරේ, අදවත් මොකක් හරි ඇගට දැනෙන දෙයක් කරමුකො“ පදුමකිත්ති හිමියෝ හෙක්ටර්ට හෙමිහිට මිමිණූහ.

“අපි යමු ද මුහුදෙ නාන්න“ ඒ හෙක්ටර් ය.

“නාන්න යන්නෙ දානෙට ඉස්සරවෙලා ද ? නායක හාමුදුරුවො සැතපුණාට පස්සෙ ද?

එයට පිළිතුරු ලැබීමට පෙර පදුමකිත්ති හිමිගේ පිට හරහා හොඳ ඉදල් පහරක් වැදුණි. එයින් පදුමකිත්ති හිමියෝ කැරකැවී ගියහ. හෙක්ටර් පෙනෙන මානයකවත් නැත. නායක හාමුදුරුවෝ ඉදලකින් පහරදී ඉදල අතේ ඇතිව සිටියහ. ඊළඟ ඉදල් පහර දෙනු පිණිස නායක හාමුදුරුවෝ ඉදල එසවූහ. පදුමකිත්ති හිමිට මහා තරහක් ඇති වුණි.

“ආයෙත් ගැහුවොත් බලාගෙනයි“ අත තිබූ ඉදල නායක හිමි දෙසට විසි කළ පදුමකිත්ති හිමියෝ නා හිමියන් දෙස කෝපයෙන් බලා පැන දුවන්නට වූහ.

“අල්ලපල්ල ඕකා.....“ නායක හිමියෝ කෑ ගැසූහ. ඒ සමඟම විහාරස්ථානයෙ සිටි හෙක්ටර් ඇතුළු පිරිස දිව ආහ. පදුමකිත්ති හිමියන්ද දිවිල්ල නතර කර නායක හිමියන් සිටි දෙසට වැඩම කෙළේ ඉදල් පහර කිහිපයක් බලාපොරොත්තුවෙනි.

ඉදලෙන් පාදයට වැරෙන් ගැසූ නා හිමියෝ ඉදල විසි කර දැමූහ. පදුමකිත්ති හිමියන්ට ඒ ඉදල් පාරට දණ ගැස්වුණි. කිසිවක් කතා නොකළ නාහිමියෝ වේගයෙන් ආවාසය දෙසට වැඩම කළහ.

ඒ නායක හිමියන් පදුමකිත්ති හිමියන්ට පහර දුන් අවසන් දිනයයි. එහෙත් පදුමකිත්ති හිමියන් නා හිමියන් සමඟ උරණ වූයේවත් නාහිමියන් පදුමකිත්ති හිමියන් සමඟ උරණ වූයේවත් නැත. සිදුවීම එතැනින් අවසන් විය.

පදුමකිත්ති හිමියන් දහම් පතපොත පිළිබඳ උගත්තේ ඇල්පිටියල පිටිගල ඉඳිපල්ගොඩ විහාරාධිපති නාගදීප නාහිමිගේ සොහොයුරු පාරුතොට ධම්මාරාම හිමියන්ගෙනි.

ධම්මාරාම හිමියෝ කිසිවිටෙක අත්වැරැදිවලට තරහ ගත්තේ නැත. වීදුරුවක් පිඟානක් බිඳුණ ද, උන් වහන්සේ ඒ ගැන තරහ ගත්තේ නැත. එහෙත් දැන දැන කරන වැරැදිවලට නම් උන් වහන්සේ දඬුවම් කළහ. සතෙකුට පවා උන් වහන්සේ ඇඩි සේ කරුණාව දැක්වූහ.

නාගදීපයේ මෙන්ම ඉඳිපල්ගොඩ විහාරයේදී ද අලුයම විහාරස්ථානය ඇමදීම කළ යුතුව තිබුණි. ඒ සඳහා ධම්මාරාම නාහිමියෝද සහභාගි වූහ.

විහාරස්ථානයේ ඇමදීම් අවසන් වූ පසුව ආවාස ගෙය ද ඇමදිය යුතු වේ. එහිදී පදුමකිත්ති හිමියන්ට තිබුණු ලොකුම වධය වූයේ පඩික්කම් අස් කිරීමයි. ධම්මාරාම හිමි බැහැ දකින්නට වැඩම කරන නා හිමිවරුන් පඩික්කම් පුරවති. ඒවා ඉවත් කර පඩික්කම් සෝදා උදෑසන දානය ගන්නට ගිය විට දානය පිළිකුල් වන තරමට එපා වීමක් ඇති වේ. කෙසේ හෝ උදෑසන දානය වළඳන්නට වන්නේ පෙරවරු 9.00ද පසුවීමෙනි.

> ඒ නායක හිමියන් පදුමකිත්ති හිමියන්ට පහර දුන් අවසන් දිනයයි. එහෙත් පදුමකිත්ති හිමියන් නා හිමියන් සමඟ උරණ වූයේවත් නාහිමියන් පදුමකිත්ති හිමියන් සමඟ උරණ වූයේවත් නැත.

ඉන් පසුව බණ පොත් කියවන්නට සිදු වේ. කෙසේ වුවත් ලැබෙන හොඳම වෙලාවත් සෙල්ලමටම යොදවන්නට පදුමකිත්ති හිමියෝ කටයුතු කළහ.

විහාරස්ථානය අසලම පිහිටි නිවසේ සිටියේ විදුහල්පති යුවළකි. ඔවුන්ගේ එකම පුතා තිලක්ය. තිලක් හා පදුමකිත්ති හිමියන් මිතුරුවීමට වැඩිකලක් ගත වූයේ නැත. එහෙත් ගිහියන් සමඟ ඇසුරට නාහිමියන් එතරම් කැමැත්තක් දැක්වූයේ නැත.

“ගිහි – පැවිදි වෙනස තේරුම් ගන්න ඕන. ඕනවට වඩා ගිහියොත් එක්ක හජනෙ හොඳ නෑ. නා හිමියෝ එම වදන් පෙළ පවසනවා හැරෙන්නනට වෙනත් බැණ වැදීම් කෙළේ නැත.

එහෙත් පදුමකිත්ති හිමියෝ තිලක්ගේ නිවෙස පිහිටි පන්සල් මායිමට ගොස් එදෙස බලා සිටි විට තිලක් පදුමකිත්ති හිමියන්ට නිවසට කතා කරයි. තිලක්ගේ මවද පදුමකිත්ති හිමියන්ට ඇඩි සෙනෙහසක් දැක්වූවා ය. පොඩි හාමුදුරුවන්ට රසවත් ගිලන්පස ලබා දුන්නා ය. ඒ අවස්ථාවේදී තිලක් තේ බොන විට මව ලබා දෙන රසකැවිලි පදුමකිත්ති හිමියන්ට ලබා දෙන්නට තිලක් කටයුතු කෙළේ ය. ක්‍රමයෙන් හවස්වරුවේ තිලක්ගේ නිවසට ගොස් ගිලන්පස වළඳ, රසකැවිලි ආහාරයට ගැනීම සාමාන්‍ය දෙයක් බවට පත් විය. තිලක් සිටියත් නැතත් විදුහල්පතිනිය වන තිලක්ගේ මව පදුමකිත්ති හිමියන්ට සංග්‍රහ කළා ය. තිලක්ගේ පියා ද ඒ ගැන විශේෂයක් දුටුවේ නැත.

**(මතු සම්බන්ධයි)**

**තාරක වික්‍රමසේකර**

## සිරි සදහම් පැන විසඳුම්



**සතර පෝදාට ම පිදෙන බුදුසරණ පුවත්පතෙහි පළවන දහම් ලිපියකින් සැකසෙන ප්‍රශ්නයට නිවැරැදි පිළිතුරු ලියා එවා ගුණසේන සහ සමාගමෙන් පිරුවානා පොත් වහන්සේ නම් යුත් "මහ පිරිත් පොත් වහන්සේ" හිමිකර ගන්න.**

**සතිපතා ජයග්‍රාහකයින් පස්දෙනෙකුට ත්‍යාග තිළිණ කෙරේ.**

බුදුසරණ

සතියේ ප්‍රශ්නය - 26

*භික්ෂූන් වහන්සේ සෙනසුන් පනවන අතර අග තනතුරු ලැබුවේ කවුද ?*

පිළිතුර : ......................................................

නම : ......................................................

නිවසේ ලිපිනය : ......................................................

......................................................

දුරකතන අංකය : ......................................................

**ඔබේ පිළිතුර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.**

ඇම්. ඩී. ගුණසේන – බුදුසරණ සිරි සදහම් පැන විසඳුම්, බුදුසරණ පුවත්පත, ලේක්හවුස්, කොළඹ 10

# ගල්කිස්ස ශ්‍රී සුගත ධර්මායතනයේ දී බෝධි පූජා පින්කමක්


අරුත නොදැන පන්සිල් පද මිමිණුව ද
සිරිත නොදැන තිති පන්සල් පා නැගුව ද
සසර නොදැන මිනිසත් බව ලැබුවෙන් ද
චේතනාව සුබ නැතිනම් කිම වේ ද



විහාරාධිපති
**මොරකැටිආරේ සුමණානන්ද හිමි**

චේතනාව අපට නොපෙනුණද, ස්පර්ශ කළ නොහැකි වුව ද, ඉදිරි සංසාරයේ ආත්ම භවයන් සහ ජීවන ගමනේ විවිධ පැතිකඩයන් තීරණය කරයි. අප සෑම සිදුකරන විවිධාකාර ක්‍රියාවලදී, ක්‍රියාවට වඩා බලවත් වන්නේ චේතනාව ය. එනම් ක්‍රියාවල වර්තමාන ස්වරූපය සහ ප්‍රතිඵල එම කාලය තුළ අත්විඳිය හැකි නමුදු චේතනාවන්වල ප්‍රතිඵල ජීවන ගමනේ විවිධ සන්ධිස්ථානවල දී සහ ආත්මභාවයන් තුළ දී විවිධාකාරයෙන් මුණ ගැසෙනු ඇත. අප ගොඩනගා ගත යුත්තේ යහපත් ප්‍රතික්‍රියාවන් විඳින්නට හැකි අයුරේ චේතනාවන් ය. බුදු දහම තුළින් සිත පාලනය කරගෙන, යහපත් වූ චේතනාවන් තුළින් ජීවිතය සාර්ථක හා ප්‍රිය උපදවන ලෙස ගෙවීමට මඟ පෙන්වයි.

අප විහාරස්ථානය වන ගල්කිස්ස ටෙම්පල් පාර, ශ්‍රී සුගත ධර්මායතනයෙහි වැඩ වසන්නේ උතුම් වූ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ අනුශාඛාවක් වන බෝධිරාජයාණන් වහන්සේ නමකි. නිතිපතා වයස් භේදයකින් තොරව කුසල් වැඩීමට, ධර්මය මෙනෙහි කිරීමට විහාරස්ථානය වෙත ළඟාවන බැතිමතුන් කෙරෙහි උපන් ශ්‍රද්ධාවෙන් මෙන් ම, ඔවුන්ට ශ්‍රද්ධාව උපදවාගෙන පිරිසුදු සිතින්, පිරිසුදු පිළිවෙතින් ධර්මය මෙනෙහි කිරීම සඳහා බෝ මළුව ගල් අතුරා පිළිසකර කර විවෘත කිරීමට යෝජිතව ඇත. මේ මස 18 වන සෙනසුරාදා දින ප.ව. 6.30ට විහාරස්ථාන දායක සභාවේ සහයෝගීත්වයෙන් හුදී පහන් සංවේගය පිණිස සිදුකරන්නා වූ මෙම පුණ්‍ය කටයුත්ත වෙනුවෙන් සිතුවිල්ලකින් පවා කුසල් උපදවාගෙන, ධර්මය මෙනෙහි කරගැනීම සඳහා ආරාධනා කර සිටිමි. තව ද එදිනට ආශිර්වාද බෝධි පූජා පින්කමක් ද පැවැත්වෙන අතර, බුදුරජාණන් වහන්සේට බුද්ධත්වය ලැබීමට සෙවණක් වූ බෝධිරාජයාණන් වහන්සේ ට ආමිස පූජාවෙන් මෙන්ම ප්‍රතිපත්ති පූජාවෙන් කළ ගුණ සැලකීමට ආරාධනා කර සිටිමි.



බුදුසරණ



# යාපහුවේ අසිරිය



කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් යාපහුව පිහිටි ඉතා විශාල වූ පර්වතයකි. මෙය ඉතා අලංකාර නිසා පුරාණ කාලයේ දී භාවිත කරන ලද නාමය වූයේ සුන්දරගිරි පබ්බත යන්නයි. සුභ පබ්බත, යහපව්, සුභචල, සුභගිරි හා යාපහුව ආදී නම්වලින් ද පුරාණ කාලයේ හඳුන්වා ඇත.



සීගිරිය ගොඩනැගූ පරිද්දෙන් දඹදෙණිය, යාපහුව හා කුරුණෑගල රාජධානි ගොඩනගන ලද්දේ කඳු පර්වත පසුබිම් කරගෙන ය. ආරක්ෂක සංවිධාන පිණිස මෙසේ කරන ලද බවට සැකයක් නැත. සීගිරියේ නටබුන් සමඟ සසඳා බැලීමේ දී මෙම කඳු මුදුන්වල දක්නට ලැබෙන පැරණි පුරාවිද්‍යා අවශේෂ ඉතා වැදගත් ය. දඹදෙණි රාජධානියට අයත් දඹදෙණි නගරයේ ආරක්ෂා සංවිධාන වල සලකුණු පර්වතය පාමුල දක්නට නොමැත. එහෙත් ශක්තියෙන් හා නිර්මාණයෙන් සීගිරියේ බලකොටුවට බෙහෙවින් ළංවන බලකොටුවක නටබුන් යාපහුවේ දකුණු හා ගිනිකොණ පැතිවල දක්නට ලැබේ. සාමාන්‍යයෙන් අඩ කවයක සැලැස්මක් අනුව නිර්මාණය කර තිබෙන මෙම යාපහුව බලකොටුව දෙකෙළවරෙහි පර්වත බෑවුමේ පහළ කොටසට යාකර තිබේ. පිටත පවුරුවලින් වටවී තිබෙන ප්‍රදේශයේ විශ්කම්භය යාර 450 ක් පමණ ද, ඇතුළත ගල් පුවරුවලින් වටවී තිබෙන ප්‍රදේශයේ විෂ්කම්භය යාර 200 පමණ ද වේ. මෙහි සාදා තිබෙන පිට පවුර මැටියෙන් තනා තිබේ. අඩි 20 පමණ උස ඇති මෙහි දිග සැතපුම් භාගයකටත් වඩා වැඩි ය.

කපන ලද කලුගල් පුවරුවලින් තැනූ අත්තිවාරමක් මත ගඩොල් ඇතුරුමකි. දෙරටු තුනකින් යුක්ත යාපහුව පවුර වටා පුළුල් දිය අගලක් ද, එයින් එගොඩ මෙගොඩ වීම සඳහා දෙරටු තුන සම්බන්ධ කර පාලම් තුනක් ද සාදා තිබුණි. අඩ කවාකාර පවුරේ දකුණු පැත්තේ මැද පිහිටි ප්‍රධාන දෙරටුවට නැගීම සඳහා පිය ගැට දහ අටකින් යුත් කදිම සෝපානයකුත් , ඉන් බසිනු සඳහා පිය ගැටවලින් යුත් තවත් සෝපානයක් විය. යාපහුවේ තිබෙන ඉතා සිත්කලු පුරාණ නටබුන් ගොඩනැගිල්ල නම් පර්වත පාමුල නැගෙනහිර පැත්තේ මළුවක පිහිටි රජ මාළිගාව යැයි අනුමාන කරන මැදුරකට ඇතුළුවන තැන පිහිටි ද්වාර මණ්ඩපය හා එයට නැගීමට ඇති සෝපාන පථයයි. (ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය – 2 මහාචාර්ය එච්.ටී. බස්නායක පි. 177-178 බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය -2002)

මෙම ස්ථානය සුභ නමැති සෙනෙවියෙකු විසින් ක්‍රි.ව. 1235 දී සකස් කරගෙන වාසය කළ නිසා 'සුභ පබ්බත' යන නාමය භාවිත කර තිබේ. ඊට අමතර ව යාපහුව යන නාමය ද මේ සඳහා භාවිත වේ. යාපහුව රාජධානිය කරගෙන රජ වූ එකම රජතුමා වූයේ පළමුවෙනි බුවනෙකබාහු රජතුමා ය. එතුමා ක්‍රි.ව. 1273 සිට 1284 තෙක් වසර එකොළහක් මෙහි රජ කළහ. සාමාන්‍යයෙන් රජ මාළිගය අසල ම දළදා මාළිගය ද පිහිටා තිබීම පුරාණ ලංකා රාජධානි පිළිබඳ විමසා බලන විට පෙනී යන ලක්ෂණයකි.

ඒ අනුව යාපහුව රාජධානියෙන් දළදා මාළිගයට යෑම සඳහා ඉතා අලංකාර පඩි පෙළක් ද දක්නට ලැබේ. මෙම පඩි පෙළෙන් ඉහළට ගමන් කළ පසු පුරාණ කාලයට අයත් ගොඩනැගිලි නටබුන් දක්නට ලැබේ. එම නටබුන් අතරේ ශිලාමය පුවරුවල (අල්ප උන්නත මදක් මතුවන ලෙසින්) පෙරහරක දර්ශනයක් දිස්වේ. යාපහුවේ රජ මාළිගාවේ ද්වාර මණ්ඩපය යනුවෙන් හඳුන්වනු ලබන මෙම ඉදිකිරීමෙහි දක්නට ලැබෙන ශිලා රූකටි ඉතා අලංකාර ය. මෙහි නිරූපිත රඟන, වයන ශිල්පීන්ගෙන් යුත් රූප පේළියෙහි විවිධ අංග චලනයෙන් නර්තනයේ යෙදෙන අන්දම මනස්කාන්ත ය.

> මෙම ශිලා කලා කෘතිය ගලට ඉතා පහසුවෙන් පරිවර්තනය කරන ලද දැව කර්මාන්තකරුවන්ගේ ඉතා දක්ෂ ශිලා නිර්මාණයක් බව ඉතා පැහැදිලිය. මෙම ජනේලයට උඩින් සාදා තිබූ මකර තොරණ ද ලෙස සරසා ඇත.

මෙහි රඟන්නන් හා වයන්නන් නිර්මාණය කර ඇති මූර්ති යාපහුවේ දළදා මාළිගය යැයි සැලකෙන ගොඩනැගිල්ලේ ද්වාර මණ්ඩපය වටා දැක්වේ. පුරාණ අපේ මූර්ති ශිල්පීන් විසින් මෙසේ කළුගලෙහි නිර්මාණය කර තිබීම ඔවුන් ගේ දක්ෂතාවය හෙළි කරන්නකි.

*(ශ්‍රී ලංකාවේ පුරාණ උරුමය -2 සිරිසමන් විජේතුංග පි. 282-283 -2012)*

මෙහිදී මූර්තිමය වශයෙන් වඩාත් වැදගත් වන තවත් ගලින් නිම කරන ලද ග්‍රිල් රටාවකින් යුත් ජනෙල් දෙකක් යාපහුවෙන් ලැබී ඇත. දැනට මේවා යාපහුවේ පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි ඇත. එක ජනේලයක් මැනවින් සුරක්ෂිත ව ඇත. හොඳින් ආරක්ෂිත වී ඇති ජනේලයේ දිග අඩි 4 අඟල් 8 කි. පළල අඩි 2 අඟල් 11 කි. මෙහි ග්‍රිල් කොටසේ මැද කුඩා රවුම් 45 වේ. මේ කුඩා රවුම් තුළ එක බැගින් ඉතා කුඩා සිංහ, හංස, ගජසිංහ වාමන හා රඟන ස්ත්‍රී රූප ආදියෙන් සරසා ඇත. මෙවැනි රවුම් 45 ඉතා සූක්ෂම ලෙස සම්බන්ධ කොට තිබේ. මෙම ශිලා කලා කෘතිය ගලට ඉතා පහසුවෙන් පරිවර්තනය කරන ලද දැව කර්මාන්ත කරුවන්ගේ ඉතා දක්ෂ ශිලා නිර්මාණයක් බව ඉතා පැහැදිලිය. මෙම ජනේලයට උඩින් සාදා තිබූ මකර තොරණ ද අධික ලෙස සරසා ඇත. මකර තොරණ යට "ගජලක්ෂ්මී' රූපයක් නිමවා තිබේ. ගජලක්ෂ්මී එක් අතකින් නෙළුම් මලක් දරාගෙන බද්ධ පරියංක ලෙසින් ඉඳගෙන සිටී. ගජලක්ෂ්මී රූපයෙහි දෙපසින් ඇත් රූප කලසකින් ඇගේ හිසට ජලය වත්කරන ආකාරයට නිමවා ඇත. මෙම මූර්ති නිර්මාණයෙන් අපට දිස්වන්නේ පොළොන්නරු යුගයේ විසූ දක්ෂ මූර්ති ශිල්පීන් යාපහුව කාලයේදී ද සිටි බව ය.

*(මූර්ති කලාව – සංස්කාරක ආචාර්ය නන්දදේව විජේසේකර – පි. 116-117 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව -1990 )*

## පුරාණ චීන සබඳතා

යාපහුව, චීනය හා ඉතා පැරණි යුගයේ සබඳතා තිබුණු බවට පුරාවිද්‍යා සාක්ෂි හමුවී ඇත. යාපහුවේ දකුණ දෙරටුවේ චීන කාසි තොගයක් 1911 වර්ෂයේ දී හමුවිය. එම පැරණි චීන කාසි චීනයේ ක්‍රි.ව. 976-1225 කාලයේ රජකළ චීන අධිරාජයාට අයත් වේ. නැගෙනහිර දෙරටුව අසල වර්තමාන විහාරයේ ඉදිරිපස නිදන්ව පැවති තවත් පැරණි චීන කාසි 1352 ක් හමු වී ඇත. පිඟන් මැටියෙන් සාදන ලද කුසලාන තුනක් ද එහි තිබී හමුවී ඇත. චීන පිඟන් මැටි කර්මාන්තයෙහි ඉතා අගනා නිදසුන් වන මේ කුසලාන ඉතා වැදගත් ය. සීගිරියෙහි මෙන් ම යාපහුවෙහි ද ක්‍රිස්තු පූර්ව සියවස්වලට අයත් මෙන් ම, ක්‍රි.ව.10 වැනි සියවසට අයත් මෙහි ඇති ලෙන්වල ශිලාලේඛන වලින් ඉතා පැරණි යුගයේ සිට මහා සංඝයා වහන්සේලා වැඩ වාසය කළ බවට සාක්ෂි දරයි.

යාපහු යුගයට අයත් යැයි සැලකිය හැකි බුදු පිළිම එතරම් සුලභ නොවේ. දළදා මාළිගය යැයි සැලකෙන ගොඩනැගිල්ලේ මකර තොරණක් යට තිබෙන බුදු පිළිමය මේ යුගයට අයත් පැරණි ම රූපය වශයෙන් සැලකේ. නැගෙනහිර පැත්තේ හමුවන බුදුගෙයක් පිහිටුවා තිබුණු බවට සාක්ෂි හමුවී තිබේ. මේ ලෙන තුළ බුදු පිළිමයක් තැන්පත් කර ඇත. ඇතුල් නුවර පිහිටි පන්සල මහනුවර යුගයට අයත් ය. ඊට ඊසාන දිග ගල්ලෙනක් තුළ බුදුගෙය වේ. එම ලෙනට යාව එය ඉදිරිපස ඇත්තේ මෑත දී කරවන ලද කුඩා බුදුගෙයකි. ඇතුල් බුදුගෙය පිටුපස බිත්තිට යාව ධ්‍යාන මුද්‍රාවෙන් වැඩහිඳි බුදු පිළිමයකි. බුදුගේ අසලම බෝධිය ද වේ. යාපහුව අගනුවර ව පැවති කාලයේ පැවති පන්සලේ නටබුන් නැගෙනහිර දෙස දක්නට ලැබේ. දළදා මාළිගාව , කුඩා දාගැබ් දෙකක් හා හතරැස් මළුවක ගොඩනැගිල්ලක් මෙහි තිබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් යාපහුවේ පුරාවිද්‍යා කෞතුකාගාරයක් ද නිර්මාණය කර ඇත.



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

වර්ෂ 2020ක් වූ ජූලි 20 සඳුදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.